
# ආත්මයම උදුරාගැනීම

## ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ යුක්ති ක්ෂේත්‍රයන් හි ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනය




Centre for Equality and Justice



# ආත්මයම උදුරාගැනීම

## ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ යුක්ති ක්ෂේත්‍රයන් හි ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනය



© **සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය** (CEJ), **ශ්‍රී ලංකාව**.
**සියලුම හිමිකම් ඇවිරිණි.**

නිර්මාණය සහ පිරිසැලසුම: දනුශ්‍රී වැලිකල

මුද්‍රණය හා ප්‍රකාශනය: ජනවාරි 2023

සහයෝගය: ආසියා පදනම

කතු හිමිකම ඇවිරෙන පරිදි මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ප්‍රතිනිෂ්පාදනය, ගබඩා කිරීම හා විද්‍යුත්, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් ආකාරයකින් බෙදාහැරීම සපුරා තහනම්.

වැඩි විස්තර සඳහා:
**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**
16/1, මොරිස් පෙදෙස, කොළඹ 5, ශ්‍රී ලංකාව
දු.ක./ෆැක්ස්: +94 11 2055404
විද්‍යුත් තැපෑල: srilanka.cej@gmail.com

ISBN 9786245847198

# පෙරවදන

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් 2015 වර්ෂයේ සිට, කාන්තාවන් හට අසමාන ලෙස බලපාන දූෂණ ක්‍රමයක් වන, ලිංගික අල්ලස වටා ඇති දැනුම් පරතරය පියවාලීම සඳහා පර්යේෂණ සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සහ අධිකරණ ක්ෂේත්‍රවල ලිංගික අල්ලස් ව්‍යාප්තිය පිළිබඳව CEJ සංවිධානය විසින් 2021/22 වසර තුළ ගුණාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන් විසින් ඉටු කෙරෙන ඉතා වැදගත් කාර්යභාරය කොවිඩ්-19 වසංගතය සහ රටේ ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් පසුව වඩාත් තීරණාත්මක විය.

මෙම අධ්‍යයනයෙන් තහවුරු වන්නේ ලිංගික අල්ලස අත්විඳීමට සිදුවූ කාන්තාවන් හට එහි බලපෑම බරපතල වන බව සහ එය සමරිසි පුරුෂ, සමරිසි කාන්තා, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාව සඳහා තවත් සංකීර්ණ වන බවත් ය. ලිංගික ශ්‍රමිකයින් ද ලිංගික අල්ලස් වලට ගොදුරු වන බව මෙම අධ්‍යයනයෙන් හෙළි වී තිබේ. වින්දිතයින්/දිවි ගලවා ගත් තැනැත්තන්ගේ අත්දැකීම් තුලින් හෙළි වන්නේ ලිංගික අල්ලසෙහි බලපෑම් ඉතා කම්පන සහගත සහ සමාජ අපකීර්තිය ඇති කරවන බවත් ආර්ථික හා සමාජීය ප්‍රතිවිපාක ඇතුළු අනෙකුත් සෘණාත්මක ප්‍රතිවිපාක ද ඇති බවත්ය.

CEJ සංවිධානය සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දිනේෂා සමරරත්න විසිනි. CEJ සංවිධානය සමඟ පර්යේෂණ ක්‍රමවේදය සැලසුම් කර වාර්තාව සම්පාදනය කිරීම පිළිබඳව ආචාර්ය සමරරත්නට CEJ සංවිධානයේ කෘතඥතාවය පළකර සිටීමට කැමතියි. තවද, CEJ සංවිධානය සමඟ ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂකයන්ට සහභාගී වූ සියලු දෙනාට CEJ සංවිධානය ස්තූතිය පළකර සිටිනවා.

පර්යේෂණය සඳහා අපට සහාය වූ බොහෝ උපදේශකයින්ට සහ සම්පත් පුද්ගලයන්ට CEJ සංවිධානය විසින් සිය කෘතඥතාව පළ කිරීමට කැමතියි. මෙම ප්‍රකාශනය අධ්‍යයන ප්‍රජාවට, සිවිල් සමාජ සංවිධානවලට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ලිංගික අල්ලස් පිළිබඳ නීති සහ ප්‍රතිපත්තිවල ප්‍රතිසංස්කරණ ගෙන ඒමට උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

**ශ්‍යාමලා ගෝමස්**
විධායක අධ්‍යක්ෂිකා
සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය

# පටුන


**කෙටි යෙදුම්** **8**

**වාර්තාවේ සාරාංශය** **9**

**1. හැඳින්වීම** **12**

1.1. අධ්‍යයනයේ අරමුණු 12
1.2. ශ්‍රී ලංකා රාජ්‍යය 13
1.3. පොදුවේ ගත් කළ අල්ලස හා දූෂණය 13
1.4. කාන්තාවන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවගේ තත්ත්වය 13

**2. නීතිමය රාමුව** **16**

2.1. ජාත්‍යන්තර නීතිය 16
2.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මූලික අයිතිවාසිකම් 17
2.3. අල්ලස් පනත සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා (CIABOC) පනත 18
2.4. යුක්තිය සහ නීති සාක්ෂරතාවය සඳහා ප්‍රවේශය 19

**3. ලිංගික අල්ලස් පිළිබඳ CEJ හි උද්දේශනය** **22**

3.1. ක්‍රියා පටිපාටිය 22
3.2. ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් පිළිබඳ දැනට පවතින දැනුම 22
3.3. වත්මන් දැනුමෙහි පවතින පරතරයන් 23

**4. දත්ත එක් රැස් කිරීමේ ක්‍රමවේදය** **25**

4.1. ගුණාත්මක අධ්‍යයනයක් සඳහා තාර්කිකත්වය 25
4.2. ක්‍රමවේදය 25
4.3. අධ්‍යයන සැලැස්ම 25
4.4. සීමාවන් 26
4.5. අධ්‍යයනය ක්‍රියාවට නැංවීම 26

**5. ලිංගික අල්ලස සිදුවීම / ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන ප්‍රතිඵල** **29**

5.1. පුද්ගලික බලපෑම 29
5.2. පවුල සහ ප්‍රජාව කෙරෙහි බලපෑම 37
5.3. අවිධිමත් සභාය 39
5.4. සමාජයීය හා සංස්කෘතික සාධක 40
5.5. ලිංගික අල්ලස් පිළිබඳ දිවි ගලවාගත් තැනැත්තන්ගේ අදහස් 41
5.6. ලිංගික අල්ලස් පිළිබඳ අපරාධකරුගේ අදහස් (දිවි ගලවාගත් පුද්ගලයා විසින් වාර්තා කරන ලද පරිදි). 43
5.7. කැමැත්ත පිළිබඳ අදහස් 46

5.8. යුක්තිය සඳහා ප්‍රවේශය 47
5.9. ඵලදායී පිළියම් ලබා ගැනීමේ හැකියාව 48
5.10. සන්නිවේදන තාක්ෂණය අනිසි ලෙස භාවිතා කිරීම 51
5.11. වසංගතයේ බලපෑම 53
5.12. වෙනත් අවබෝධයන් 54
5.13. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලින් ලබා ගත් වැඩිදුර අවබෝධයන් 54
5.14. ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගත් අවබෝධයන් 58

**6. රාජ්‍ය වගකීමක් ලෙස ලිංගික අල්ලස වැළැක්වීම 63**

6.1. ලිංගික අල්ලස මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස 63
6.2. ලිංගික අල්ලස අපරාධ වරදක් ලෙස 63
6.3. ලිංගික අල්ලස දූෂණයෙහි ආකාරයක් ලෙස 64

**7. නිගමනය 66**

**8. ලිංගික අල්ලසෙහි පැතිරීම පිළිබඳ නිර්දේශ 68**

8.1. වැළැක්වීම 68
8.2. විමර්ශනය සහ නඩු පැවරීම 70
8.3. පිළියම් 72

**ඇමුණුම් 73**

I: අධ්‍යයනය සඳහා භාවිතා කරන ලද ප්‍රශ්නාවලිය 73
II: අධ්‍යයනය සඳහා ප්‍රවේශ වූ ආයතන ලැයිස්තුව 77
III: ගුණාත්මක සම්මුඛ සාකච්ඡා පිළිබඳ දළ විශ්ලේෂණය 77

**සමුද්දේශයන් 81**

# කෙටි යෙදුම්

| | |
|---|---|
| **CEJ** | යුක්තිය සහ සමානාත්මතාවය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice) |
| **CIABOC** | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (The Commission to Investigate Allegations of Bribery or Corruption) |
| **FGD** | ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (Focus Group Discussion) |
| **LGBTQI** | සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (Lesbian, Gay, Bi-sexual, Trans, Queer, Intersex) |
| **SGBV** | ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (Sexual and Gender Based Violence) |




**ඔබගේ අයිතිවාසිකම් සඳහා**
**කොන්දේසි පැනවිය නොහැක**

ලිංගික අල්ලස් යනු පිළිගත නොහැකි, දූෂණයේ එක් ආකාරයකි.

**1954**

ලිංගික අල්ලස් සිදුවීම් වාර්තා කරන්න


## වාර්තාවේ සාරාංශය

ලිංගික අල්ලස ශ්‍රී ලංකාව තුළ පැහැදිලිව ම අපරාධයක් ලෙස සලකනු නොලැබේ. අල්ලස පිළිබඳ සාමාන්‍ය අපරාධ නීතිය යටතේ එයට දඬුවම් කළ හැකි නමුත් එලෙස අවසන් කළ නඩු පිළිබඳ උසාවි වාර්තා නොමැත. ජාත්‍යන්තර මෘදු නීතිය මගින් ලිංගික අල්ලස් හෝ ලිංගික කප්පම් යනු මානව හිමිකම් පිළිබඳ බරපතල ගැටලුවක් ලෙසත් දූෂණයේ බරපතල ආකාරයක් ලෙසත් පිළිගෙන ඇත. කාන්තා විනිසුරුවරුන්ගේ ජාත්‍යන්තර සංගමය විසින් ඉදිරිපත් කරන ලද ලිංගික කප්පම් පිළිබඳ නිර්වචනය අද වන විට ජාත්‍යන්තර නීතිඥ සංගමය සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් යන ආයතන දෙකෙන් ම අනුමත කර ඇත. ශ්‍රී ලංකාව තුළ, සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින් සහ කාන්තාවන් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට (SGBV) මුහුණ දීමට වැඩි අවදානමක් ඇති බව දන්නා කරුණක් වන අතර එම නිසා ලිංගික අල්ලස්වලට ලක් වීමේ වැඩි අවදානමක් ද ඔවුන්ට ඇත. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය සඳහා සාමාන්‍යයෙන් හොඳ ප්‍රවේශයක් ඇත. කෙසේ වෙතත්, ඔවුන්ගේ දේශපාලන හා සංස්කෘතික ආන්තිකකරණය හේතුවෙන්, ඔවුන් වෙනස් කොට සැලකීමේ සහ ලිංගික හිංසනයට ගොදුරු වීමේ අවදානමක් පවතී. ශ්‍රී ලංකාව තුළ 'ස්වභාවධර්මයේ පිළිවෙලට එරෙහි' ලිංගික ක්‍රියාවන් සාපරාධීකරණය කිරීම සහ ස්ත්‍රී පුරුෂ විවිධත්වය සහ ලිංගික සුළුතරයන් සඳහා නිශ්චිත ආරක්ෂාවක් නොමැතිකම විසින් සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින් නීති පද්ධතියේ සහ සමාජයේ මුලුගන්වා තැබීමට සමත්ව ඇත.

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් මීට පෙර කරන ලද අධ්‍යයනයන් හරහා යුද්ධයෙන් පීඩාවට පත් පළාත්වල සහ යුද්ධයෙන් පීඩාවට පත් වූ ප්‍රජාවන්හි ලිංගික අල්ලස් සිදුවීම් පරීක්ෂා කර ඇත. එම කලාප සහ කණ්ඩායම්වලින් ඔබ්බට ලිංගික අල්ලසෙහි පැතිරීම පිළිබඳ දැනට පවතින දැනුමෙහි පරතරයක් පවතී. වත්මන් අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ මධ්‍යම, බස්නාහිර, දකුණ සහ සබරගමුව පළාත්වල ලිංගික අල්ලස් සිදුවීම් විමර්ශනය කිරීමෙන් එම පරතරයන් කෙරෙහි ප්‍රතිචාර දක්වා ඇත. මෙම අධ්‍යයනය හරහා සෞඛ්‍ය සහ යුක්ති ක්ෂේත්‍රවල රාජ්‍ය සේවයේ ලිංගික අල්ලස් සිදුවීම පිළිබඳව ගවේශනය කෙරෙන අතර, සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින් සහ කාන්තාවන් මෙම ක්ෂේත්‍රවල සිදුවන ලිංගික අල්ලසෙන් වැඩි බලපෑමකට ලක් වීම මෙයට හේතු විය. මෙය ගුණාත්මක අධ්‍යයනයක් වන අතර, දැනුවත් කැමැත්ත සහ රහස්‍යභාවය ඇතුළු පර්යේෂණ ආචාර ධර්මවලට අනුකූලව මෙය සිදු කරනු ලැබිණි. මෙම අධ්‍යයනය සඳහා පිළිවෙළින් ලිංගික අල්ලස්වලින් දිවි ගලවා ගත් පුද්ගලයන් 19 දෙනෙකු සහ සෞඛ්‍ය හා යුක්ති අංශයේ ප්‍රධාන තොරතුරු සපයන්නන් 12 දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එක් එක් අංශය සඳහා සහභාගී වූ ප්‍රධාන තොරතුරු සපයන්නන් තිදෙනෙකු පිළිවෙලින් ප්‍රාදේශීය සහ ජාතික මට්ටමින් මේ සඳහා සහභාගී විය. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පහක් හරහා ලබා ගත් තොරතුරු ද මෙම අධ්‍යයනයට ඇතුළත් කෙරිණි.

ලිංගික අල්ලසෙහි පුද්ගලික බලපෑම එයට මුහුණ දී ඉන් දිවි ගලවා ගත් පුද්ගලයා මත දැඩි ලෙස ඇති වන බව සොයාගැනීම්වලින් හෙළි වේ. එය ඔවුන්ගේ ශරීරය කෙරෙහි ඔවුන්ට පවතින ස්වාධීනත්වය සහ ස්ව-පාලනය මෙන් ම ඔවුන්ගේ ආර්ථික අයිතිවාසිකම් භුක්ති විඳීම කෙරෙහි ඔවුන්ට අති අයිතීන්ට බාධාවක් ලෙස ක්‍රියා කරයි. දිවි ගලවා ගත් පුද්ගලයන් විසින් අත්විඳින ලද කම්පනය සහ අපකීර්තිය මඟින් ලිංගික අල්ලස විසින් ඇති කරවන මානසික බලපෑමෙහි බරපතල බව පෙන්නුම් කරයි. සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයන් ලිංගික අල්ලස්වලට ලක් වූ විට මෙම සියලු බරපතල ප්‍රතිවිපාකවල සංකීර්ණත්වය තවත් ඉහළ යයි. බොහෝ සහභාගිවන්නන් පැහැදිලිව ම සඳහන් කළේ අධ්‍යයනයට දායක වීමේ අවස්ථාව තමන් ඉතා කැමැත්තෙන් පිළිගන්නා බවයි. බොහෝ දිවි ගලවා ගත් පුද්ගලයන් ලිංගික අල්ලස් පිළිබඳ තම අත්දැකීම් රහසක්ව තබාගෙන සිටියේ එමඟින් ඔවුන් සහ ඔවුන්ගේ සමීපතමයන් අපකීර්තියට පත් විය හැකි ආකාරයන් පිළිබඳ කනස්සල්ලක් සහ සැලකිල්ලක් දැක්වීම හේතුවෙනි. එපමණක් නොව, ලිංගික අල්ලස් වළක්වා ගැනීම සඳහා දිවි ගලවා

ගත් පුද්ගලයන්ට රාජ්‍ය සේවාවන් වෙත ප්‍රවේශය අත්හැරීමට හෝ සීමා කිරීමට සිදු වීම හේතුවෙන් ඉන් එම පුද්ගලයාගේ සමීපත ම පවුලේ සාමාජිකයින්ට ද බලපෑමක් ඇති විය. වට්ස්ඇප් (WhatsApp) වැනි සන්නිවේදන තාක්ෂණය බොහෝ අවස්ථාවල ලිංගික අල්ලස් ඉල්ලීම සහ දිවි ගලවා ගත් පුද්ගලයාට දිගින් දිගට ම හිරිහැර කිරීම අරබයා භාවිතා කරන ලදී. බොහෝ දිවි ගලවා ගත් පුද්ගලයන් ඔවුන්ගේ කම්පනය වටහා ගැනීමට සහ මානසිකව සුවයක් අත් කර ගැනීමට වෘත්තීය උපකාර ලබා නොගනී, එසේත් නැතිනම් ඔවුන්ට බොහෝ විට ඒ සඳහා අවකාශයක්/පහසුකම් නොපවතී. නමුත් සමහර පුද්ගලයන් ඔවුන්ගේ අවිධිමත් ආධාරක පද්ධති හරහා සැනසීමක් ලබාගෙන ඇත. ලිංගික අල්ලස් ලබා දීම සඳහා දැඩි පීඩනයකට ලක් වීම හේතුවෙන් අපරාධකරු විසින් කරන ලද ලිංගික ඉල්ලීමට තමන් එකඟ වූ බව දිවි ගලවා ගත් පුද්ගලයන් කිහිප දෙනෙකු නිරීක්ෂණය කර තිබුණි. තවත් සමහරු සඳහන් කළේ අපරාධකරු ඔවුන්ගේ කැමැත්ත නොපැතූ බවයි. ඔවුන්ට අනුව, අපරාධකරුවන් ඔවුන්ව දුටුවේ හුදෙක් යම් භාණ්ඩයක් ලෙස පමණි, අපරාධකරුවන් විසින් සෙනෙහස පෙන්වීමක් ව්‍යාජ ලෙස හැඟවූ බව හෝ ලිංගික ක්‍රියාවන් සඳහා ගනුදෙනුකාරී ප්‍රවේශයක් ගත් බව වාර්තා විය. දිවි ගලවා ගත් පුද්ගලයන්ට ලිංගික අල්ලස් ගැන දැඩි නිෂේධාත්මක හැඟීම් පැවති අතර ඔවුන්ගේ ජීවිතයට එහි වූ විනාශකාරී බලපෑම ඔවුන් විස්තර කළහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු නීතියෙන් ඔවුන්ට ඵලදායී පිළියමක් ලබා දිය හැකි යැයි සිතුවේ නැත. ඇත්ත වශයෙන් ම, ඔවුන් නීති ආයතන සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් අපරාධකරුවන් ආරක්ෂා කරන බව සිතූ අතර, එය ඔවුන්ට ලිංගික අල්ලස් ගැන පැමිණිලි කිරීම පවා ඉතා අපහසු කරවන්නක් විය. තවද මේ නිසා සමානාත්මතාවයෙන් යුක්තව නීතියේ ආරක්ෂාව ලැබීමට ඔවුන් සතු අයිතිය ද ක්‍රියාකාරී ලෙස උල්ලන්ඝනයට ලක් විය. සමහර අවස්ථාවල දී, COVID-19 වසංගතය ඔවුන් ලිංගික අල්ලස් සඳහා වඩාත් අවදානමට ලක් කරවන්නක් විය. වෙනත් අවස්ථාවල දී, සංචරණ සීමා කිරීම් ඔවුන්ට යම් ආරක්ෂාවක් ලබා දුන්නේ ය. ලිංගික අල්ලස් පිළිබඳ මෙම සොයාගැනීම්වලින් පෙනී යන්නේ මානව හිමිකම් කිහිපයකට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සහ ඒවා උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය සිය වගකීම ඉටු කිරීමට අපොහොසත් වී ඇති බවයි. ලිංගික අල්ලස් සඳහා ත්‍රිමාණ රාමුවක් සහ ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. එය දූෂණයේ ආකාරයක්, මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් සහ අපරාධ යුක්තිය පිළිබඳ ගැටලුවක් ලෙස වටහා ගත යුතු ය. මෙම ගැටලුව විසඳීම සඳහා දිවි ගලවා ගත් පුද්ගලයන් විසින් රාජ්‍යයට කරන ලද නිර්දේශ සඳහා ලිංගික අල්ලස් පැහැදිලිව ම සාපරාධී ලෙස සැලකීමට පියවර ගැනීම, ඵලදායි සහ ස්වාධීන විමර්ශන සහ නඩු පැවරීමේ ක්‍රියාවලීන් සඳහා ඉඩ සැලසීම සහ දිවි ගලවා ගත් අයට වන්දි ලබා දීම ඇතුළත් වේ. ලිංගික අල්ලස් වැළැක්වීම, විමර්ශනය කිරීම සහ ඒවාට පිළියම් යෙදීම සඳහා රාජ්‍යය විසින් දරන උත්සාහයන් අධීක්ෂණය කිරීම සිවිල් සමාජය වෙත කෙරෙන නිර්දේශවලට ඇතුළත් වේ. තවදුරටත් සිදු කරන ලද නිර්දේශ වන්නේ කාන්තා දිවි ගලවා ගත් අය අතර උපකාරක ජාලයක් සහ සහයෝගීතාවයේ ජාලයක් වර්ධනය කිරීමයි. පුද්ගලික අංශයට සහ වෘත්තීය ආයතන වෙත කෙරෙන නිර්දේශවලට ලිංගික අල්ලස් තහනම් කිරීම සහ ඵලදායී පැමිණිලි යාන්ත්‍රණයක් සැපයීම සඳහා සහ ලිංගික අල්ලස් සම්බන්ධයෙන් ශූන්‍ය-ඉවසීමේ ප්‍රතිපත්තියක් (zero-tolerance policy) අනුගමනය කිරීම සඳහා වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයන් සමාලෝචනය කිරීම ඇතුළත් වේ. ව්‍යාපෘති සහ ප්‍රදාන චක්‍රයන් විසින් ලිංගික අල්ලස් පිළිබඳ මූලික යථාර්ථයන්ට ඵලදායි ලෙස ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වෙත නිර්දේශ කෙරේ. දේශීය හිමිකාරිත්වය තහවුරු කරමින් සහ දේශීය සන්දර්භයට අනුවර්තනය වෙමින් ලිංගික අල්ලස් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ගෝලීය සම්මතයන්, මූලධර්ම සහ ප්‍රමිතීන් වර්ධනය කිරීම ජාත්‍යන්තර සංවිධාන වෙත නිර්දේශ කෙරේ.



# 1. හැඳින්වීම

අල්ලස හා දූෂණය ශ්‍රී ලාංකේය සමාජය තුළ බරපතළ ප්‍රශ්නයකි. කෙසේ වෙතත්, එහි සිදුවීම් සහ පැතිරීම පිළිබඳ අධ්‍යයනය තවමත් මුල් අදිය පවතී. එපමණක් නොව, අල්ලස හා දූෂණයේ නීති විරෝධී ස්වභාවය හේතුවෙන් ලිංගික අල්ලස සිදු වීම අධ්‍යයනය කිරීම අභියෝගාත්මක වේ. මෙම අභියෝග පැන නගින්නේ පර්යේෂණ සැලසුම් සහ ආචාර ධර්ම යන දෘෂ්ටිකෝණයෙන් සහ සහභාගිවන්නන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම, තොරතුරු ලබා ගැනීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම යනාදී ලෙස වූ ප්‍රායෝගික මට්ටමින් ය. ගෝලීය මට්ටමින්, ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා නිශ්චිත සහ ඉලක්කගත ප්‍රවේශයක අවශ්‍යතාවය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය වෙමින් පවතී. ලිංගික අල්ලස බහු-ස්ථර සහ බහු-මාන වේ. එය ලිංගික හිංසනය සහ දූෂණය වැනි වෙනත් ආකාරයේ ලිංගික හිංසනයන්ගෙන් වෙනස් වූ ලිංගික ප්‍රචණ්ඩත්ව ආකාරයකි. එය පුද්ගලයෙකු ඉලක්ක කර සිදුකරන අපරාධයක් සහ මානව හිමිකම් කඩකිරීමකි. කෙසේ වෙතත්, මෙම වාර්තාවෙන් සනාථ වන පරිදි, බොහෝ විට පුද්ගලයා මෙම අපරාධය සඳහා ඉලක්ක වී ඇත්තේ එම පුද්ගලයාගේ ලිංගභේදය හෝ පන්ති අනන්‍යතාවය හේතුවෙනි. එපමණක් නොව, ලිංගික අල්ලස බොහෝ විට දූෂණය මුල් බැසගත් සංස්කෘතියක ප්‍රතිඵලයක් සහ ලක්ෂණයකි. ලිංගික අල්ලස පිළිබඳ කටයුතු කිරීමේ දී, දේශීය නීතිය (මූලික අයිතිවාසිකම් සහතික කිරීම්, අපරාධ නීතිය සහ දූෂණයට එරෙහි නීතිය) සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය එක්ව සලකා බැලිය යුතු අතර එම නීති දෙවර්ගයෙහි සම්බන්ධතාවය ද සලකා බැලිය යුතු වේ. ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය විසින් මෙම වරද නිර්වචනය කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ සම්මුතියක් ගොඩනගා ඇති අතර මේ සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම පැහැදිලි කර ඇත. ජාතික මට්ටමින් මහජන නීතිය (ව්‍යවස්ථාපිත නීතිය, පරිපාලන නීතිය සහ අපරාධ නීතිය) විසින් ලිංගික අල්ලස යනු දූෂණයේ ආකාරයක්, මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක්, පරිපාලන යුක්තිය මෙන් ම නිශ්චිත අපරාධ වරදක් ලෙස පිළිගත යුතු ය.

ලිංගික අල්ලස පිළිබඳ අධ්‍යයනයට අදාළව ගත් කළ මෙම අභියෝග වඩාත් සංකීර්ණ වේ. ලිංගික අල්ලසෙහි පැතිරීම පිළිබඳ සාකච්ඡා කෙරෙන්නේ පුද්ගල අත්දැකීම් සහ කතාන්දර භාවිතයෙනි, එනම් උපාඛ්‍යාත හරහා ය. එහි සිදුවීම්, ඒ සඳහා දායකත්වය සපයන සාධක ආදිය පිළිබඳ ක්‍රමානුකූල අධ්‍යයනයන් සැලකිය යුතු මට්ටමකින් නොපවතී. 3 වන කොටසින් සාකච්ඡා කර ඇති පරිදි, සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් මෙම විෂය පිළිබඳව ගවේෂණාත්මක අධ්‍යයන කිහිපයක් සිදු කර ඇත. මෙම අධ්‍යයනයන් විසින් ලිංගික අල්ලස් ගැනීම් සිදුවන බවට වූ මෙවන් උපාඛ්‍යාත සනාථ කරයි.

## 1.1. අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනය සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස පිළිබඳ සිදු කරන ලද සිව්වන ක්‍රමානුකූල අධ්‍යයනයයි. එය කාන්තාවන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාව අතර එය සිදුවීම අධ්‍යයනය කිරීමට සහ ලිංගික අල්ලස් ගැනීම් සඳහා දායක වන සාධක හඳුනා ගැනීම අරබයා සැලසුම් කෙරිණ. මෙම වර්තමාන අධ්‍යයනය හරහා, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට, විද්වතුන්ට, ක්‍රියාකාරීන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඔවුන්ගේ සේවා ක්ෂේත්‍රවල ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා උපයෝගී කර ගත හැකි සාක්ෂි පදනමක් ගොඩනැගීම CEJ අරමුණු කරයි. ප්‍රතිපත්ති සහ නීති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද මෙම අධ්‍යයනයේ සොයාගැනීම් භාවිතා කිරීමට CEJ අදහස් කරයි. එබැවින්, මෙම අධ්‍යයනයේ ද්විතීයික අරමුණු සහ ඉලක්ක වනුයේ, ශ්‍රී ලංකාව තුළ සහ ගෝලීය වශයෙන් සිදුවන දූෂණ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (GBV) පිළිබඳ සමකාලීන කතිකාවකට මැදිහත් වීම; ලිංගික අල්ලස ශ්‍රී ලංකාව තුළ දූෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙහි නිශ්චිත සහ බරපතල ආකාරයක් ලෙස ඇතුළත් කිරීමට යෝජනා කිරීම; රට තුළ ලිංගික අල්ලස සිදුවීම පිළිබඳ දැනුම බෙදා හැරීම; සහ ශ්‍රී ලංකාවේ සිදුවන ලිංගික අල්ලස පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමයි.

මෙම අධ්‍යයනය සෞඛ්‍ය සහ යුක්තිය යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාව තුළ අල්ලස යන වරද රාජ්‍ය අංශයට අදාළ වේ. CEJ විසින් රාජ්‍ය අංශ ක්ෂේත්‍රයන් අතුරින් යුක්ති ක්ෂේත්‍රය

අධ්‍යයනය කිරීමට තෝරා ගත්තේ තම ජනතාවගේ මානව හිමිකම් සම්බන්ධයෙන් රාජ්‍යයේ වගකීම ඉටු කිරීමේ දී ඔවුන් ඉටු කරන වැදගත් කාර්යභාරය හේතුවෙන් වන අතර සෞඛ්‍ය ක්ෂේත්‍රය තෝරා ගනු ලැබුවේ රට තුළ පොදුවේ මෙන් ම COVID-19 වසංගතය හමුවේ එය ඉටු කරන භූමිකාව හේතුවෙනි. රැකවරණය සපයන්නන්, නිවෙස් රැකබලාගන්නන් සහ රෝගීන් ලෙස පසුගිය කාලය තුළ කාන්තාවන් වැඩි පිරිසක් මෙම අංශය සමඟ කටයුතු කර ඇත. එපමණක් නොව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා වීම් ඉහළ යාමෙන් පෙනී යන්නේ කාන්තාවන් නිතර නිතර යුක්තිය සහ සෞඛ්‍ය අංශ සමඟ සම්බන්ධ වන බව සහ ලිංගික අල්ලස්වලට ගොදුරු වීම සඳහා වැඩි අවදානමකට ලක් වන බවයි. කරුණු දෙකක් අරබයා සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාව මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. CEJ හි කාර්යය තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කරගැනීම පළමු කරුණ වන අතර දෙවන කරුණ වනුයේ පැතිකඩ කිහිපයක් හරහා ම මෙම ප්‍රජාවන් ඔවුන්ගේ එදිනෙදා ජීවිතය තුළ දී ලිංගික අල්ලස අත්විඳින බව දැන් තහවුරු වී තිබීම වේ.[1]

## 1.2. ශ්‍රී ලංකා රාජ්‍යය

ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ගේ සහ ප්‍රජාවන්ගේ එදිනෙදා ජීවිතය තුළ රාජ්‍යයට ප්‍රබල සහ අද්විතීය ස්ථානයක් හිමි වේ. ශ්‍රී ලංකාව සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා ශක්තිමත් සමාජ දර්ශක පිළිබඳ දිගු ඉතිහාසයක් ඇති සුබසාධන රාජ්‍යයකි. රජය විසින් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සපයන අතර පොහොර සහ ඉන්ධන ඇතුළු සහනාධාර කිහිපයක් ද ලබා දෙයි. 1960 දශකයේ අනුගමනය කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් 80%ක පමණ ඉඩම් රජය සතු වේ. එපමණක් නොව, ශ්‍රී ලංකාව සතුව විශාල රාජ්‍ය සේවයක් ඇති අතර රාජ්‍ය ආයතන 500කට අධික සංඛ්‍යාවක් එයට ඇතුළත් වේ.[2] ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව දළ වශයෙන් මිලියන 1.1කි (සන්නද්ධ හමුදාව හැර).[3]

එබැවින් විශේෂයෙන් දරිද්‍රතාවයේ, ප්‍රචණ්ඩත්වයේ සහ වෙනස් කොට සැලකීමේ අවදානමක් ඇති පුද්ගලයින් රාජ්‍යය සමඟ අන්තර්ක්‍රියා කිරීම සාමාන්‍ය සහ අවශ්‍ය දෙයක් වේ. පොදුවේ ගත් කල, පුද්ගලයන් සහ පවුල් නිතිපතා සෞඛ්‍ය සේවා සහ සමාජ සේවා වෙත ප්‍රවේශ වේ. අධ්‍යයනයකින් හෙළි වූයේ 87.6% පවුල් සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වී ඇති බවත්, 54.9% පවුල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රවේශ වී ඇති බවත්, මෙම අධ්‍යයනයට පෙර මාස හයක් ඇතුළත 25.7%ක් පොලිසියට සහ අධිකරණයට ප්‍රවේශ වී ඇති බවත් ය.[4] එම අධ්‍යයනයට සහභාගි වූ කාන්තාවන්ගෙන් 52.3%ක් අල්ලස් හෝ දූෂණවලට මුහුණ දී තිබිණි.[5] දූෂණය පුළුල් ලෙස ව්‍යාප්ත වී ඇති දේශපාලන සංස්කෘතියක (ලංකාවේ පෙනෙන්නට ඇති පරිදි) රාජ්‍යය මත යැපීම බොහෝ පුද්ගලයන් ලිංගික අල්ලස්වලට ලක්වීමේ අවදානමට පත් කරවයි.

## 1.3. පොදුවේ ගත් කළ අල්ලස හා දූෂණය

ගෝලීය වශයෙන් පිළිගත් දර්ශකවලින් පෙනී යන්නේ අල්ලස සහ දූෂණය යනු ශ්‍රී ලංකාවේ පද්ධතිමය ගැටලු බවයි. දූෂණ සංජානන දර්ශකය තුළ රටවල් 180කින් 102වන ස්ථානයේ ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කර ඇති අතර 2021 සඳහා ශ්‍රී ලංකාවේ ලබා ගත් ලකුණු සංඛ්‍යාව 100න් 37 කි[6] ගෝලීය දූෂණ බැරෝමීටරයට (Global Corruption Barometer) අනුව, 79% ක් සිතන පරිදි රජයේ දූෂණය 'විශාල ගැටලුවක්' වන අතර, රාජ්‍ය සේවා භාවිතා කරන්නන්ගෙන් 16%ක් පසුගිය මාස 12 තුළ අල්ලසක් ගෙවා තිබිණි (2020 දත්ත අනුව).[7] නීති පද්ධතිය විසින් එලදායී ලෙස මෙම ගැටලුව වැළැක්වීම හෝ එයට පිළියම්

[1] 'දැනුම, ආකල්ප සහ සංජානන සමීක්ෂණ වාර්තාව: ලිංගිකත්වය පිළිබඳ ශ්‍රී ලාංකීය සමාජයේ අදහස් සහ ශ්‍රී ලංකාව තුළ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සහ සංක්‍රාන්ති සමාජභාවී (LGBT) පුද්ගලයින්ගේ අත්දැකීම්' (සමාජ විද්‍යාඥයින්ගේ සංගමය 2021); 'සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI+) ශ්‍රී ලාංකිකයන් පසුපස හඹා යන නීති සහ ප්‍රතිපත්ති පිළිබඳ නැවත සිතා බැලීම' (ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෙස්ට්මිනිස්ටර් පදනම 2021)

[2] ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන්ගේ තත්ත්වය - 2019 (ඇඩ්වොකාටා ආයතනය 2019) 8.

[3] රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයේ රැකියා සංගණනය - 2016 (සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2018) 6.

[4] 'රාජ්‍ය සේවයේ දූෂණය පිළිබඳ කාන්තා අත්දැකීම්' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකාව, ජූනි 2014) 15-16.

[5] 'රාජ්‍ය සේවයේ දූෂණය පිළිබඳ කාන්තා අත්දැකීම්' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකාව, ජූනි 2014) 15.

[6] 'දූෂණ සංජානන දර්ශකය 2021' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2022) 3

[7] 'ගෝලීය දූෂණ බැරෝමීටරය ආසියාව 2020' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2021) 51

යෙදීම සිදු කර නැත. මෑතක සිට සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් සමාජය තුළ අල්ලසෙහි විශේෂිත ආකාරයක් ලෙස ලිංගික අල්ලස කෙරෙහි අවධානය යොමු කර ඇත.[8]

## 1.4. කාන්තාවන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවගේ තත්ත්වය

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ තත්ත්වය හොඳින් ලේඛනගත වී ඇතත් සැබෑ තත්ත්වය බොහෝ විට වෙනස් මුහුණුවරක් ගනියි. ඔවුන් ව්‍යතිරේක කිහිපයක් සහිතව ඉහළ සමාජ දර්ශක සහ නීතිය ඉදිරියේ විධිමත් සමානාත්මතාවය භුක්ති විඳිති. කෙසේ වෙතත්, නියෝජිත දේශපාලනයේ සහ පුළුල් සමාජයේ නායකත්ව තනතුරුවල කාන්තා නියෝජනය ඉතා අවම වේ. තවද, ශ්‍රී ලංකාවේ කාන්තාවන් සූරාකෑමට බඳුන් වෙමින් ඇඟලුම් කර්මාන්තයේ, වතුකරයේ සහ සංක්‍රමණික කම්කරුවන් ලෙස සේවයේ යෙදේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බරපතල ගැටලුවක් වන අතර ඉලක්කගත නීති සම්පාදනය කර තිබියදීත් එය අඛණ්ඩව සිදු වෙමින් පැවතී ඇත.

'ස්වභාවධර්මයේ අනුපිළිවෙලට එරෙහි ස්වේච්ඡා ලිංගික සංසර්ගය' සහ 'ඕනෑම අශෝභන ක්‍රියාවක්' ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය (යටත් විජිත නීතියක්) යටතේ අපරාධයක් වේ.[9] මෙම විධිවිධානය විවිධ ලිංගික දිශානතීන් සහිත පුද්ගලයන් ඉලක්ක කර ගැනීම සඳහා භාවිතා කර ඇත[10] ශ්‍රී ලංකාව තුළ පිළිගැනෙන්නේ විෂමලිංගික විවාහ පමණි. ගණිකාවාස පවත්වාගෙන යාම හැර ලිංගික ශ්‍රමය ශ්‍රී ලංකාව තුළ අපරාධ වරදක් ලෙස නොදැක්වේ.[11] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික දිශානතීන් සහ විවිධ ස්ත්‍රී පුරුෂ සාමාජභාවයන් නියෝජනය කරන ලිංගික ශ්‍රමිකයින් අත්අඩංගුවට ගැනීම සහ වරදකරුවන් කිරීම සඳහා පාදඩ ආඥාපනත (තවත් යටත් විජිත නීතියක්) භාවිතා වේ.[12] එහි ප්‍රතිඵලයක් ලෙස, ලිංගික ශ්‍රමිකයන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින් ශ්‍රී ලංකාව තුළ දැඩි පීඩනයකට ලක් වන අතර ඔවුන් අවදානමට ද ලක්වීම සිදු වේ.



[8] උදාහරණ ලෙස, 'ලිංගික අල්ලස්: දූෂණයේ නිහඬ කල පැත්ත' ඩේලි ෆිනෑන්ෂල් ටයිම්ස්, 2020 සැප්තම්බර් 3, https://www.ft.lk/Opinion-and-Issues/Sexual-bribery-The-silenced-side-of-corruption/14-705482¦ 'Quid pro quo: ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස පිළිබඳ අධ්‍යයනයක් 'ඩේලි ෆිනෑන්ෂල් ටයිම්ස් (2020 ජනවාරි 24) https://www.ft.lk/Opinion-and-Issues/Quid-pro-quo-A-study-of-sexual-bribery-in-Sri-Lanka/14-694260 ; 'ලිංගික කප්පම්: නව නමක්, පැරණි අපරාධයක් 'සිලෝන් ඉන්ඩිපෙන්ඩන්ට් 2020 ජනවාරි 4 http://www.independent.lk/sextortion-a-new-name-an-age-old-crime/ බලන්න.

[9] 1883 දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය සහ 365A වගන්තිය. මෙම වරදට වසර 10ක් දක්වා සිර දඬුවම් ලැබිය හැකිය.

[10] 'දැනුම, ආකල්ප සහ සංජානන සමීක්ෂණ වාර්තාව: ලිංගිකත්වය පිළිබඳ ශ්‍රී ලාංකීය සමාජයේ අදහස් සහ ශ්‍රී ලංකාව තුළ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සහ සංක්‍රාන්ති සමාජභාවී (LGBT) පුද්ගලයින්ගේ අත්දැකීම් '(සමාජ විද්‍යාඥයින්ගේ සංගමය 2021); 'සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI+) ශ්‍රී ලාංකිකයන් පසුපස හඹා යන නීති සහ ප්‍රතිපත්ති පිළිබඳ නැවත සිතා බැලීම' (ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෙස්ට්මිනිස්ටර් පදනම 2021)

[11] 1889 සංශෝධිත ගණිකා නිවාස ආඥාපනත.

[12] 1841 සංශෝධිත පාදඩ ආඥාපනත.



# 2. නීතිමය රාමුව

## 2.1. ජාත්‍යන්තර නීතිය

සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින් සහ කාන්තාවන් ඉලක්ක කරන අල්ලස් සහ දූෂණයේ සුවිශේෂී ආකාරයක් ලෙස ලිංගික අල්ලස අන්තර්ජාතික් මට්ටමින් වැඩි වශයෙන් පිළිගැනෙමින් පවතී.

කාන්තාවන්ට එරෙහි සියලු වෙනස් කොට සැලකීම් තුරන් කිරීම සඳහා වූ සම්මුතිය (The Convention on the Elimination of All Forms of Discrimination Against Women - CEDAW) විසින් කාන්තාවන් සඳහා සමානාත්මතාවය සහතික කිරීම පිළිබඳව රාජ්‍ය පාර්ශවයන් විසින් කටයුතු කිරීම අපේක්ෂා කෙරෙන අතර CEDAW අර්ථකථනය කර ඇත්තේ කාන්තාවන්ට එරෙහි උල්ලංඝනයන් පිළිබඳ තහනමක් ඇතුළත් වන පරිදි ය. ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනයන් විසින් පෙන්නුම් කරන්නේ කාන්තාවන් බොහෝ විට ලිංගික අල්ලස්වලට ලක්වන බවත් ලිංගික අල්ලස යනු සැලකිය යුතු සමානාත්මතාවය (හෝ සමාන අවස්ථා) උල්ලංඝනය කරන ලිංගික ප්‍රචණ්ඩත්ව ආකාරයක් බවත් ය. බොහෝ අපරාධකරුවන් පිරිමි පුද්ගලයන් ලෙස තමන්ව හඳුනා ගත් අය (ස්වයං-හඳුනාගැනීම) වීමත්, බොහෝ දිවි ගලවා ගත් පුද්ගලයන් කාන්තාවන් ලෙස ස්වයං-හඳුනා ගැනීම සිදු කිරීමත් කාන්තාවන්ට එරෙහි පද්ධතිමය සහ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ සාක්ෂියකි. කෙසේ වෙතත්, ප්‍රචණ්ඩත්වය හා සමානව CEDAW යටතේ ලිංගික අල්ලස් පැහැදිලි තහනමකට ලක් ව නැත.

කාන්තා විනිසුරුවරුන්ගේ ජාත්‍යන්තර සංගමය ලිංගික අල්ලස නිශ්චිත මානව හිමිකම් උල්ලංඝනයක්, සාපරාධී වරදක් සහ දූෂණයේ ආකාරයක් ලෙස පිළිගත් පළමු ජාත්‍යන්තර ආයතනයයි. ඔවුන් මෙම සංසිද්ධිය විස්තර කිරීමට 'ලිංගික කප්පම්' (Sextortion) යන යෙදුම භාවිතා කරයි. 'ලිංගික කප්පම්' වලට එරෙහි ඔවුන්ගේ මෙවලම් කට්ටලය විසින් එය කොටස් දෙකකින් සමන්විත වන්නක් ලෙස විස්තර කරයි: එනම්, ලිංගික සංරචකයක් සහ දූෂණ සංරචකයක් යනුවෙනි. ඔවුන්ට අනුව, 'ලිංගික කප්පම් යන්න සඳහා රජයේ ප්‍රතිලාභයක් ලබා ගැනීම අරබයා ලිංගික ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා පැහැදිලි හෝ ව්‍යංග ඉල්ලීමක් ඇතුළත් වේ'.[13] බලය අයුතු ලෙස භාවිතා කිරීම, තමන්ට ලබා දෙන දෙයක් සඳහා හුවමාරුවක් ලෙස පෙරළා යමක් ලබා දීම (a quid pro quo exchange), සහ ශාරීරික බලය අභිබවා යන මානසික බලහත්කාරය යනාදිය ලිංගික කප්පම් සඳහා ඇතුළත් වේ.[14] ඔවුන් ලිංගික අපචාර නඩු පැවරීමේ අභියෝග, විශේෂයෙන් පවතින නීතිය යටතේ තිබිය හැකි එවන් අභියෝග, ගෙන හැර දක්වයි. ලිංගික අපරාධ පිළිබඳ වත්මන් නිර්වචනයන් සඳහා අනුමැතිය නොමැතිකම යනු අත්‍යවශ්‍ය අංගයකි. කැමැත්ත / අනුමැතිය නොමැතිකම තහවුරු කිරීම සඳහා ශාරීරික තුවාල හෝ ශාරීරික බලකිරීම් පිළිබඳ සාක්ෂි භාවිතා කරනු ලැබේ. ඔවුන්ගේ වාර්තාවෙන් පෙන්නුම් කරන පරිදි, ලිංගික අල්ලස නිශ්චිත අපරාධයක් වන අතර එය කැමැත්ත ඇතිව සිදු විය හැකිය. (දිවි ගලවාගත් පුද්ගලයාට ඔවුන් පත්වන අවදානම් තත්ත්වය හේතුවෙන් ඉල්ලා සිටින ලිංගික ක්‍රියාකාරකම්වල යෙදීම හැර වෙනත් විකල්පයක් ඉතිරි නොවේ). එබැවින් ශාරීරික හානියක් නොමැති අවස්ථාවන් ද මේ සඳහා ඇතුළත් විය හැකිය.

අල්ලසට සහ දූෂණයට එරෙහි ප්‍රමුඛ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, 'ලිංගික කප්පම්' යන්න හඳුනාගෙන ඇත. ඔවුන් සඳහන් කරන්නේ 'සල්ලිවලට වඩා ලිංගිකත්වය අල්ලසෙහි මුදල' බවයි. එය ඇතැම් රටවලට හෝ ක්ෂේත්‍රවලට පමණක් සීමා වූවක් නොවන අතර, බලය පැවරී ඇති අයට අවංකභාවය නොමැති විට, සහ ඔවුන් විසින් අවදානමට ලක්විය හැකි සහ ඔවුන්ගේ බලය මත යැපෙන අය ලිංගිකව සූරාකෑමට උත්සාහ කරන ඕනෑ ම අවස්ථාවක එය දැකිය හැකි වනු ඇත.[15] නීති වෘත්තිය පිළිබඳ ගෝලීය වෘත්තීය ආයතනය වන ජාත්‍යන්තර

[13] නම් කිරීම, ලැජ්ජාවට පත් කිරීම, සහ ලිංගික කප්පම් ගැනීම අවසන් කිරීම: මෙවලම් කට්ටලය (ජාත්‍යන්තර කාන්තා විනිසුරුවරුන්ගේ සංගමය, 2012) 9

[14] නම් කිරීම, ලැජ්ජාවට පත් කිරීම, සහ ලිංගික කප්පම් ගැනීම අවසන් කිරීම: මෙවලම් කට්ටලය (ජාත්‍යන්තර කාන්තා විනිසුරුවරුන්ගේ සංගමය, 2012) 9-11

[15] ලිංගික කප්පම් වටා ඇති නිශ්ශබ්දතාවය බිඳ දැමීම: ලිංගිකත්වය, බලය සහ දූෂණය අතර සම්බන්ධකම් 8 (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2020)

[16] ලිංගික කප්පම්: දූෂණය සහ ලිංගික සූරාකෑමේ අපරාධයක් (ජාත්‍යන්තර නීතිඥ සංගමය, 2019)

නීතිඥ සංගමය විසින් ද ලිංගික අල්ලස බරපතල ගැටලුවක් ලෙස පිළිගෙන ඇත. ඔවුන් ද අනුගමනය කරන්නේ කාන්තා විනිසුරුවන් සඳහා වූ ජාත්‍යන්තර සංගමය විසින් සකස් කරන ලද නිර්වචනයයි.[16] දැනට, ලිංගික අල්ලස හෝ ලිංගික කප්පමට එරෙහි ප්‍රකාශිත තහනම් කිරීම් ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම්වල සඳහන් නොවේ. දූෂණය වැලැක්වීම සහ මැඩපැවැත්වීම පිළිබඳ අප්‍රිකානු සංගම් සම්මුතිය විසින් දූෂණය යනු 'රාජ්‍ය නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ රාජ්‍ය කාර්යයන් ඉටු කිරීමේ දී කිසියම් ක්‍රියාවක් කිරීම හෝ නොකර සිටීම වෙනුවෙන් තමාට හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට වාසි පිණිස සෘජුව හෝ වක්‍රව මුදල් වටිනාකමක් ඇති භාණ්ඩයක් හෝ තෑග්ගක්, අනුග්‍රහයක්, පොරොන්දුවක් වැනි වෙනත් ප්‍රතිලාභයක් ඉල්ලා සිටීම හෝ පිළිගැනීම බව පිළිගනී.[17] 2004 දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සහ අන්තර් ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති දෙකෙහි දූෂණය පිළිබඳ නිර්වචනයට ද ලිංගික අල්ලස ඇතුළු වී ඇතැයි අර්ථ දැක්විය හැකි ය. මෙම සම්මුතීන් හි දැක්වෙන අල්ලස පිළිබඳ නිර්වචනය පහතින් ප්‍රතිනිෂ්පාදනය කෙරේ.

රාජ්‍ය නිලධාරියෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ රාජකාරි නිල වශයෙන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම පිණිස, සෘජුව හෝ වක්‍රව, තමාට හෝ වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක් වෙනුවෙන් අනවශ්‍ය වාසියක් ඉල්ලා සිටීම හෝ පිළිගැනීම.[18]

*A.* රාජ්‍ය නිලධාරියෙකුට ඔහුගේ හෝ ඇයගේ නිල කාර්යය කිරීම හෝ එය නොකර සිටීම සඳහා එම රාජ්‍ය නිලධාරියාට, වෙනත් පුද්ගලයෙකුට හෝ යම් ආයතනයකට සෘජුව හෝ වක්‍රව අනවශ්‍ය වාසියක් ලබා දෙන බවට පොරොන්දුව, එවන් වාසියක් පිරිනැමීම හෝ ලබා දීම;

*B.* රාජ්‍ය නිලධාරියෙකු විසින් තම නිල රාජකාරි ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමෙන් වැළකී සිටීම පිණිස, සෘජුව හෝ වක්‍රව, තමාට හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට අනවශ්‍ය වාසියක් ඉල්ලා සිටීම හෝ පිළිගැනීම.[19]

ශ්‍රී ලංකාව විසින් පිළිවෙළින් 2004 සහ 2006 දී මෙම සම්මුතීන් අනුමත කරන ලදී.

## 2.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් 2001 වසරේ සිට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව (CIABOC) පිළිගෙන තිබේ. 2015 දී සිදු කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනය යටතේ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව (CIABOC) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලදී. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සහ 'ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වන දූෂණය වැලැක්වීම සම්බන්ධ වෙනත් ඕනෑම ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාත්මක කිරීම' සඳහා පාර්ලිමේන්තුවේ යුතුකම පිළිබඳව මෙම සංශෝධනය විසින් නිශ්චිතව සඳහන්/ආමන්ත්‍රණය කර ඇත.[20] ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණය පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා රාජ්‍යයේ වගකීම පිළිබඳ මෙතෙක් ලද ඉහළම පිළිගැනීම මෙය විය. 2020 දී සිදු කරන ලද 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම ව්‍යවස්ථාව අවලංගු කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සමානාත්මතාවයට ඇති අයිතිය යන්න අධිකරණය විසින් අර්ථකථනය කර ඇත්තේ අත්තනෝමතික විධායක හෝ පරිපාලන ක්‍රියාවන් තහනම් කිරීමක් ඇතුළත් වන පරිදි ය. මෙම නීති සංග්‍රහය පසුගිය දශක තුනක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ ගොඩනැගී ඇත්තේ, එකල 'සමානාත්මතාවයේ නව මූලධර්මය' ලෙස හැඳින්වූ ඉන්දීය නීති සංග්‍රහය අනුගමනය කරමිනි.[21] එපමණක් නොව, 2016 දී ප්‍රථම වතාවට මනෝහාරි පෙලකැටියගේ නඩුවේ දී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලිංගික අතවරය යනු වෙනස් කොට සැලකීමට ලක් නොවී සිටීමේ නිදහස/අයිතිය උල්ලංඝනය

[17] වගන්තිය 4 (1)(a) 2003 දූෂණ වැළැක්වීම සහ මර්දනය පිළිබඳ අප්‍රිකානු සංගමයේ සම්මුතිය
[18] වගන්තිය 15 (b) 2004 දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය
[19] වගන්තිය 8 (1) අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය 2000
[20] ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වැනි සංශෝධනය යටතේ 156 (1) (ජ) වගන්තිය
[21] මේ සම්බන්ධයෙන්, දිනේෂා සමරරත්න, අධිකරණමය ලබා ගැනීම් සහ මිදී යාමේ බලපෑම්: ශ්‍රී ලංකාවේ මහජන නීතිය තුළ ඉන්දියානු අධිකරණ විද්‍යාව 2(3) (2018) ඉන්දියානු නීති සමාලෝචනය 205, බලන්න
[22] මනෝහාරි පෙලකැටියට එදිරිව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්, SC/FR 76/2012, SC රැස්වීම් වාර්තා 2016 සැප්තැම්බර් 28.

කිරීමක් බව පිළිගත්තේ ය.[22] එම නඩුවේ දී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රථම වතාවට කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය සැලකිල්ලට ගන්නා ලදී.

## 2.3. අල්ලස් පනත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභා (CIABOC) පනත

1954 අල්ලස් පනත මගින් ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණය අපරාධයක් බවට පත් කරයි. මෙම නීතිය තුළින් ලිංගික අල්ලස අපරාධයක් ලෙස පැහැදිලිව ම සලකනු නොලැබේ. අල්ලස් පනත මඟින් ප්‍රකාශ කෙරෙන ආකාරයට රාජ්‍ය සේවයක් ලබා ගැනීම සඳහා හෝ රාජ්‍ය සේවයේ කාර්යය සාධනයට බලපෑම් කිරීම සඳහා 'තෘප්තියක්' ඉල්ලා සිටීම හෝ ලබා දීම අල්ලසක් වේ.[23] පනත මගින් 'තෘප්තිය' යන්න පුළුල් ලෙස අර්ථ දක්වයි.[24] අභියාචනාධිකරණය විසින් 1998 දී තීරණය කර ඇති පරිදි, අල්ලස් පනත යටතේ 'තෘප්තිය' යන්න එහි පුළුල් අර්ථයෙන් භාවිතා කෙරේ... ලිංගික සංසර්ගය සඳහා ඇති තෘෂ්ණාව... මානසික සහ කායික ආශාවන්ට උදාහරණයක් වන අතර, එයින් ඇති වන තෘප්තිය, මුදලින් තක්සේරු කළ නොහැකි තෘප්තියයි.[25] මෙය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පිරිමි ජ්‍යෙෂ්ඨ ආරක්ෂක කළමනාකාරවරයකු විසින් කාන්තා ආරක්ෂක නිලධාරිනියකගෙන් ලිංගික අල්ලස් ඉල්ලා අල්ලස් පනත යටතේ වරදකරු වූ නඩුවකි. ලිංගික අල්ලස් ගැනීම අල්ලස් පනතට අයත් යැයි පිළිගත් ශ්‍රී ලංකාවේ වාර්තා වූ එකම සිද්ධිය මෙයයි. එබැවින් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහ අධිකරණයට ලිංගික අල්ලස් තහනම් කිරීමක් ඇතුළත් කිරීම සඳහා අල්ලස් පනත අර්ථ නිරූපණය කළ හැකි ය. ලිංගික අල්ලස් සම්බන්ධයෙන් සාර්ථකව නඩු පැවරූ වෙනත් අවස්ථා වාර්තා වී නොමැත. කෙසේ වෙතත් ලිංගික අල්ලස් පිළිබඳව වාර්තා වීම අඛණ්ඩව ම සිදු වේ. මෙයින් ඇඟවෙන්නේ ලිංගික අල්ලස් වක්‍රව තහනම් කිරීම ප්‍රමාණවත් නොවන බව සහ කාර්යක්ෂම නොවන බවයි. එපමණක් නොව, අල්ලස් පනත යටතේ ලිංගික අල්ලසක් ඉල්ලා සිටින රාජ්‍ය නිලධාරියාට මෙන් ම තෘප්තිය ලබා දෙන පුද්ගලයාට ද නඩු පැවරිය හැකි ය.[26] මෙම විධිවිධානය මගින් දිවි ගලවා ගත් අය විසින් ලිංගික අල්ලස් පිළිබඳව පැමිණිලි කිරීම වැළැක්විය හැකි ය. වින්දිතයින්ට තර්ජනය කිරීම සහ ඔවුන් පැමිණිලි කිරීමෙන් වැළැක්වීම සඳහා අපරාධකරුවන්ට ද මෙය ප්‍රයෝජන ගත හැකි ය.

එපමණක් නොව, ලිංගික අල්ලස තෘප්තිය ලබා දීමේ ආකාරයක් ලෙස සැලකිය හැකි බව ශ්‍රී ලංකා මහාධිකරණය මඟින් පිළිගෙන ඇති බව සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් දක්වා ඇත.[27] සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වා ලිංගික අල්ලස නිශ්චිත ලෙස අපරාධ වරදක් බවට පත් කිරීම සඳහා මෙම පනතට සංශෝධන එක් කිරීම වෙනුවෙන් උද්දේශනයන් ලබා දී තිබේ.[28] CEJ විසින් නීති ප්‍රතිසංස්කරණ සඳහා සිදු කරන සංවාදයන්, උද්දේශනයන් සහ බලපෑම් කිරීමේ මෙම ප්‍රයත්නයන් අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

1994 අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභා (CIABOC) පනත මගින් අල්ලස් පනත යටතේ වැරදි විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා

---

[23] 1954 සංශෝධිත අල්ලස් පනත.

[24] අල්ලස් පනතේ 90 වගන්තිය.

[25] කතුබිදීන්ට එරෙහිව ශ්‍රී ලංකා ජනරජය [1998] 3 ශ්‍රී එල් ආර් 107, 117. උසාවිය විසින් එච් එස් ගෞර්, ඉන්දියාවේ දණ්ඩ නීතිය උපුටා දක්වන ලදී. (ඉන්දීය නීති ප්‍රකාශකයින්) වෙළුම් අංක 1 (සංස්කරණය නිශ්චිතව දක්වා නොමැත)

[26] උදාහරණයක් ලෙස, අල්ලස් පනතේ 19 වන වගන්තියට මෙසේ දක්වයි. (අ) රජයේ සේවකයෙකු විසින් යම් නිල කාර්යයක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම සඳහා හෝ එකී රජයේ සේවකයා විසින් හෝ වෙනයම් රජයේ සේවකයෙකු විසින් යම් නිල කාර්යයක් ඉක්මන් කිරීම, ප්‍රමාද කිරීම, එයට බාධා කිරීම නැතහොත් එය වැළක්වීම සඳහා හෝ රජය සමඟ යම් කටයුත්තක් කිරීමේ දී යම් තැනැත්තෙකුට ආධාර කිරීම, පක්ෂග්‍රාහී වීම, බාධා කිරීම හෝ ප්‍රමාද කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් ඒ රජයේ සේවකයාට පිරිනමන හෝ; (ආ) රජයේ සේවකයකු ව, යම් නිල ක්‍රියාවක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම සඳහා හෝ මෙම වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් ඉක්මන් කිරීමක්, ප්‍රමාද කිරීමක්, බාධා කිරීමක්, වැළක්වීමක්, ආධාර කිරීමක් හෝ පක්ෂග්‍රාහී වීමක් සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් අයදින හෝ භාර ගන්නා හෝ; (ඇ) රජයේ සේවකයකු ව යම් තුටු පඬුරක් අයදින හෝ භාරගන්නා; තැනැත්තෙකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

[27] ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා නීති සංශෝධන හා ප්‍රතිපත්ති සංශෝධන (සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය YEAR) 7 හි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවට එදිරිව සහ අබ්දුල් රෂාක් කුතුබ්දීන්. ගැහැණු ළමුන් සහ කාන්තාවන්ට එරෙහි හිංසනය වැලැක්වීම පිළිබඳ විපක්ෂ නායක කොමිසමේ වාර්තාවේ ද මෙය දක්වා ඇත (දෙසැම්බර් 2014) 48 (http://gbvforum.lk/r-library/document/Report%20of%20the%20Leader.pdf හරහා මෙය ලබා ගත හැක.)

[28] ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා නීති සංශෝධන හා ප්‍රතිපත්ති සංශෝධන (සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය 2018)

කොමිෂන් සභාවක් ස්ථාපිත කරයි.[29] අල්ලස හා දූෂණය වැලැක්වීම සහ නඩු පැවරීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවෙහි (CIABOC) විධිමත්භාවයට එහි ස්වාධීනත්වය, නීතිමය අධිකාරිය සහ දණ්ඩමුක්තිය හා අදාළ පුළුල් දේශපාලන සංස්කෘතිය සම්බන්ධ ගැටලු ඇතුළු බොහෝ සාධක මගින් බාධා එල්ල වේ.[30] වඩාත් මෑතක දී, අල්ලස හා දූෂණයට එරෙහිව සටන් කිරීම පිළිබඳව කොමිෂන් සභාවේ උත්සාහයන් අතරට ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (2019-2023) සම්මත කිරීම සහ අභිලාෂයන් පිළිබඳ ඇතිවිය හැකි ගැටුම් (conflicts of interest) ඇමතීම ඇතුළු දේ සඳහා මාර්ගෝපදේශ ගොඩනැගීම මෙන් ම මහජනතාව දැනුවත් කිරීම සහ එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ගන්නා ඒකාබද්ධ උත්සාහයන් යනාදිය ඇතුළත් වේ. ලිංගික අල්ලස යනු ආමන්ත්‍රණය කළ යුතු නිශ්චිත ප්‍රශ්නයක් ලෙස ජාතික ක්‍රියාකාරී සැලැස්ම විසින් හඳුනාගෙන නොමැත. CIABOC විසින් ජාතික ක්‍රියාකාරී සැලැස්මට අමතරව ව්‍යවස්ථාදායක සංශෝධන සඳහා යෝජනා ප්‍රකාශයට පත් කර ඇත. මෙම යෝජනා අතර, ලිංගික අල්ලස යනු අල්ලස් පනත යටතේ තෘප්තිමත් කිරීම පිළිබඳ වූ නිශ්චිත ආකාරයක් ලෙස අර්ථ දැක්විය යුතු බවට CIABOC විසින් යෝජනා කර ඇත. CIABOC විසින් ලිංගික අල්ලස සඳහා පහත අර්ථ දැක්වීම යෝජනා කරයි:

> **‘…බලයේ හෝ අධිකාරියේ සිටින පුද්ගලයින් විසින් එම බලය හෝ අධිකාරිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලා සිටි හෝ ලබා ගෙන ඇති ලිංගික අනුග්‍රහයන් (ලෙස). රැකියාවක්, උසස්වීමක්, අයිතියක්, වරප්‍රසාදයක් හෝ වෙනත් ඕනෑ ම සේවාවක්, අනුග්‍රහයක් හෝ වාසියක් ලබා දීම සඳහා කොන්දේසියක් ලෙස එවැනි අනුග්‍රහයන් ඉල්ලා සිටිනු ලැබේ. "ලිංගික අනුග්‍රහයක්" යනු ලිංගික සංසර්ගය හෝ ලිංගික සංසර්ගය යන්නට අයත් නොවන ඕනෑම ක්‍රියාවක් විය හැකි ය. නමුත්, ලිංගික ස්වභාවයේ ශාරීරික, වාචික හෝ වාචික නොවන හැසිරීම් මේ සඳහා අයත් වනු ඇත.’’**[31]

## 2.4. යුක්තිය සහ නෛතික සාක්ෂරතාවය සඳහා ප්‍රවේශය

ශ්‍රී ලංකාව තුළ යුක්තිය සහ නෛතික සාක්ෂරතාවය සඳහා ප්‍රවේශයෙහි සැලකිය යුතු දියුණුවක් අවශ්‍ය වේ. රාජ්‍ය අරමුදලින් ක්‍රියාත්මක වන නීති ආධාර වැඩසටහනෙහි බොහෝ සීමාවන් පවතී. ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ ඇතැම් සිවිල් සමාජ සංවිධාන මගින් සීමිත නීති ආධාර සේවාවන් සපයනු ලැබේ.[32] මානව හිමිකම් කොමිෂන් සභාව සතුව රට පුරා ශාඛා කිහිපයක් පවතින අතර එබැවින් එය ජනතාව වෙත පවතින අධිකරණමය නොවන පිළියමකි. මානව හිමිකම් කොමිසමට සිදු කළ හැක්කේ නීතිමය නියෝගයක ආකාරයේ බලයක් නොමැති නිර්දේශ සැපයීම පමණි. එපමණක් නොව, කොමිෂන් සභාව පත්කිරීමේ ක්‍රියාවලිය දේශපාලනීකරණය වූ සෑම අවස්ථාවක ම කොමිෂන් සභාවේ ස්වාධීනත්වය හෑල්ලුවට සහ ප්‍රශ්න කිරීමට ලක් වී තිබේ.[33]

[29] 2001 දී මෙම කොමිසමේ ස්වාධීනත්වය 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා තහවුරු විය. මෙම සංශෝධනය මගින් CIABOC ඇතුළු විශේෂිත ව්‍යවස්ථාපිත කොමිෂන් සභා සඳහා නාමිකයන් යෝජනා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පිහිටුවන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 18වැනි සංශෝධනය (2010) යටතේ අවලංගු කරන ලද අතර, 19වැනි සංශෝධනය (2015) යටතේ සංශෝධිත ආකෘතියකින් ප්‍රතිසංස්කරණය කරන ලද අතර 20 වැනි සංශෝධනය (2020) යටතේ නැවත අවලංගු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා CIABOC වෙත නියමයන් ලබාදුන් කාලසීමාවන් තුළ පවා අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් වූ මහා පරිමාණ චෝදනා ඵලදායී ලෙස හැසිරවීමට එය සමත් වී නොමැත.


[30] කොමිෂන් සභාවේ කාර්යය සාධන වාර්තාවට අනුව, 2019 දී කොමිෂන් සභාව සිද්ධි 46කට සාර්ථකව නඩු පවරා තිබේ. මෙයින් ජනාධිපති කාර්යය මණ්ඩල ප්‍රධානියා හා සම්බන්ධ සිද්ධිය ඉහළ පෙළේ නඩුවක් වූ නමුත් අනෙක් අය සුළු නිලධාරීන් ය. නමුත් පසුව චූදිතයා නිදොස් කොට නිදහස් විය. වාර්ෂික කාර්යය සාධන වාර්තාව (CIABOC 2019) 18

[31] ‘යෝජිත ව්‍යවස්ථාදායක සංශෝධන සඳහා ප්‍රතිපත්ති යෝජනා’, අත්පොත 4 (CIABOC 2019) 38


[32] සවිස්තරාත්මක අධ්‍යයනයක් සඳහා ආසියා පදනම, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ යුක්තිය වෙත සම ප්‍රවේශය පිළිබඳ ව්‍යාපෘතිය, සහ සරණාගතයින් සඳහා වූ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය හි ඒකාබද්ධ ප්‍රකාශනයක් වන ශ්‍රී ලංකාවේ නීති ආධාර අංශය: තිරසාර විසඳුම් සෙවීම (2009) බලන්න.

[33] උදාහරණයක් ලෙස, ‘සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI+) ශ්‍රී ලාංකිකයන් පසුපසට කොට තබන නීති සහ ප්‍රතිපත්ති පිළිබඳ නැවත සිතා බැලීම’ (ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෙස්ට්මිනිස්ටර් පදනම 2021) බලන්න.

කෙසේ වෙතත්, මූලික අයිතිවාසිකමක් කඩකිරීම හෝ කඩිනමින් උල්ලංඝනය කිරීම පිළිබඳ වන පෙත්සම් මාසයක් ඇතුළත කොළඹ පිහිටි ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළ යුතු ය.[34] තවද, CIABOC කොළඹ පිහිටා ඇති අතර වෙනත් ශාඛා නොමැත. ශ්‍රී ලංකාවේ නීති සාක්ෂරතාව ක්‍රමානුකූල අධ්‍යයනයකින් මනිනු ලැබ නැත. නීතිය පිළිබඳ දැනුම නොමැතිකම, නිසි පිළියම් නොපැවතීම සහ නීති උපදෙස් ලබා ගැනීමට ඇති නොහැකියාව බොහෝ විට ලිංගික අල්ලස ඇතුළු මානව හිමිකම් උල්ලංඝනයන්ට ලක්වන පුද්ගලයන් තවදුරටත් බල රහිත කිරීම කෙරෙහි බලපායි.



[34] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වගන්තිය.



# 3. ලිංගික අල්ලස් පිළිබඳ CEJ හි උද්දේශනයන්

## 3.1. විධිවිධාන

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය කොළඹ පිහිටි කාන්තා සංවිධානයක් වන අතර, මූලික වශයෙන් සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ට අයත් යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන්ගේ අයිතිවාසිකම්, සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ වෙනත් සිවිල් නොසන්සුන්තාවන්ගෙන් පීඩාවට පත් වූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ක්‍රියා කරයි. CEJ රට පුරා විසිර සිටින හවුල්කාර සංවිධාන සමඟ ක්‍රියා කරන අතර මධ්‍යම රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ මෙන් ම ප්‍රාදේශීය සහ පළාත් පාලන මට්ටම්වල රාජ්‍ය නිලධාරීන් සමඟ ද හවුල්කාරීත්වයෙන් යුක්තව කටයුතු කරයි. CEJ විසින් කාන්තා ගෘහ මූලිකයන්ගේ මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් පුළුල් සහ එලදායී මැදිහත්වීම් සිදු කර ඇති අතර, සංක්‍රාන්ති යුක්තිය හා අදාළව දිවි ගලවා පුද්ගලයන් සඳහා වන්දි ගෙවීම, සහ 2016 වසරේ සිට ලිංගික අල්ලස් වැළැක්වීම සහ ඒවාට පිළියම් පිළිබඳ උද්දේශන ප්‍රයත්නයන් මෙහෙයවා ඇත.

## 3.2. ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් පිළිබඳ දැනට පවතින දැනුම

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් වලට එරෙහිව උද්දේශනයන් සැපයීම පිළිබඳ පුරෝගාමීව කටයුතු කර ඇත. CEJ හි උද්දේශන මූලපිරීම් පදනම් වී ඇත්තේ මෙම ගැටලුව සම්බන්ධයෙන් පසුගිය වසර කිහිපය තුළ සිදු කරන ලද අධ්‍යයන තුනක් මත ය. 'ශ්‍රී ලංකාවේ උතුරේ යුද්ධයෙන් පීඩාවට පත් කාන්තා ගෘහ මූලිකයන් ලිංගික සූරාකෑමට ලක් වීම' ('Sexual Exploitation of Female Heads of Households Affected by War in the North of Sri Lanka') (2016 මාර්තු 5) යන මාතෘකාවෙන් යුත් අධ්‍යයනය පදනම් වී ඇත්තේ ලිංගික අල්ලස්වලට ගොදුරු වී දිවි ගලවා ගත් අයගේ අත්දැකීම් පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් විසිපහක් මත ය. මෙම දිවි ගලවා ගත් පුද්ගලයන් යුද්ධයෙන් පීඩාවට පත් උතුරු පළාතේ සහ පුත්තලම දිස්ත්‍රික්කයේ අය වූහ. 'රහසිගතව තබාගත්: පශ්චාත් යුධ දිස්ත්‍රික්කවල මුස්ලිම් කාන්තාවන්ගේ ලිංගික අල්ලස් සිද්ධීන්' ('Shrouded in Secrecy: Sexual Bribery of Muslim Women in Post War Districts') (ජූලි 2018) යනු මුස්ලිම් කාන්තාවන් අතර ලිංගික අල්ලස් සිදුවීම පිළිබඳ සම්මුඛ සාකච්ඡා දහයක් මත පදනම් වූ අධ්‍යයනයකි. මෙම අධ්‍යයනයට සහභාගී වූවන් මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව සහ පුත්තලම යන දිස්ත්‍රික්කවලින් හඳුනා ගත් අය විය. 'ශ්‍රී ලංකාවේ හමුදා නිලධාරීන්ගේ වැන්දඹුවන් හා සම්බන්ධ ලිංගික අල්ලස් සිද්ධීන්' ('Sexual Bribery of Military Widows in Sri Lanka') (ජූලි 2018) යනු අනුරාධපුර, කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්කවල සිද්ධි අධ්‍යයන දහයක් මත පදනම් වූ අධ්‍යයනයකි. CEJ සහ යුක්තිය විසින් රචිත 'ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා නීතිය සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම' ('Amending Law and Policy to Address Sexual Bribery in Sri Lanka') (අගෝස්තු 2020) වාර්තාව තුළින් ලිංගික අල්ලස නිශ්චිතව අපරාධ වරදක් ලෙස නම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.[35] මෙම අධ්‍යයනයන් හි සොයාගැනීම් ලිංගික අල්ලස් සිදුවීමට දායක වන සාධක, පුද්ගලයන් ලිංගික අල්ලස්වලට ගොදුරු කරවන සාධක, අපරාධකරුගේ ස්වභාවය මෙන් ම නීතිමය ගැටලු (එහි හරය සහ එය ක්‍රියාත්මක කිරීම යන දෙකම) හා අදාළව වර්තමාන අධ්‍යයනය හරහා ලද සොයාගැනීම් සමඟ අනුයාත වේ.

''ගෝලීය දූෂණ බැරෝමීටරය (2019) ශ්‍රී ලංකාව' (Global Corruption Barometer 2019 Sri Lanka)' යන වාර්තාව විසින් රට තුළ සිදුවන ලිංගික අල්ලස් (sextortion - ලිංගික කප්පම්) පිළිබඳ දළ අවබෝධයක් ලබා දෙයි. මෙම වාර්තාවට අනුව 60%කට වැඩි පිරිසක් ලිංගික අල්ලස් ඉල්ලීම් සම්බන්ධයෙන් සෘජු අත්දැකීම් ඇති හෝ එම අත්දැකීම් ඇති පුද්ගලයන් පිළිබඳව දැන සිටි අය වූහ.[36] ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 46%කට 'ලිංගික කප්පම් ඉල්ලීම් බොහෝ විට, නිතරම හෝ ඉතා නිතර නිතර සිදුවන බව දැනී' තිබිණ.[37] ලිංගික කප්පම් ගැනීම් බහුලව සිදුවන බව ග්‍රාමීය ප්‍රතිචාර

[35] ශ්‍රී ලංකාව තුළ ලිංගික අල්ලස් තුරන් කිරීම: නෛතික සහ ක්‍රියා පටිපාටිමය ප්‍රතිසංස්කරණ II කොටස (සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය, අප්‍රේල් 2022)
[36] 'ගෝලීය දූෂණ බැරෝමීටරය (2019) ශ්‍රී ලංකාව' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2019) 30
[37] 'ගෝලීය දූෂණ බැරෝමීටරය (2019) ශ්‍රී ලංකාව' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2019) 19


දැක්වූවන්ට වඩා නාගරික ප්‍රතිචාර දැක්වූවන් විසින් වටහාගෙන තිබුණි. සැලකිය යුතු කරුණක් නම්, වතු අංශයේ සහභාගීවන්නන් නියැදියෙන් අඩකට හැඟී තිබුණේ 'ලිංගික අල්ලස නිතර හෝ ඉතා නිතර සිදුවන' බවයි.[38] 2014 දී සිදු කරන ලද රාජ්‍ය සේවයට ප්‍රවේශ වීමේදී කාන්තාවන්ගේ අත්දැකීම් පිළිබඳ අධ්‍යයනයකින් හෙළි වූයේ කාන්තාවන්ගෙන් 52.3%ක් පසුගිය මාස හය තුළ අල්ලස් හා දූෂණවලට මුහුණ දී ඇති බවයි. මෙම අධ්‍යයනය කුටුම්භ 501ක් සහ රාජ්‍ය සේවයේ ප්‍රධාන අංශ දහයක් මත පදනම් විය. එහි දී නීති අංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සෞඛ්‍ය අංශය යන අංශවලින් පිළිවෙලින් 58.1%, 30.9% සහ 28% ලෙස දූෂණය වාර්තා විය. මෙම අධ්‍යයනය වාර්තා කරන්නේ වතුකරයේ (65.6%) සහ ගැටුම් පවතින ප්‍රදේශවල (64.8%) කාන්තාවන් අල්ලස් හෝ දූෂණයට ලක් වීමේ වැඩි අවදානමක් ඇති බවයි. නාගරික කාන්තාවන්ට වඩා (38.6%) ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් වැඩි ප්‍රමාණයක් (68.2%) අල්ලසට හා දූෂණයට ලක්වන බව ද තවදුරටත් වාර්තා විය. අවසාන වශයෙන්, පිරිමි ගෘහ මූලික පවුල්වලට (49.6%) වඩා කාන්තා ගෘහ මූලික පවුල් (59.7%) මේ සඳහා ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති බව ද අනාවරණය විය.[39] මෙම අධ්‍යයනය හරහා අල්ලසක් ලෙස ගෙවන ලද සාමාන්‍ය මුදල ශ්‍රී ලංකා රු. 1429.00 ලෙස ගණනය කරන ලදී.

## 3.3. වත්මන් දැනුමෙහි පවතින පරතරයන්

CEJ විසින් ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු කර ඇති ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනයන් හරහා උතුරු පළාතේ යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාව, මුස්ලිම් සුළුතර ප්‍රජාවන් සහ හමුදා වැන්දඹුවන් වැනි නිශ්චිත ප්‍රජාවන් කෙරෙහි අවධානය යොමු කරයි. වෙනත් සංවිධාන විසින් සිදු කර ඇති අධ්‍යයනයන් තුළින් පොදුවේ රාජ්‍ය අංශයේ අල්ලස් හා දූෂණ විමර්ශනය කර ඇත. මේ දක්වා සිදු කර ඇති මෙවන් ආකාරයේ අධ්‍යයනයන් හරහා නිශ්චිත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු වී නොමැත. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ කලාප කිහිපයක් තුළ තවමත් ලිංගික අල්ලසෙහි ස්වභාවය සහ සිදුවීම්/ව්‍යාප්තිය අධ්‍යයනය කිරීම සිදු කර නොමැත. වර්තමාන අධ්‍යයනය සැලසුම් කර ඇත්තේ මෙ ආකාරයෙන් දැනට පවතින දැනුමෙහි පවතින පරතරය ආමන්ත්‍රණය කිරීම සඳහා ය. මෙමඟින් විශේෂයෙන් යුක්තිය සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරන අතර පළාත් කිහිපයක කාන්තාවන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින්ගේ අත්දැකීම් විමර්ශනය කරයි.



[38] 'ගෝලීය දූෂණ බැරෝමීටරය (2019) ශ්‍රී ලංකාව' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2019) 19
[39] 'රාජ්‍ය සේවයේ දූෂණය පිළිබඳ කාන්තා අත්දැකීම්' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකාව, 2014 ජූනි) 42



# 4. දත්ත එක් රැස් කිරීමේ ක්‍රමවේදය

## 4.1. ගුණාත්මක අධ්‍යයනයක් සඳහා තාර්කිකත්වය

මෙම අධ්‍යයනය සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණය යන පුළුල් ගැටලුව පිළිබඳ අධ්‍යයනය මුල් අවධියක පවතින සන්දර්භයක් තුළ ය.[40] මෙම පසුබිම යටතේ ලිංගික අල්ලස ගැන පවතින්නේ වඩාත් අඩු දැනුමකි. එපමණක් නොව, ලිංගික අල්ලස් යනු අපරාධකාරී ක්‍රියාවක් වන අතර එය විශේෂයෙන් ම දිවි ගලවා ගත් අය සඳහා අපකීර්තිය හා අනෙකුත් බරපතල ප්‍රතිවිපාක ගෙන දෙයි. එබැවින්, CEJ විසින් සිය අධ්‍යයනය සඳහා ගුණාත්මක ප්‍රවේශයක් ගැනීම තෝරා ගන්නා ලදී. ගුණාත්මක ප්‍රවේශයක් හරහා ලිංගික අල්ලස සහ එය සිදුවීම පිළිබඳ පුද්ගලික අත්දැකීම් ගැඹුරින් පරීක්ෂා කිරීමට ඉඩ සලසයි.

## 4.2. ක්‍රමවේදය

මෙය ගවේෂණාත්මක අධ්‍යයනයක් වූ අතර ලිංගික අල්ලස් සිදුවීම/ව්‍යාප්තිය සහ එය සිදුවීමට දායක වන සාධක පරීක්ෂා කිරීම මෙහි අරමුණ විය. අධ්‍යයනය මගින් ගුණාත්මක දත්ත හරහා සහ අධ්‍යයනයට සහභාගිවන්නන්ගේ දෘෂ්ටිකෝණයන් හරහා එකතු කරන ලද දත්ත භාවිතයෙන් ලිංගික අල්ලස්වල ස්වභාවය, එය සිදුවීම/ව්‍යාප්තිය සහ එහි බලපෑම අර්ථකථනය කරන ලදී. එයට සංරචක තුනක් ඇතුළත් විය: ලිංගික අල්ලස්වලින් දිවි ගලවා ගත් අය ලෙස තමන්ව හඳුනා ගන්නා (ස්වයං-හඳුනා ගැනීම සිදු කරන) පුද්ගලයින් සමඟ සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා; කාන්තාවන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයින් සමඟ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGD); සහ යුක්තිය සහ සෞඛ්‍ය අංශවල ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා. සමාන අදහස් ඇති සිවිල් සමාජ සංවිධාන සහ පුද්ගලයන් හරහා සවිස්තරාත්මක සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගිවන්නන් හඳුනා ගැනීමට CEJ විසින් ස්නෝ-බෝලින්ග් (snow-balling) ක්‍රමය භාවිත කරන ලදී.

## 4.3. අධ්‍යයන සැලැස්ම

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කරන ලද්දේ ලිංගික අල්ලසෙන් දිවි ගලවා ගත් අය ලෙස ස්වයං-හඳුනාගත් පුද්ගලයන් සමඟ සිදු කරන ලද සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සිදු කරන ලද සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා හරහා ය. විෂය කරුණුවල සංවේදී ස්වභාවය සැලකිල්ලට ගෙන, දත්ත රැස්කිරීමේ සාර්ථකත්වය සඳහා ප්‍රතිචාර දක්වන්නන් සමඟ සමීප සම්බන්ධතාවයක් ඇති කර ගැනීම අත්‍යවශ්‍ය විය.

CEJ විසින් මීට පෙර යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන්හි ලිංගික අල්ලස් පිළිබඳව අධ්‍යයනයන් සිදු කර ඇත. මෙම අධ්‍යයනයන් උතුරු, නැගෙනහිර, උතුරු මැද, දකුණ සහ වයඹ පළාත්වල සිදු කරන ලදී. එබැවින්, මෙම අධ්‍යයනය විසින් මෙම පළාත් (දකුණු පළාත හැර) බැහැර කර ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රජාවන් අතර ලිංගික අල්ලස් සිදුවීම, එහි බලපෑම සහ ස්වභාවය අධ්‍යයනය කරන ලදී. අනෙකුත් ප්‍රාදේශීය සංවිධාන සමඟ CEJ හි ආයතනික හවුල්කාරිත්වය සහ මෙම හවුල්කාරිත්වයන් හරහා ලිංගික අල්ලස්වලට ගොදුරුවූවන් සෙවීමේ හැකියාව මෙන් ම ව්‍යාපෘතියේ මූල්‍ය සීමාවන් සැලකිල්ලට ගනිමින්, සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගිවන්නන් 30ක් දක්වා ඇතුළත් කර ගැනීම සහ පළාතකට 1ක් බැගින් වන සේ ඉලක්කගත කණ්ඩායම් (සහභාගීවන්නන් 5-10 බැගින්) සාකච්ඡා පැවැත්වීම අධ්‍යයනයේ අරමුණ විය. එක් එක් අංශයෙන් ප්‍රධාන තොරතුරු සපයන්නන් 6 දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කරන ලද අතර එබැවින් අධ්‍යයනය සම්මුඛ සාකච්ඡා 12 කින් සමන්විත විය. අංශ දෙක සඳහා පිළිවෙලින් කලාපීය සහ ජාතික මට්ටමින් තිදෙනා බැගින් සහභාගී කරවා ගන්නා ලදී.

[40] ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ අල්ලස් හා දූෂණ අධීක්ෂණය කරයි. සමාජ-ආර්ථික සහ සංස්කෘතික සාධක ඇතුළු දායකත්වය සපයන සාධක පිළිබඳ අධ්‍යයනයන් දුර්ලභ ය. අල්ලස හා දූෂණයට විසඳුම් සෙවීමට ආයතන අසමත් වීමට හේතු පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි සපයන අධ්‍යයනයන් නොමැත.

තම දැනුවත් කැමැත්ත ඇතිව, දේශීය හවුල්කාර සිවිල් සමාජ සංවිධාන සහ විශ්වාසදායක ජාල හෝ සමාන අදහස් ඇති කණ්ඩායම් හෝ පුද්ගලයින් හරහා ඉලක්කගත් කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගී වීමට අදාළ සහභාගීවන්නන්ට ආරාධනා කරන ලදී. කණ්ඩායම් සාකච්ඡාවේ අරමුණ වූයේ ලිංගික අල්ලස් පිළිබඳ අදහස් / අවබෝධයන්, එය සිදුවීම පිළිබඳ අදහස්/අවබෝධයන් හඳුනා ගැනීම සහ ලිංගික අල්ලස් වැළැක්වීම සඳහා නිර්දේශ රැස් කිරීම ය. ග්‍රාමීය, නාගරික සහ වතු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී.

සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා සඳහා යුක්තිය සහ සෞඛ්‍ය අංශවල ප්‍රධාන තොරතුරු සපයන්නන් වෙත ප්‍රවේශ වන ලදී. මෙම සම්මුඛ සාකච්ඡාවල අරමුණු වූයේ ලිංගික අල්ලස් සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් අවබෝධ කර ගැනීම; ලිංගික අල්ලස් සිදුවීම වැළැක්වීම සඳහා පවතින වත්මන් නීතිමය සහ ප්‍රතිපත්ති රාමුව පිළිබඳ අදහස් සහ ඒවා ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ අදහස් අවබෝධ කර ගැනීම; අදාළ නීති සහ ප්‍රතිපත්තිවල හිඩැස්/පරතරයන් සහ දුර්වලතා පිළිබඳ අදහස් හඳුනා ගැනීම; සහ ප්‍රතිසංස්කරණ සඳහා ඔවුන්ගේ නිර්දේශ හඳුනා ගැනීම විය. අදාළ බලධාරීන්ගේ අනුමැතිය සහ ඔවුන්ගේ දැනුවත් කැමැත්තට යටත්ව, පිළිවෙලින් යුක්තිය සහ සෞඛ්‍ය අංශ යටතේ ලැයිස්තුගත කර ඇති ආයතනවලින් ප්‍රධාන තොරතුරු සපයන්නන් සම්බන්ධ කර ගන්නා ලදී. ඔවුන් වෙත ළඟා වීමට ඇති ඉඩකඩ සහ ඔවුන්ට මේ සඳහා ලබා දිය හැකි ඉඩ මත පදනම් ව ඔවුන් වෙත ප්‍රවේශ වීම සිදු කරන ලදී. අධ්‍යයනයේ අරමුණ වූයේ සෑම අංශයක ම ප්‍රධාන තොරතුරු සපයන්නන් (මුළු සංඛ්‍යාව 12) සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම වන අතර එහි දී පළාත් මට්ටමින් තිදෙනෙකු බැගින් සහ මධ්‍යම රජය මට්ටමින් තිදෙනෙකු බැගින් සහභාගී කරවා ගැනීම සුදුසු යැයි තීරණය කෙරිණි. මෙම සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී, CEJ විසින් පුද්ගලයන් 19 දෙනෙකු සමඟ සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා ද, නාභිගත කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා 12ක් ද සාර්ථකව පවත්වන ලදී.

## 4.4. සීමාවන්

ලිංගික අල්ලස් වැනි අභියෝගාත්මක මාතෘකාවක් පිළිබඳ ගවේෂණාත්මක සහ ගුණාත්මක අධ්‍යයනයක දී සීමාවන් කිහිපයක් අදාළ වනු ඇත. මෙහි දී සහභාගිවන්නන් තොරතුරු සැඟවීම, වෙනස් කිරීම හෝ අතිශයෝක්තියකින් යුතුව තොරතුරු ලබා දීම සිදු විය හැක. කෙසේ වෙතත්, මෙම අධ්‍යයනය ලිංගික අල්ලසින් දිවි ගලවා ගත් අයගේ දෘෂ්ටිකෝණයන් සහ අත්දැකීම් ඉදිරිපත් කරයි. මෙම අධ්‍යයනය තුළින් පොදුවේ ගත් කළ ලිංගික අල්ලස් සිදුවීම/එහි ව්‍යාප්තිය සහ ස්වභාවය විස්තර කිරීමටත්, දිවි ගලවා ගත් අයගේ දෘෂ්ටිකෝණයන් හරහා ලිංගික අල්ලසට දායක වන බව පෙනෙන සාධක හඳුනා ගැනීමටත් අපේක්ෂා කෙරේ. දිවි ගලවා ගත් පුද්ගලයන්ගේ සම්මුඛ සාකච්ඡා සඳහා නියැදි තේරීමේ දී හැකිතාක් සියලු දෙනා නියෝජනය වන පරිදි සිදු කිරීමට සහ විශ්වාසය ගොඩනඟා ගැනීම සහ තොරතුරුවල රහස්‍යභාවය සහතික කිරීම තුළින් ප්‍රතිචාර දැක්වූවන් සමඟ හොඳ සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලදී.

මෙම අධ්‍යයනයේ සැලකිය යුතු සීමාවක් නම්, දෙමළ කතා කරන සහභාගිවන්නන් අධ්‍යයනයට සහභාගී කරවා ගැනීමට CEJ විසින් කිහිප වතාවක් ම උත්සාහ කළ ද, එවන් කිසිවකු වෙත ඔවුන්ට ළඟා වීමට නොහැකි වීමයි. අයවැය සීමාවන් තුළ කටයුතු කිරීමට ද CEJ හට සිදු වූ බව ද සඳහන් කළ යුතු ය. ඉලක්කගත නියැදියේ සහභාගීවන්නන් ප්‍රමාණය ඒ අනුව සකස් කළ යුතු විය.

## 4.5. අධ්‍යයනය ක්‍රියාත්මක කිරීම

සම්මුඛ සාකච්ඡාව පවත්වන පුද්ගලයින්ට සංවේදී මාතෘකා හා අදාළ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම පිළිබඳ මඟ පෙන්වීම ලබා දෙන ලදී. සහභාගීවන්නන්ගේ දැනුවත් කැමැත්ත ලබා ගැනීම සහ දත්ත එක්රැස් කිරීමේ දී අනුගමනය කළ යුතු සාමාන්‍ය පර්යේෂණ ආචාර ධර්ම සම්බන්ධයෙන් ද ඔවුන්ට මඟ පෙන්වනු ලැබීය. වසංගතය අතරතුර පනවා ඇති සංචරණ සීමාවන් හේතුවෙන්, මෙම මාර්ගෝපදේශයන් දුරස්ථව ලබා දෙන ලදී. සැපයෙනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මාර්ගෝපදේශයකට අනුකූලව සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.[41] මෙම අධ්‍යයනයේ

[41] සම්මුඛ සාකච්ඡා මාර්ගෝපදේශය සඳහා ඇමුණුම I බලන්න.

සියලු ම පුද්ගලයන් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය සමඟ රහස්‍යභාවය පිළිබඳ ගිවිසුම්වලට එලඹෙන ලදී..

සිදු කරන ලද සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා, ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවල නිසි සංඛ්‍යාවන් 1වන වගුවෙහි දක්වා ඇත. සහභාගිවන්නන්ගේ දැනුවත් කැමැත්ත CEJ විසින් ලේඛනගත කර ඇත. සම්මුඛ සාකච්ඡාවල පිටපත් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇති අතර සහභාගීවන්නන්ගේ සියළු හඳුනා ගැනීමේ තොරතුරු ඒවායින් ඉවත් කරන ලදී. සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගීවූවන් පිළිබඳ සවිස්තරාත්මක සහ නිර්නාමික විස්තරය සඳහා කරුණාකර ඇමුණුම III බලන්න. සහභාගිවන්නන් පිළිබඳව මෙම වාර්තාව තුළ සඳහන් කිරීමේ දී අන්වර්ථ නාම භාවිත කර ඇත.





# 5. ලිංගික අල්ලස සිදුවීම/ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන ප්‍රතිඵල

ගුණාත්මක දත්ත හරහා රැස්කරගත් අවබෝධයන් මෙම කොටස තුළින් සාකච්ඡා කර විශ්ලේෂණය කෙරේ. මෙම අවබෝධයන් එකිනෙකට සම්බන්ධ වන අතර අතිච්ඡාදනය වේ. සමාජ, ආර්ථික සහ දේශපාලනික යථාර්ථයන්ගේ අන්තර් ඡේදනය ලිංගික අල්ලස්වල අයහපත් ප්‍රතිවිපාක තවදුරටත් උග්‍ර කරන බව මෙම අවබෝධයන්ගෙන් පැහැදිලි වේ. හඳුනා ගැනීම සහ විශ්ලේෂණය අරබයා මෙම අවබෝධයන් වෙන ම මාතෘකා යටතේ සාකච්ඡා කෙරෙනු ලැබේ.

## 5.1. පුද්ගලික බලපෑම

දිවි ගලවා ගත් අය කෙරෙහි ඇති ගැඹුරු පුද්ගලික බලපෑම සහභාගිවන්නන් විසින් පුළුල් පරාසයකින් යුත් ආකාර භාවිතයෙන් විස්තර කරන ලදී. ලිංගික අල්ලස් පිළිබඳ අත්දැකීම් දිවි ගලවා ගත් අයට මානසිකව සහ මූල්‍යමය වශයෙන් බලපෑවේය. එය ජීවනෝපාය, සමාජ අන්තර්ක්‍රියා සහ ජීවන තත්ත්වය සඳහා වූ අනාගත අපේක්ෂාවන් ඇතුළු අංශ කිහිපයකින් ඔවුන්ගේ අනාගතයට ද බලපෑවේය.

### 5.1.1. මනෝවිද්‍යාත්මක බලපෑම

සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට අනුව, ලිංගික අල්ලස් පුද්ගලයෙකුගේ අභිමානය පිළිබඳ හැඟීම මත දැඩි ව බලපායි. සමහර සිද්ධි අධ්‍යයනයන්හි දී, සහභාගීවන්නන්ගේ අත්දැකීම වූයේ ලිංගික අල්ලස් ඉල්ලා ඇති නමුත් එය ක්‍රියාවට නංවා නොතිබූ අවස්ථාවන් ය. එවැනි අවස්ථාවන්හි දී පවා, බිය, ආතතිය සහ කාංසාව වැනි හැඟීම් හේතුවෙන් ඔවුන්ට මෙම අත්දැකීම මනෝවිද්‍යාත්මකව බලපෑ ආකාරය ගැන ඔවුන් පවසයි. මෙසේ අත්විඳින ලද කම්පනය, දිවි ගලවා ගත් අය තුළ දිගු කලක් පවතින බව පෙනේ.

“මට ලොකු පීඩනයක් වුණා. මගෙ ජීවිතේ මොකක්ද කියල මට හිතුණා. “මාව ඉපදෙන්න එපා ආයෙ” කියල මට හිතුණා.”

රමණී, අඹතැන්න, මධ්‍යම පළාත

“මම බය වුණා. මට තර්ජනයත් කරල තිබුණ නිසා. දෙන්නම හෙද සේවයේ නිසා ඒ දෙන්න රණ්ඩු කර ගනියි කියලත් මම බය වුණා. තරහට අර මිනිහ මගෙන් පළිගනියි කියලයි මම ගොඩක් බය වුණේ.”

“මට ඇත්තටම කළකිරුණා. මහත්තයට මෙහෙම දෙයක් වෙලා තියෙද්දී මගෙන් ප්‍රයෝජන ගන්න හදනව කියලා”

“මේ සිද්ධියෙන් පස්සෙ මම හරි බය වුණා, කෙනෙක් එක්ක (පිරිමි කෙනෙක් එක්ක) වැඩිය කතා කරන්න, මූණක් බලලවත් කතා කරන්න. රජයේ නිලධාරියෙක් එක්කවත් ප්‍රශ්නෙ කියන්න බය වුණා.”

සීතා, හැටන්, මධ්‍යම පළාත

ඔවුන්ගේ අත්දැකීම් රහසක් ලෙස තබා ගැනීමට සිදුවීම හේතුවෙන් ඔවුන් කනස්සල්ලට පත්වන ආකාරය දිවි ගලවා ගත් අය විසින් විස්තර කරයි. සිද්ධිය පිළිබඳව දැඩි ලැජ්ජාවක් සහ පිළිකුලක් ද දැනෙන බව ඔවුන් සඳහන් කරයි.

‘

මට ලැජ්ජ හිතුණා ගෙදර හැමෝම දැනගත්තට පස්සෙ. මං දිහා ඒ අය වරදකාරියෙක් වගේ බලයි කියලා. මගෙ අම්මා (නැන්දම්මා) සැක කරන බව මට දැනුණා. මහත්තයා මං දිහා බැලුවෙ මං වරදක් කළා වගේ. “ආයෙ ඔය වගේ වැඩ කරන්න එපා, මම අම්මලට (ඇගේ මවට) කතා කරල කියනවා” කියල මට කිව්වා. මම එහෙම කතා කෙරුව එක වැරදියි කියල කියනවා ඒ ගොල්ලො. මම කිව්වා මම කතා කරන්න ගියෙ නෑ මැසේජ් කළා විතරයි. රෑට නිතරම වීඩියෝ කෝල්ස් ගන්නවා, ඒව ආන්සර් කළේ නැත්නම් බනිනව කියල මම කිව්වා. හම්බවෙන්න එන්න කියන්න තරම් කතාව දුර දිග ගියෙ මං කතා කෙරුව නිසා කියලයි මට ඒ ගොල්ලො කිව්වෙ. ඒ මනුස්සයත් එක්ක කතා කරපු එක වැරදියිලු මම. මම එහෙම කතා කළේ නෑ මිස්. ඒ වුණාට ඒ කට්ටිය එහෙම හිතන්නෙ නෑ.. ’

රාණි, මාතලේ, මධ්‍යම පළාත

‘

පීඩාව හහ්...පීඩාව ගැන අහන්නත් දෙයක්ද මිස්......අබිබගාත හරි ආබාධිත හරි මම ආත්මගරුත්වයක් ඇතුව ජීවත්වුනා ලස්සනට . එහෙම ජීවත් වුන ගෑණියෙක් මම රස්සාවත් කරන්. ඒ මිනිහා එක්ක ලගින්න වුන එකම මදිද? මං කරේ වරදක් වෙන්නැති. නමුත් පලවෙනිපාර බලහත්කාරෙන් කරද්දි මට බේරෙන්න බැරිවුණා මිස්. ඒ මිනිහගේ අත් අස්සෙ මං වගේ බැරි ගෑණියෙක් කොහොමද දඟලලා බේරෙන්නෙ ’

ඉරෝමි, මාතර, දකුණු පළාත

මනෝරි අත්විඳි දරුණු කම්පනය සහ අපකීර්තිය විසින් සියදිවි නසා ගැනීමට පවා සිතන තත්ත්වයට ඇයව ගෙන ඒමට සමත් විය.

‘

මම මානසිකව උපරිමයෙන්ම වැටුණා. මොකද මම වැරැද්දක් කරල නෑ. මම කවදාවත් ඇඟ පේන්න ඇඳුමක්වත් අඳින කෙනෙක් නෙවෙයි. සිද්ධියෙන් පස්සෙ මට නින්ද යන්නෙ නෑ. මට කල්පනාව නැති වෙනවා. නිතර අමතක වෙන්න පටන් ගත්තා. ඒ කියන්නෙ මගෙ අතේ මොකක් හරි දෙයක් තියෙනව නම් මම ඒක අතේ තියාගෙන හැමතැනම හොයනවා. රෑට මම අඬනවා. ඇයි මටම මෙහෙම වෙන්නෙ කලිනුත් මේ වගේ කරදර මට වුණා කියලා. මට කලිනුත් වෙච්ච සිද්ධි මතක් වෙනවා. එදා ඉඳල මේ වෙනකල්ම සිද්ධි මතක් වෙනවා. (වැළපෙයි)

මම මේ සිද්ධියෙන් පස්සෙ, හිතේ කැකෑරිච්ච ඉස්සර සිද්ධිත් එක්ක ජීවිතේ නැති කරගන්න එක ගැන පවා හිතල තියෙනවා. (වැළපෙයි) ’

මනෝරි, නුවර, මධ්‍යම පළාත

එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමහර දිවි ගලවා ගත් පුද්ගලයන් ලිංගික අල්ලස් සඳහා වෙනත් අය තමා වෙත ප්‍රවේශ වීම හෝ ලිංගික අල්ලස් ඉල්ලීමට යටත් වීමට සිදු වීම ගැන තමන්ට ම දොස් පවරා ගනිති. දිවි ගලවා ගත් එක් අයෙක් ලිංගික අල්ලස් සඳහා වෙනත් කෙනෙකු තමා වෙත ප්‍රවේශ වීම ගැන කනගාටුව සහ පුදුමය පළ කළේය.

‘

කාමරයක් වෙන් කරලා කිව්වා.ඇත්ත වෙන්නැති සමහරවිට. ඒ සිද්ධිය නිසා මාව ගොඩාාක්ම අවුල් වුනා. මම හොස්ටල් නම් කොහොමත් ගියෙ නැහැ.හොස්ටල්

> **නෙවෙයි ඒ වෙලාව හරිම දුකක් දැනුනා ඇත්තටම හිතට. මම ඕනවට වඩා හිතන කෙනෙක් කොහොමත්. ඒ මිනිස්සුන්ට ලැජ්ජාවක් නැතුව තව කෙනෙක්ට එහෙම request එකක් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නෙ මට තිබුනෙ. මට සැකයි කලිනුත් මෙහෙම දෙවල් කරපු කෙනෙක්ද දන්නෙත් නැහැ.** ’
>
> ප්‍රියා, හම්බන්තොට, දකුණු පළාත

> ‘ **මම නුසුදුසු ඇඳුම් ඇඳගෙන සිටියේවත් ඔහුගේ හැගීම් අවුස්සන ආකාරයෙන් හැසිරුණේවත් නැහැ.** ’
>
> රූපා, රත්නපුර, සබරගමුව පළාත

දිවි ගලවා ගත් අයගෙන් එක් අයෙකුට, ලිංගික අල්ලසට මුහුණ දීම පිළිබඳ වූ ඇගේ අත්දැකීම විසින් ඇය මීට පෙර අත්විඳි හා සිතේ තැන්පත් ව තිබූ ලිංගික අපයෝජනයක් හා සම්බන්ධ අත්දැකීම් පිළිබඳ ක්ෂතිය නැවත මතු කරවන ලදී.

> ‘ **මට මීට කලිනුත් ගොඩක් කරදර වෙලා තියෙනවා මගෙ නෑදෑයින්ගෙනුත්.. විවිධ බලහත්කාරකම් වෙලා තියෙනවා. මම අනූ නවයෙන් බේරිච්ච අවස්ථා තියෙනවා. මම මගෙ සැමියත් එක්ක යාළු වෙලා, ගෙදරින් පැනල ගියාට පස්සෙ තමයි ඒ කරදර නැති වුණේ. ඒ අතරෙදී මෙහෙම දෙයක් වුණාම මට ඒක හරියට බලපෑවා. මට කලින් වෙච්ච සිද්ධි ඔක්කොම හිතේ හොල්මන් කරන්න පටන් ගත්තා.** ’
>
> මනෝරි, නුවර, මධ්‍යම පළාත

වින්දිතයන්ගෙන් දිවි ගලවා ගත් එක් අයෙක් ප්‍රබල ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය. ඇයට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව ඇය කරුණු ලෙස වටහා ගෙන තිබූ අතර කිසිදු ඍණාත්මක බලපෑමකින් තොරව මෙම සිදුවීම පසුකර දැමීමට හැකි වූ බවක් පෙනෙන්නට තිබුණි.

> ‘ **මානසික වෙන්නෙ මොකටද? පිස්සුනෙ ඕවට මොකටද මානසික වෙන්නෙ...ඕවත් ප්‍රශ්නද අප්පා....ටික කාලයක් යනකොට මේවා ගණන්ගන්න දෙයක් නෑ..අමතක කරලා දැම්මම ඉවරයි.**
>
> **මේව ප්‍රශ්න නෙවෙයි මහලොකු ඉතිං. හිතට ගන්න හොඳ නෑ ප්‍රශ්න අපි. කිසිකෙනෙක්ට කියන්න තරම්වත් උවමනාවක් උනේ නෑනෙ ....තනියම මුණ දුන්නෙ.** ’
>
> ජේයා, ගාල්ල, දකුණු පළාත

ඊට හාත්පසින් ම වෙනස්ව, බොහෝ දිවි ගලවා ගත් අය ලිංගික අල්ලස් අත්දැකීම හා සම්බන්ධ අපකීර්තිය ගැන කතා කරති. මෙම අපකීර්තිය පුද්ගලික වන අතර එය දිවි ගලවා ගත් පුද්ගලයන් තුළ තමන් පිළිබඳව ම පවතින අදහස් කෙරෙහි බලපායි. අපකීර්තිය බාහිරව ද බලපාන අතර දිවි ගලවා ගත් අයගේ න්‍යෂ්ටික සහ විස්තෘත පවුලට ද බලපායි. සිද්ධිය පිළිබඳ කටකතා හේතුවෙන් ගමේ සාමාජිකයන් විසින් තමන් කොන් කරනු ලැබූ බව ග්‍රාමීය ප්‍රජාවන් හි ජීවත්වන දිවි ගලවා ගත් පුද්ගලයන් විසින් විස්තර කරන ලදී.

> ‘ **මම ඒක කාටවත් කියලා නැති නිසා මට කිසිම අපකීර්තියක් දැනිලා නැහැ.** ’
>
> රූපා, රත්නපුර, සබරගමුව පළාත

“ මම මේක වෙන කාටවත් කිව්වේ නැත්තේ මට ලැජ්ජාවක් දැනුණ නිසායි. මම මගේ රැකියාව ගැන බියෙන් සිටි නිසා මම පොලිසියට පැමිණිලි කළේ නෑ. පොලිසියට ගියොත් මට ආයෙත් වින්දිතයෙක් වෙන්න වෙයි කියලා මම බය වුණා. ඒ නිසා මම පැමිණිලි කළේ නැහැ. ”

රූපා, රත්නපුර, සබරගමුව පළාත

“ එහෙම කියන්න හේතුව තමයි මං කඩේ ළඟදි දැක්කත් වෙනදා කතාකරපු මිනිස්සු කතානොකරන්න ගත්තා.

ඒ වගේ ඉතිං ප්‍රසිද්ධියේ නම් මේවා අල්ලන එක හීනයක් තමයි. මේවා කවුද කිය කිය ඇව්දින්නෙ.අනික එහෙ ආරංචි වෙන්නෙත් උන දේ නෙවෙයිනේ.ලැජ්ජාවට කාටවත් කියන්නෙ නෑ ගෑණු කට්ටියනම්. ”

ලක්ෂ්මි, හම්බන්තොට, දකුණු පළාත

“ වෙලාවකට මට මං ගැනම ලැජ්ජයි මිස්. අම්මපා මගෙත් වරද. මං මොකටද මහ රෑ එක දෙක වෙනකං එහෙම ඇඳුරැම්කමක් නැති එවුන් එක්ක කතාකරේ. මගේ හිත මට වද දෙනවා මගෙනුත් දශමෙකහරි උදව්වක් තිබුණ නිසා තමයි ඌ එහෙම ඇහුවෙ බයක් සැකක් නැතුව. ”

ගයනි, හම්බන්තොට, දකුණු පළාත

## 5.1.2. ආර්ථික බලපෑම

ලිංගික අල්ලස් පිළිබඳ අත්දැකීම් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ බොහෝ දෙනා හට යම් ආකාරයක ආර්ථික පාඩුවක් ඇති කළේ ය. එය ඔවුන් මූල්‍යමය වශයෙන් යමක් ලබා ගැනීම සඳහා භාවිත කිරීමට අපේක්ෂා කළ යම් ක්‍රියාවලියක් අත්හැරීමට මූලික විය. රමණිගේ සිද්ධියේ දී, ඇයගේ මියගිය සැමියාට අයත් ඉඩමකට හිමිකම් කීම සඳහා වූ නඩු විභාගය අත්හැරීමට ඇයට සිදු වූයේ ඇය උපදෙස් ලබා ගත් නීතිඥවරයා ලිංගික අල්ලසක් ඉල්ලා සිටි බැවිනි.

“ මම ඉඩමෙ ප්‍රශ්නෙත් පැත්තකට දැම්මා. මගෙ වැඩේ කරගන්න ඕනෙ නිසයි මම සතියක් දෙකක් හරි ඉවසුවෙ. ”

රමණි, නුවර, මධ්‍යම පළාත

ජෙනී, රීටා සහ වත්සලා වැනි ලිංගික ශ්‍රමිකයන් ගත් කළ, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ ඔවුන්ගේ ජීවනෝපාය යන දෙකෙහි එකතුව ඔවුන්ව ලිංගික අල්ලස් සඳහා ඉලක්කයන් වීමේ අවදානමට ලක් කරවීය. ලිංගික අල්ලස්වලට ලක් වූ විට, ඔවුන් අත්විඳින ප්‍රචණ්ඩත්වයට හා කම්පනයට අමතරව, එම කාලය අතරතුර දී, ඔවුන්ට ජීවත් වීමට සහ තමන් කැමති ජීවනෝපායක් කිරීමට ඇති අවස්ථාවද අහිමි වේ.

ජෙයාගේ සිද්ධියේ දී (ගාල්ල, දකුණු පළාත), විදේශ රැකියාවකට යාමට පෙර ඇයගේ ප්‍රතිලාභ වාර්තාව සම්පූර්ණ කිරීමට පොලිසියෙන් ලියකියවිලි අවශ්‍ය වූ නිසා ඇය ලිංගික අල්ලස් සඳහා ඉලක්කයක් කර ගැණින. මෙම අධ්‍යයනයට සහභාගී වූ දිවි ගලවා ගත් අය අතර ජෙයා සුවිශේෂී වන්නේ ඇය තම ස්වාධීනත්වය භාවිත කොට ලිංගික අල්ලස් සඳහා වන ඉල්ලීමට ප්‍රතිරෝධය දැක්වීම හේතුවෙනි. කෙසේ වුවද, ඇයගේ ආර්ථික අවශ්‍යතාවය නිසා ඇය ලිංගික අල්ලස් ගැනීමේ අවදානමට ලක් විය.

ඉරෝමිගේ සිද්ධියේ දී, ස්ථාන මාරුවකට එරෙහිව අභියාචනා කිරීමට අවශ්‍ය වූ විට ඇයගෙන් ලිංගික අනුග්‍රහයන් ඉල්ලා තිබිණි. ඉරෝමි ශාරීරික දුබලතා ඇති කාන්තාවක් වන අතර ස්ථාන මාරුවක් යනු

ඇයට සැලකිය යුතු පෞද්ගලික සහ මූල්‍ය දුෂ්කරතා ඇති කරවන්නක් විය. මේ හේතුවෙන් ඇය ඉහළ බලධාරීන් වෙත ප්‍රවේශ වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇය ලිංගික අල්ලසට ගොදුරු විය.

## 5.1.3. ආරක්ෂාව මත බලපෑම

ලිංගික අල්ලසක් ඉල්ලා සිටි රාජ්‍ය නිලධාරියා විසින් සිදු කළ තර්ජනයන්ට තමන් ලක් වූ බව ඇතැම් දිවි ගලවා ගත් පුද්ගලයන් වාර්තා කළහ. නිදසුනක් වශයෙන්, සීතා, ලිංගික අල්ලසක් ලබා දීම ප්‍රතික්ෂේප කළ විට, පිරිමි හෙද නිලධාරියා ඇය සමඟ කෝපයට පත් වූ අතර, ඇගේ සැමියාට සහ ඥාතීන්ට අනියම් සම්බන්ධයක් පවතින බවට බොරු පවසනවා යැයි තර්ජනය කළ බව සඳහන් කළා ය. බොහෝ දිවි ගලවා ගත් පුද්ගලයන් සඳහන් කළේ බිය නිසා හෝ මෙවන් සිදු වීමක් නැවත ඇති වේ යැයි පැවති බිය හේතුවෙන් දුෂ්කර තීරණ ගැනීමට ඔවුන්ට සිදු වූ බවයි.

මනෝරි ඇගේ පදිංචිය, දුරකථන අංකය සහ ඇගේ සමාජ මාධ්‍ය භාවිතය ඇතුළුව ඇගේ ජීවිතයේ සැලකිය යුතු සහ ස්ථිර වෙනස්කම් කිහිපයක් ම සිදු කළා ය.

> **‘ මේ සිද්ධියෙන් පස්සෙ අපිට සිම් එක මාරු කරන්න සිද්ධ වුණා. ෆේස්බුක්වලින් අයින් වුණා. පදිංචියත් මාරු කරන්න සිද්ධ වුණා. අපි ඇඩ්‍රස් මාරු කළා. ’**
>
> **මනෝරි, ගම්පොල, මධ්‍යම පළාත**

අපරාධකරුට දුරකථනයෙන් කළ හැකි ලිංගික අල්ලස් ඉල්ලීම් ගැන තම සහකරු සොයා ගනීවි යැයි පවතින අඛණ්ඩ බිය ජීවා විස්තර කළා ය. මේ හේතුවෙන් ඇයගේ දුරකථනය නිතිපතා කිසිදු නාදයක් නොනැගෙන පරිදි (silent mode) තබා ගැනීම පිණිස තම ජීවන රටාව හුරු කර ගැනීමට ජීවාට සිදු විය.

> **‘ මහත්තය ගෙදර ඉන්නනව නම් මම ෆෝන් එක සයිලන්ස් කරල හරි ඕෆ් කරල හරි තියන්න පුරුදු වුණා. නැත්නම් එයා වුනත් හිතනවනෙ මම ගෙදර ඉඳන් මේකද මේ කරන්නෙ කියලා.. ඒ අතින් මම ගොඩක් බය වෙලා හිටියෙ. ’**
>
> **ජීවා, මාතලේ, මධ්‍යම පළාත**

ජීවා සහ ගයනි විසින් පොලිස් නිලධාරියෙකු හෝ බන්ධනාගාර නිලධාරියෙකු දුටු විට එය ලිංගික අල්ලස් පිළිබඳ ඔවුන්ගේ ක්ෂතිය සහ මතකය අළුත් කරවීම හේතුවෙන් ඔවුන් අත්විඳින බිය සහ ක්ෂතිය පිළිබඳ විස්තර කරන ලදී

> **‘ පොලිසියෙ එක්කෙනෙක් දැක්කත් දැන් පාරක්වත් අහන්න බයයි!’ සහ ‘නොදන්නා නම්බර් එකකින් ෆෝන් එක රිං වෙනව දකිද්දි පපුව ගැහෙනවා අදටත්. ’**
>
> **ජීවා, මාතලේ, මධ්‍යම පළාත**

> **‘ ප්‍රතිවිපාකෙයි කියන්නෙ මිස් මට නං ඇතිවුණ එකම ප්‍රතිවිපාකේ එදා ඉඳන් බන්ධනාගාර බස්එක දැක්කත් මට අප්පිරියයි ..මගකදි බන්ධනාගාරෙ හරි පොලිසියෙ හරි එකෙක් දැක්කම මට නිකං සැකයි වගේ හිතෙනවා මිස් හැමෝම. පුදුම වෛරයක් හිතෙන්නෙ.. මට හිතෙන්නෙ උන් හැම එකාම එකයි කියලා. ’**
>
> **ගයනි, හම්බන්තොට, දකුණු පළාත**


මෙම උපුටා දැක්වීම් තුළින් ලිංගික අල්ලස් ඉල්ලීමකින් දිවි ගලවා ගත් අයෙකුට එමඟින් ඇති විය හැකි ගැඹුරු සහ ක්ෂති සහගත බලපෑම හෙළි කරයි. එය ඔවුන්ගේ ජීවිතය පිළිබඳ ඔවුන්ට පවතින දැක්මට, රාජ්‍ය නිලධාරීන් පිළිබඳ ඔවුන්ගේ අවබෝධයට මෙන් ම ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ ඔවුන්ට පවතින අවබෝධයන්ට ද බලපායි.

## 5.1.4. අධ්‍යයනයට සහභාගී වීමේ බලපෑම

බොහෝ සහභාගීවන්නන් සඳහන් කළේ සවිස්තරාත්මක සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම ධනාත්මක අත්දැකීමක් වූ බවයි. ඔවුන් අදහස් දැක්වූයේ එය ඔවුන්ට සිත් හි රඳවා තබා ගෙන සිටි අපහසුකාරී හැඟීම් නිදහස් කිරීමට මහඟු අවස්ථාවක් වූ බවයි. පහත දැක්වෙන නිරීක්ෂණවලින් පෙනී යන පරිදි සිද්ධිය හේතුවෙන් ඔවුන් අත්විඳින ලද අපකීර්තිය සහ කම්පනය මඟින් අදහස් වන්නේ ඔවුන් මෙම අත්දැකීම් රහසක්ව තබා ගත් බව යි. වෙනත් පුද්ගලයෙකු සමඟ ආරක්ෂිත සහ රහසිගත පරිසරයක් තුළ ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට සහ ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන්ට පැවතිණේ ඉතා අඩු අවස්ථා කිහිපයකි.

‘ මේක ඉතාම හොඳයි. දැන් මිස් මාත් එක්ක කතා කරපු එකෙන් මගෙ හිත සැහැල්ලු වුණා. මම මීට කලින් සම්පූර්ණ කතාව කාටවත් කියල නෑ. මට කතා කරන්න කෙනෙක් නැහැනෙ. වෙන කෙනෙකුට කිව්වොත් එයා මං ගැන වැරදියට හිතයි. ’

රමණී, නුවර, මධ්‍යම පළාත



‘ අපේ හිත්වල දේවල් ඇති වෙලා නැති වෙලා පොළොවට පස් වෙලා යන දේවල් තියෙනවා. ’

ලලිතා, මාතලේ, මධ්‍යම පළාත

‘ ගොඩක් සතුටුයි මිස්. මගෙ කතාව හිතේ හිරකරගෙන තිබ්බ කතාවක් ’

රාණි, මාතලේ, මධ්‍යම පළාත

‘ ඇත්තටම මට මේක සෑහෙන සහනයක්. මගෙ හිත නිදහස් වෙනවා.හිතේ හිර කරගෙන ඉද්දි මම මගෙ ජීවිතේ නැති කරගන්න ගිහින් තියෙනවා. මගෙ අම්මට තාත්තට මං කියල නැති දේවලුත් මං මිස් එක්ක කිව්වා. මගෙ හිත නිදහස් වුණා මිස් එක්ක කතා කරද්දි. ඇත්තටම සතුටුයි. ’

මනෝරි, නුවර, මධ්‍යම පළාත

එපමණක් නොව, මෙම නිරීක්ෂණ මගින් ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු සෙවීමේ ක්‍රියාවලියේ දී හෝ පර්යේෂණ පැවැත්වීමේ දී දිවි ගලවා ගත් අය නැවත නැවත කම්පනයට පත් වීම පිළිබඳව ඉතා වැදගත් ප්‍රතිවිරුද්ධ අදහස් ඉදිරිපත් කරයි.

## 5.1.5. සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ සාමාජිකයන්ට ඇති සුවිශේෂී බලපෑම

කාන්තාවන් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අවිනිශ්චිත සහ අන්තර්ලිංගික අනන්‍යතාවයන් සහිත (LGBTQI) ප්‍රජාවේ පුද්ගලයන් මත ලිංගික අල්ලසෙහි දැඩි පුද්ගලික බලපෑමක් පවතී. LGBTQI ප්‍රජාවේ සාමාජිකයින්ගේ සන්දර්භය ගත් කළ, එදිනෙදා ජීවිතයේ දී ඔවුන් අත්විඳින දරුණු අපකීර්තිය සහ සමාජයෙන් බැහැර කිරීම් මෙහි බරපතලකම සංකීර්ණ කරවයි. පහත දක්වා ඇති කියමන්වලින් ඇඟවෙන්නේ පොලිස් නිලධාරීන් ඔවුන්ගෙන් ලිංගික අල්ලස් ඉල්ලා සිටින අවස්ථාවල දී ඔවුන්ගේ කැමැත්ත වැදගත් නොවන බවයි.

> ‘ පොලිසිය වගේ නම් මට බෑ කියන්න බෑ. මම මේ රස්සාව කරන්නෙ ගෑනු කෙනෙකුට ඇඳගෙන. මාව බය කරනවා ඒගොල්ලො. මට ඕනෙ වැඩේ කරල නිදහස් වෙන්න. ’
>
> ‘ මම 6 දෙනෙක් එක්ක එක සැරයක් හිටියා. පැය 3 කටත් වැඩියි. කොරෝනා කාලෙ. ලොක්ඩවුන් කාලෙ. වාහන එක පාරටම ඇරියෙ. 20 වගේ. මමයි මගෙ යාළුවයි හිටියෙ. ’
>
> ‘ මේ ජීවිතේ එපා කියල හිතුණා... පොලිස්කාරයො ඉන්නෙ. ඊට පස්සෙ මට උන්ව හම්බ වුණේ නෑ. හම්බ වෙන්නත් එපා. ’
>
> රීටා, කොළඹ, බස්නාහිර පළාත

LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් පොලිසිය විසින් ලිංගික අල්ලස් ලබා ගැනීමේ අතිශය අවදානමට ලක්ව ඇත්තේ ශ්‍රී ලංකාව තුළ ‘අස්වාභාවික ලිංගික ක්‍රියා’ අපරාධයක් බවට පත් කර ඇති බැවිනි. සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවන්ට අනුව, ලිංගික ශ්‍රමිකයන් ලෙස සේවය කරන සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්ගෙන් ලිංගික වාසි ලබා ගැනීම සඳහා පොලිස් නිලධාරීන් ඔවුන්ගේ අභිමතිය අනිසි ලෙස භාවිත කරයි.

> ‘ ‘එතකොට දැන් එහෙනම් උඹ ගාව මොනවද තියෙන්නෙ අපිට දෙන්න’ කියල ඇහුවා. උසාවි නොදා ඉන්න නම් අපිත් එක්ක හිටපන් - අපිට ෆන් එකක් දීපන් කියල කිව්වා. ’
>
> ‘ මම මේ ඔක්කොම කියන්නෙ තව කෙනෙකුට මේව වෙන්නෙ නැති වෙන්න. ’
>
> ‘ අල්ල ගත්තාම අපේ තියෙන ෆෝන් එක එ ගොල්ලො ඒක උදුර ගන්නවා. ඒ ගොල්ලන්ට හිතුණොත් තමයි උසාවි දාන්නෙ. සමහර වෙලාවට මුදල් ටික ගන්නවා. ක්ලයන්ට් කෙනෙක් එක්ක හිටියත් එයාගෙ මුදල් ටික අරගෙන අපිත් එක්ක ඉන්නවා. එක්කො පහර දෙනවා. දිගින් දිගටම වෙන්නෙ ඒ වගේ දේවල් තමයි. ’
>
> නුස්රත්, බස්නාහිර පළාත

මෙම ප්‍රජාවේ ලිංගික ශ්‍රමිකයින් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ඔවුන්ගේ රැකියාවේ ස්වභාවය හේතුවෙන් විවිධ ආකාරවලින් තවදුරටත් කොන් කරනු ලැබේ. මෙම අධ්‍යයනයේ සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ පුද්ගලයන් සඳහන් කළේ වෙනත් අවස්ථා නොමැතිකම හේතුවෙන් ඔවුන් ලිංගික සේවයේ යෙදෙන බවයි. LGBTQI ප්‍රජාවේ බොහෝ සාමාජිකයින්ට සමාජ ආරක්ෂණය හෝ සමාජ ජාලයන් වෙත ප්‍රවේශය නොපවතීග ඒ මන්දයත් ඔවුන් ඔවුන්ගේ ලිංගික අනන්‍යතාවය

හේතුවෙන් සමාජයෙන් බැහැර කර වෙනස් කොට සැලකීමට ලක් කර ඇති හෙයිනි.

‘ ජීවත් වෙන්න විදිහක් නැති නිසයි මේ ජොබ් එක කරන්නෙ. ජොබ් එකක් තියෙනව නම් මේක කරන්නෙ නෑ. අපේ තියෙන හැම දේමත් අරගෙන, සෙක්සුත් කරලා, සල්ලිත් අරගෙන අපේ බෑගුත් විසි කරල යනවා. ජීවත් වෙන්න විදිහක් තියෙනව නම් මේක කරන්නෙ නෑ. ජීවත් වෙන්න විදිහක් නෑ අපේ සහෝදයො හිටිය නම් අපිව බලයි.. ජීවත් වෙන්න විදිහක් නෑ ’

නුස්රත්, බස්නාහිර පළාත

‘ එතකොට ජොබ් එක ගැන කළකිරුණා. අපිට හරියට ජොබ් එකක් තිබුණ නම් මෙහෙම වෙන්නෙ නැනෙ. මුළු ජීවිතේම එපා වුණා. අපි ඇයි ඉපදුණේ කියල හිතෙනවා. ’

වත්සලා, කොළඹ, බස්නාහිර පළාත

සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ අයගෙන් එක් අයෙක් තමන් ලිංගික අල්ලස්වලට නැවත නැවතත් ගොදුරු වූ බවත්, තමා ජීවත්වන ස්ථානය වෙනස් කිරීමට උත්සාහ කරන බවත්, සිද්ධිය හේතුවෙන් තම ජීවිතය ගැන බියෙන් සිටින බවත් සඳහන් කළේ ය.

‘ මාව අල්ලගන්න ආවා. මම දිව්වා. මේ සිද්ධිවලින් පස්සෙ මට තැන් මාරු කරන්න සිද්ධ වුණා. ’

‘ මම බොහෝ දුරට බය වුණේ මේකට අවනත නොවුණොත් මාව මරල යයි කියලා. ආයෙත් මාව හොයාගෙන එයිද? මාව පාරෙ දැක්කොත් මේ ගොල්ලො මට වෙඩ් තියයිද? නැත්නම් ගෙවල්වලට ගිහිල්ලා මං ගැන කියයිද? ඒ නිසා ඒ අවස්ථාවෙදි මට ලොකු බයක් ඇතිවුණා’ ’


නුස්රත්, බස්නාහිර පළාත

ලිංගික අල්ලස් ඔවුන්ගේ සෞඛ්‍යයට බලපාන ආකාරය පිළිබඳව ද සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් සඳහන් කළහ. මෙහි දී ලිංගික අල්ලස් ඉල්ලීමේ අනපේක්ෂිත ස්වභාවය විසින් සංක්‍රාන්ති ලිංගිකයන් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වැළඳීමේ අවදානමට ගොදුරු කරවයි.

‘ කොණ්ඩම් පාවිච්චි නොකළ නිසා පසුව ලිංගිකාශ්‍රිත රෝග සායනයට ගොස් පරීක්ෂාවක් කරගෙන ඇත. ’

රීටා, කොළඹ, බස්නාහිර පළාත

මෙම සිදුවීම් LGBTQI ප්‍රජාවේ ලිංගික ශ්‍රමිකයින් සඳහා සාමාන්‍ය සිදුවීම් බවට පත් ව ඇත. එපමණක් නොව, ඔවුන් ලිංගික අල්ලස් සඳහා පොලිසිය විසින් කරන ලද නීති විරෝධී ඉල්ලීම්වලට අවනත නොවන්නේ නම්, සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවෙකු විසින් සඳහන් කළේ එය ඔවුන්ගේ මුළු ප්‍රජාව ම අවදානමට ලක් කරවන්නක් විය හැකි බවයි.



> සිද්ධියෙන් පස්සෙ අපේ යාලුවො ඔක්කොම මට බැනල තිබ්බා. අපි ආව ගෙදර යාළුවත් ගොඩ කාලයක් යනකල් මා එක්ක කතා කළේ නෑ. යාළුවගෙ ගෙදරට එක්කරගෙන ආව එක වැරදියි කියලා හැමෝම කිව්වා. ඒත් අපිට එහෙම කරන්න වුණේ අපිව පොලිසියට අරන් යන එකෙන් වළක්වගන්නයි අපේ අයිඩී ආපහු ගන්නයි. මම එතැනදි ගොඩක් අපහසුතාවයට පත් වුණා. මාත් එක්ක කතා කළේ නෑ අපිත් එක්ක ඉන්න කවුරුවත්. අපේ යාළුවො තමයි අපේ දුක සැප බෙදාගන්න හැම දේටම ඉන්නෙ. අඩුම ගාණෙ මම කරන රස්සාව මගෙ ගෙදර අයවත් දන්නෙ නෑ. ගෙදර ප්‍රශ්න ඔක්කොම මට මතක් වුණා. අපිට එදා වේල හම්බ කරගන්නත් බැරි වුණා. ඇඟට හරි අමාරුයි. බෙහෙත් ගන්න නම් ගියෙ නෑ. සාමාන්‍ය දෙයක් ඒක අපිට.
>
> වත්සලා, කොළඹ, බස්නාහිර පළාත

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය විසින් කාන්තාවන් සහ LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් ලිංගික අල්ලස් සඳහා ප්‍රවේශ වීමේ අවදානමකට ලක් කරයි. LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් අතර සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවේ දී පැහැදිලි වූයේ මෙම අවදානම සුලභ බවත්, ඔවුන් දිනපතා එයට ගොදුරු වන බවත් ය. කාන්තාවන් සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය විසින් පළමුව ඔවුන්ව ඉලක්ක බවට පත් කරන අතර බලය පිළිබඳ වූ අසමාන සම්බන්ධතාවයක විසින් විට මෙම අවදානම තවදුරටත් වැඩි වේ.

සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡාවල විස්තර කර ඇති අවස්ථා අනුව ගත් කළ, දිවි ගලවා ගත් කාන්තාවන්ට යම් කිසි සේවාවක් ලබා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරියෙකු වෙත යාමට සිදු වන අතර, එම සේවාව ලබා දීමේ දී, රාජ්‍ය නිලධාරියාට ඒ සඳහා අභිමතයක් පවතී. දිවි ගලවා ගත් තැනැත්තා අවදානමට ලක් වන්නේ සහ ලිංගික අල්ලසක් ලබා ගැනීම සඳහා ඔවුන් වෙත නිලධාරීන් ප්‍රවේශ වන්නේ මේ අවස්ථාවේ දී ය.

කාන්තාවක් හෝ LGBTQI ප්‍රජාවේ සාමාජිකයෙකු ලිංගික අල්ලස් ගැනීමේ අවදානමකට ලක් කිරීම පිණිස බලය, ධුරාවලිය, සාක්ෂරතාවය සහ දරිද්‍රතාවය පිළිබඳ අදහස්/අවබෝධයන් එකට එකතු වන ආකාරය මෙම උදාහරණ මගින් පැහැදිලි වේ. මෙම සිදුවීම්වල මෙවන් බරපතලකමක් තිබියදීත්, සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් සාමාන්‍යයෙන් නීතිමය ක්‍රියාමාර්ග වෙත නොපිවිසෙන අතර නීතියෙන් ආරක්ෂාව අපේක්ෂා නොකරයි. ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන්ගේ අයිතිවාසිකම් සඳහා නිශ්චිත නීතිමය රැකවරණයක් නොමැතිකම හේතුවෙන් නීතිය විසින් ඔවුන්ට ආරක්ෂාවක් සැලසෙනු ඇතැයි ඔවුන් සිතන්නේ නැත. එපමණක් නොව, ඔවුන්ගේ අවිනිශ්චිත සමාජ තත්ත්වය හේතුවෙන්, නීති නියෝජනයක් ලබා ගැනීමට ඔවුන්ට මූල්‍යමය හැකියාවක් නොමැත.

> යාළුවෙකුට කිව්වොත් අපි ලෝයර් කෙනෙක් අල්ලමු කියල කියයි. අපිට සල්ලි නැනෙ මිස්.
>
> නුස්රත්, බස්නාහිර පළාත

## 5.2. පවුල සහ ප්‍රජාව කෙරෙහි බලපෑම

වින්දිතයින් බොහෝ විට තමන්ගේ ලිංගික අල්ලස් පිළිබඳ අත්දැකීම් රහසක් ලෙස තබා ගැනීමට උත්සාහ කළද, සිද්ධිය පිළිබඳ කටකතා සමාජයට පැතිර ගිය අවස්ථා තිබේ. ලිංගික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ සිද්ධීන් හි දී, ප්‍රජාව විසින් අදාල පුද්ගලයාට, ඔවුන්ගේ න්‍යෂ්ටික පවුලට පමණක් නොව ඔවුන්ගේ විස්තෘත පවුලට පවා අපකීර්තිය පතුරවයි. සම්මුඛ පරීක්ෂකයින් ඔවුන් විසින් මෙම බලපෑම අපේක්ෂා කළ ආකාරය දුටු අතර ඒ අනුව සිද්ධිය පිළිබඳ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට පියවර ගත්හ.

> ‘ මේ තත්වය උඩ මම මට වෙච්ච කරදරයත් කිව්වොත් තවත් මගෙ දුවට කතන්දර හැදෙයි. ’
>
> ලලිතා, මාතලේ, මධ්‍යම පළාත

> ‘ ඉතිං ඕවා දුරදිග ගෙනිච්චම ලැජ්ජයිනෙ ළමයි දෙන්නටත් පාරට බහින්න බැරිවෙයි ඒ නිසා පාඩුවෙ ඉන්න කියලා. ’
>
> ගයනි, හම්බන්තොට, දකුණු පළාත

එක් අවස්ථාවකදී, සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූ කාන්තාවක් මෙම සිද්ධිය රහසක් ලෙස තබා ගැනීම ඇගේ සමීප සහකරු සමඟ ඇති සම්බන්ධයට බලපෑ ආකාරය සඳහන් කළාය.

> ‘ සැමියා මේ ගැන මාත් එක්ක විවෘතව කතා කරලම නෑ. ඒ වුණාට එයාගෙ හිතේ මං ගැන ගෞරවය අඩු වුණා කියල මට දැනුණා. ’
>
> මාලනී, නුවර, මධ්‍යම පළාත

එපමණක් නොව, ලිංගික අල්ලස් සිදුවීම්, වින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට සෞඛ්‍ය රැකවරණය හෝ යුක්තිය අපේක්ෂා කිරීමෙන් වැළකී සිටීමට බල කිරීමක් ඇති කරයි. මෙම ප්‍රතිචාරය වින්දිතයාට සහ ඔවුන්ගේ පවුලට වෙනත් දරුණු ප්‍රතිවිපාක ඇති කළ හැකිය. පහත දැක්වෙන උපුටා දැක්වීම් දෙකෙහි, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ රාණි සහ මාලනී යන දෙදෙනාම, ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල් සායන වෙත යාමේදී තම පවුලේ සාමාජිකයන් කැටුව යාම නතර කර ඇත. ඔවුන් එසේ කළේ ලිංගික අල්ලස් සඳහා කෙරෙන ඉල්ලීම් වැළැක්වීම සඳහා ය.

> ‘ අම්මල හිතුවෙ මොකක් හරි අයුතු සම්බන්ධයක් තියෙනව කියලා. අම්මා මේක මහත්තයා එක්කත් කියල තිබුණා. මහත්තයා විස්තර කිව්වට පස්සෙ අම්මත් කිව්වා ආයෙ උඹ මාත් එක්ක ක්ලිනික් යන්න එන්න ඕනෙ නෑ කියලා. ඒ නොම්බරේ ගෙදර ආව වෙලාවෙ මගෙ මහත්තයා අයින් කළා. එතැනින් ඒ ප්‍රශ්නෙ ඉවර වුණා. ’
>
> රාණි, මාතලේ, මධ්‍යම පළාත

> ‘ අංකය බ්ලොක් කළාට පස්සෙ වෙන වෙන නම්බර්ස්වලින් කතා කරන්න පටන් ගත්තා. අන්තිමට මම සිම් එක බ්ලොක් කරල දැම්මා. ක්ලිනික් යන එකත් නතර කළා. අම්මව නෑනත් එක්ක යවන්න පටන් ගත්තා. සිම් එක නතර කළාට අම්මව සායනයට එක්ක ගියා නම් මට ඒ මිනිහට මුහුණ දෙන්න වෙනවා. ’
>
> මාලනී, නුවර, මධ්‍යම පළාත

ඇතැම් අවස්ථාවලදී, වින්දිතයා ලිංගික ඉල්ලීම්වලට අවනත වීම ප්‍රතික්ෂේප කළ විට, අපරාධකරු තමා විසින් නීත්‍යානුකූල ලෙස සැපයීමට බැඳී සිටින සේවාව සැපයීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටි ලිංගික අල්ලස් ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ඔහු දැක්වූ ප්‍රතිචාරය සම්බන්ධයෙන් වින්දිතයෙකු මෙසේ පැවසී ය.

‘ ඊට පස්සෙ මූණ අමුතු කරගෙන, පොලිසියට ගියාට පස්සෙ අපිට පාට් දාන්න පටන් ගත්තා. ’

ජෙනී, ගම්පහ, බස්නාහිර පළාත

මෙම අත්දැකීම් අත්දකිනු ලබන්නේ ලිංගික අල්ලස් වින්දිතයින් පමණක් නොවේ. සම්මුඛ සාකච්ඡාවලට සහභාගි වූ ඇතැමුන් ඔවුන්ගේ සහකරු හෝ දරුවා විසින් අපරාධකරු නැවැත්වීම සඳහා මැදිහත් වීමට උත්සාහ කළ ආකාරය නිරීක්ෂණය කලහ. මාලනීගේ සිද්ධියේදී එය අපරාධකරුවා නතර කළේ නැත. දෙවන සිද්ධියේදී, ජීවා (දරුවාගේ මව) ඔහුගෙන් පලිගනීවියි යන බිය නිසා දරුවාට ඊට මැදිහත්වීමට ඉඩ දුන්නේ නැත. රූපාගේ සිද්ධියේදී ඇයගේ සහකරුගේ මැදිහත්වීම සාර්ථක විය.

‘ ඊට පස්සෙ එදා රෑ ඉඳන්ම කෝල් කරන්න පටන් ගත්තා. දිගින් දිගටම කෝල් කරන්න ගත්තා. වට්ස්අප්වලට වොයිස් මැසේජස් එවන්න පටන් ගත්තා. ඊට පස්සෙ මම සැමියාට මේ අංකය දුන්නා. සැමියා එයාට කතා කරලා මට කතා කරන්න එපා කියල කියල තිබුණා. ඒ අහන්නෙත් නෑ. නිතරෝම ගන්නවා. ’

මාලනී, නුවර, මධ්‍යම පළාත

‘ නෑ අම්මා, එයාට එහෙම කරන්න පුළුවන්ද, අපි OIC මහත්තයට ගිහිල්ල කියමු කියල පුතා කිව්වා. දැන් තියෙන තත්වය අනුව මිස්, දරුවගෙ නම පොලිස් පොතේ ලියවෙනව කියන්නෙ අනාගතයෙ රස්සාවක්වත් ගන්න බැරි වෙනවා, ඒක බලපානවනෙ. මම ඒ පැත්ත බැලුවා. මම හරියට බය වුණා. ’

ජීවා, මාතලේ, මධ්‍යම පළාත

‘ මගේ මහත්තයා ෆෝන් එකේ රෙකෝඩ් කරපුවා ඔක්කොම එළියට දානවා කියලා තර්ජනය කරා. ලෝයර් මහත්තයාට එහෙම කරපං කියලා අභියෝග කරා. තමුසෙ පුලුවන් දෙයක් කරලා පෙන්නනවා කිව්වා. ඊට පස්සෙ මගේ මහත්තයා එයාට එක රෙකෝඩින් එකක් පෙන්නුවා. ඊට පස්සේ ලෝයර් පස්ස ගැහුවා. ’

රූපා, රත්නපුර, සබරගමුව පළාත

## 5.3. අවිධිමත් සහාය

බොහෝ වින්දිතයින් ලිංගික අල්ලස් අත්දැකීමේ කම්පනය සහ අපකීර්තිය සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ගේ අවිධිමත් ආධාරක ව්‍යුහයන් මත විශ්වාසය තැබූ ආකාරය සඳහන් කරන ලදි. බොහෝ අවස්ථාවලදී, ඔවුන් විශ්වාසවන්ත මිතුරෙකු සමඟ සහ තවත් අවස්ථාවලදී පවුලේ සාමාජිකයෙකු කෙරෙහි විශ්වාසය තැබීමෙන් යම් සහනයක් ලබා ගත්හ.

‘ මාත් එක්ක හිතවත් ගමේ මිතුරියකට මම කිව්වා. කිව්වට පස්සෙ මට සැහැල්ලුවක් දැනුණා. මගෙ හිතේ බර සෑහෙන්න හැල්ලු වුණා. ’

රමණී, නුවර, මධ්‍යම පළාත


‘ අනේ තාත්තා මාව සන්සුන් කරා ගෙදර එක්කං ගිහිං. එයානම් උපදේශක කෙනෙක් වගේ. අප්පච්චි නොහිටින්න මම සියදිවි හානි වුනත් කරගන්නවා. ’

ප්‍රියා, හම්බන්තොට, දකුණු පළාත

මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ පරීක්ෂණයට ලක් වූ කිසිවකු තම කම්පනයට මුහුණ දීම සඳහා මනෝ සමාජීය උපදේශකයකුගේ සේවය ලබාගෙන තිබුණේ නැත. මනෝවිද්‍යාත්මක යහපැවැත්ම සඳහා වෘත්තීයමය මැදිහත්වීමක් හෝ රැකවරණයක් අවශ්‍ය යැයි නොසලකන ශ්‍රී ලංකාව තුල මෙය අසාමාන්‍ය දෙයක් නොවේ. පුද්ගලයන් තම මානසික සෞඛ්‍යය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත්තද, ඔවුන්ට අවශ්‍යයෙන්ම එවැනි වෘත්තීය සේවාවන් සඳහා ප්‍රවේශය හෝ ඒවා ස්ථාවර ආකාරයකින් ලබා ගැනීමට අවශ්‍ය මූල්‍යමය හැකියාවක් නොතිබිය හැකිය.

## 5.4. සමාජීය හා සංස්කෘතික සාධක

වින්දිතයන්ගේ අත්දැකීම්වලින් වින්දිතයන් අවදානමට ලක්විය හැකි තත්ත්වයකට සහ ලිංගික අල්ලස් සඳහා ළංවීමේ අවදානමට ලක්කරන සාධක හෙළි කරයි. බොහෝ වින්දිතයින් මෙම සාධක පිළිබඳව තමන් විසින්ම දැනුවත්ව සිටින අතර ඇතැම් සමාජ, ආර්ථික සහ සංස්කෘතික සාධක ඔවුන් අවදානමට ලක් කරයි. එපමණක් නොව, සමීපතම පවුල තුළ පවා ලිංගික අල්ලස් සිදුවීම පිළිබඳව විවෘත ආකාරයෙන් බැලීමට බාධකයක් ලෙස පිරිමිකම සම්බන්ධයෙන් ඇති අදහස් හඳුනාගෙන ඇත.



‘ මහත්තුරුන්ට මේක තේරුම් කරන්න බෑ. ඒගොල්ලො යන්නෙ ගහගන්න. ඇයි මගෙ ගෑනිට කෝල් කළේ කියල එයා පොලිස්කාරයගෙන් ඇහුවොත් මගෙ මහත්තයට ප්‍රශ්න වෙනවා. ඒගොල්ලන්ට මේක තේරෙන්නෙ නෑ. ’

ජීවා, මාතලේ, මධ්‍යම පළාත

‘ මේ සිද්ධිය පිළිබඳ ඇගේ දියණිය පවා අදටත් නොදනියි. සැමියා සමග ද කියා නැත. ‘පිරිමි කට්ටිය හරි සැරයිනෙ මිස්. ඕව කියල ආයෙත් පොලිසිය එක්ක පැටළුනොත් හැමදාම ඇතුළෙ ඉන්න වෙයි.’ ’

ජෙනී, ගම්පහ, බස්නාහිර පළාත

විදේශ රැකියා ඇතුළු හේතූන් මත ස්වාමිපුරුෂයා විවාහක නිවසේ නොසිටින විට, ලිංගික අල්ලස් ඉල්ලීම් යොමුවීමේ අවදානමක් බිහිවීට ඇත.

‘ මගෙ සැමියා ගෙදර නැති නිසා තමයි මේ වගේ දේවල් වෙන්නෙ කියල මට හිතුණා. මට ලොකු දුකක් සහ කළකිරීමක් ඇති වුණා. තරහකුත් ඇති වුණා. මම බැන්නා. "පිරිමියෙක් ගෙදර නැති ගෑණු කෙනෙක් අල්ලගන්න හදන මේ වැඩේ පිරිමියෙක් කරන වැඩක් නෙවෙයි" කියල මම බැන්නා. ඒත් මම බනිනකොට ඒ මිනිහ හිනා වෙනවා. අනුකම්පාව දිනාගන්න වගේ. ’

මාලනී, නුවර, මධ්‍යම පළාත

පුද්ගලයන් ලිංගික අල්ලස් පිළිබඳ අවදානමට ලක් කරන තවත් සාධකයක් වන්නේ ඔවුන් සෘජුව හෝ වක්‍රව නීති විරෝධී ක්‍රියාවලට සම්බන්ධ වී සිටීමයි. ජෙනීගේ සිද්ධියේ දී, ඇය ලිංගික සේවිකාවක් වූ නිසාත්, ඇගේ සැමියා නීතිවිරෝධී ද්‍රව්‍ය සම්බන්ධ චෝදනාවලට සිරභාරයේ සිටි නිසාත්, ඇය සහ ඇගේ නාඹර වියේ දියණිය වෙත ලිංගික අල්ලස් ඉල්ලීම් යොමුවුණි.

‘

එදා දවසම මම කල්පනා කර කර තනියම ඇඬුවා. දුක හිතිලා. මොකක්ද කරන්නෙ, කවුද ඉන්නෙ, කාටවත් කියලත් බෑ, කවුරු ට කියල කියන්නද, දෙවියන්ට කියන්නනත් බෑ, අපිත් වැරදි කරලනෙ. අපි මොනව හරි දෙයක් කරල නිසානෙ අපිටත් මෙහෙම වෙන්නෙ කියලා. මම පොරොන්දු වුණා මම මේව ආය කරන්නෙ නෑ, අපි තියෙන විදිහට කා බීල ඉමුකො කියලා. එදයින් පස්සෙ මම මේක නතරම කරල දැම්මා. ඒත් එනවා. ඒ යක්කු ඒත් එනවා, කිසිම හේතුවක් නෑ. මේ ළඟදිත් මහත්තයාව ආයෙමත් අරගෙන ගියා. ’

ජෙනී, ගම්පහ, බස්නාහිර පළාත

මනෝරිටත් ඒ අත්දැකීමටම මුහුණ දීමට සිදුවිය. ඇය ලිංගික අල්ලස් ඉලක්කයක් බවට පත් වූයේ ඇය රැඳවුම් භාරයේ සිටිනු තම ස්වාමිපුරුෂයා බැලීමට යාමේ අයිතිය ඉල්ලා සිටි බැවිනි.

සාධක දෙකක් ඉරෝමි අවදානමට ලක් කරන ලදි. එකක් ඇයගේ ශාරීරික දුබලතාවය වූ අතර අනෙක ඇයගේ රැකියාව විය. ඇයට අවශ්‍ය වූයේ ඇයගේ රෝගී තත්ත්වය නිසා ඇතිවන අපහසුතාවය හේතුවෙන් තම ස්ථාන මාරුව අවලංගු කරන ලෙස ඉල්ලා සිටීමටය. එම අසරණභාවය ඇයව ලිංගික අල්ලස් අවදානමට ලක් කරන ලදි.

‘

ජොබ් එක වෙනුවෙන් ඕනම දෙයක් කරනවා කියන අදහස මගේ ඔළුවෙ තිබුණෙ. ඒත් ඒ දේ වෙනුවෙන් ජීවිතේම දෙන්න වුනා තව දවස් දෙකක්ම අර විදියට කෝල් කරා. දෙවනි දවසෙ මං කිව්වා. කැමති වුනා.ඒ කැමැත්ත නෙවෙයි අසරණකමට වෙන කරන්න දෙයක් නැති නිසා කියන තැනකට එන්නම් කිව්වම මිනිහට මාර ගැම්මක් ආවා. ’

ඉරෝමි, මාතර, දකුණු පළාත

## 5.5. ලිංගික අල්ලස් සම්බන්ධයෙන් වින්දිතයන්ගේ අදහස්

බොහෝ වින්දිතයන්ගේ මතය වූයේ ලිංගික අල්ලස් නිශ්චිතවම වැරදි බවයි. ලලිතා සඳහන් කළේ එය විසඳිය නොහැකි ගැටලුවක් බවයි. ඊට විසඳුම් සෙවීම පහසු නොවන බව ඇගේ අදහස විය. ලිංගික අල්ලස් සිදුවන රහසිගත ආකාරය නිසා රාණි ද එවැනිම අදහස් පළ කළාය.

‘

නීතිය ආරක්ෂා කරන්න ඉන්න කෙනෙක් මේ විදිහට හැසිරෙන එක අනිවාර්යයෙන්ම ලොකු වැරැද්දක් බව හිතුවා. ’

ලලිතා, මාතලේ, මධ්‍යම පළාත

‘

දැන් හැම දේම වෙන්නෙ ෆෝන්වලින් නිසා ලංකාවෙ මේක තහනම් කරන්න, නවත්තන්න බැරි වෙයි කියල හිතනවා. ’

රාණි, මාතලේ, මධ්‍යම පළාත

මනෝරි ලිංගික අල්ලස් පිළිබඳ අත්දැකීම් හේතුවෙන් කෝපය, කලකිරීම සහ බිය වැනි දැඩි හැඟීම් ප්‍රකාශ කළාය. ජීවා එය විස්තර කළේ ජීවිතය විනාශ කරන අත්දැකීමක් ලෙසයි.

> ‘ ඇත්තටම ලොකු තරහක්, දුකක් ආවා. ඒ පොලිස්කාරයත් එක්ක. මොකද මම අසරණ වෙලා තනි වෙලා ඉන්න වෙලාවක මට එහෙම කළානෙ මිස්. මොකද උපරිම අසරණ වෙලා හිටියෙ. මොකද වැරැද්දක් කරලත් නෑනෙ. ’
>
> මනෝරි, නුවර, මධ්‍යම පළාත

> ‘ මේක තමයි අන්තිම පහත්ම අල්ලස. ආත්මෙම ඉල්ලනව වගේ වැඩක්නෙ මේක ’
>
> ජීවා, මාතලේ, මධ්‍යම පළාත

> ‘ ඌ තිරිසනෙක්. සාපවේවි කවදකහරි. ’
>
> ඉරෝමි, මාතර, දකුණු පළාත

ගයනි විසින් ඇය වෙත පැමිණි ලිංගික අල්ලස් ඉල්ලීම හමුවේ ඇය අත්විඳින ලද දැඩි සහ නිෂේධාත්මක හැඟීම් සහ ශාරීරික ප්‍රතික්‍රියා විස්තර කරන ලදි. මෙම නිරීක්ෂණ මගින් ලිංගික අල්ලස් එහි වින්දිතයින් කෙරෙහි ගැඹුරු කම්පනකාරී බලපෑම පැහැදිලිවම පෙන්නුම් කරයි.

> ‘ බුදු අම්මේ මිස් මගේ ඉහෙං කනෙන් දාඩිය දාන්න ගත්තා. මං වෙව්ලන්න ගත්තා. එහෙමම පෝන් එක කට් කරලා දාලා එලියට දුවලා ගිහිං වතුර එකකුත් බිව්වා.. මට නිකං මොනව වුණාද මංදා. තව අඩුගානේ ඌට බනින්නවත් මට ශක්තියක් ආවේ නෑ. දැනුනෙ දුකක්ද, තරහක්ද, බයක්ද මට කියන්න තේරෙන්නෑ. ’
>
> ගයනි, හම්බන්තොට, දකුණු පළාත

වෙනත් අයද අපරාධකරුගේ ලිංගික අල්ලස් ඉල්ලීම්වලට ගොදුරු වීමට ඇති ඉඩකඩ පිළිබඳව සම්මුඛ සාකච්ඡා කිහිපයකදීම සංවේදී වී තිබීම විශේෂත්වයකි. සෑම වින්දිතයෙකුම නිහඬ වින්දිත ප්‍රජාවක් සිතින් මවා ගන්නා බවක් පෙනෙන්නට තිබුණි.

> ‘ මෙහෙම කතා කිරීමෙන් මගෙ මානසිකත්වය හැදෙනවා. මම හිතන්නෙ මෙහෙම කතා කරන එකත් ගොඩක් වැදගත් කියලා. මං වගේ තව කී දෙනෙක් ඇත්ද..? ’
>
> මනෝරි, නුවර, මධ්‍යම පළාත

> ‘ ඔය වගේ දේවල් පොඩි දේවල් කියල හිතන්නෙ නැතුව ක්‍රියාමාර්ග ගන්න ඕනෙ. අපි මේව හංගගෙන ඉන්නව වගේ දෙයක්නෙ මේ කරන්නෙ. මීට වඩා මේ නිසා කරදර වෙන ගෑණු අය ඇතිනෙ. ’
>
> මාලනී, නුවර, මධ්‍යම පළාත

‘

මං වගේම අසරණ අය තව කී දෙනෙක් ඇත්ද? ඒ කියන්නෙ සමාජයට වැඩිය නොගිහින්, මේ දේවල් ගැන තේරුමක් නැති කට්ටිය ගොඩක් ඇති නෙ නේද.. ඒ මිනිස්සු ඇත්තටම අසරණ වෙනවා. ඒවට පෙළඹෙනවා. කෝල්වලට ආන්සර් කරගෙන දිගට දිගට එයාල යන්න ඉඩ තියෙනවා. ඒ වගේ තත්වයට පත් වෙන අහිංසක ගෑනු කී දෙනෙක් ඇත්ද? ’

ජීවා, මාතලේ, මධ්‍යම පළාත

‘

මම විස්තර දන්නේ නැහැ, ඒත් අනිවාර්යෙන්ම, ඒ මිනිහා වෙන ගෑනු අයගෙනුත් එහෙම කරන්න කියලා ඉල්ලලා ඇති. ඒ මිනිහාට මගේ ළඟට ඇවිල්ලා මගේ අත අල්ලගන්න තරම් හයියක් තිබුණා නම්, එයාගේ අනික ගැහැණු සේවාදායකයින්ගේ ඉරණම මට හිතාගන්නත් බෑ. ’

රූපා, රත්නපුර, සබරගමුව පළාත

එපමණක්ද නොව, අපරාධකරු පුරුද්දක් ලෙස එම වැරැද්ද කරන අයෙක් බව මාලනීගේ අදහස විය. සංක්‍රාන්ති ලිංගිකයෙකු වන රීටා සඳහන් කළේ ලිංගික අල්ලස් ලබා ගැනීම දෙපාර්ශවයේම ගනුදෙනුවක් පමණක් බව ඇගේ විශ්වාසය බවයි. තමාට අවශ්‍ය සේවය වෙනුවෙන් මේ අනුග්‍රහය ඇයගෙන් ඉල්ලා සිටින බව ඇය තේරුම් ගත්තාය. තමා පළමුවැන්නා නොව එවැනි සිදුවීම් රටාවකට ගොදුරු වූ තවත් එක් වින්දිතයෙකු පමණක් බව ද ඇය තේරුම් ගත්තාය

‘

මීට කලිනුත් ඔහොම කරන්න ඇති. පුරුද්දකට වගේ අහනව කියල තමයි මට නම් හිතුණෙ. කොහොම වුණත් ඉතින් බය නැතුව ඔහොම අහන්නෙ නෑනෙ නැත්නම්.. පහුවදාම කෝල් එකක් අරන් මාව මතකද කියල අහන්නෙ පුරුදු ඇති මේ වැඩේ. ’

මාලනී, නුවර, මධ්‍යම පළාත

‘

මට ඕනෙ වුණේ පුළුවන් ඉක්මනට ඒ වැඩේ කරල දීල එතැනින් ඇවිත් තාත්තව බලන්න...එයා මීට කලින් ට්‍රාන්ස් කෙනෙක් එක්ක යාළුකම් පැවැත්වූ බවත්, ඇය රට ගිය පසුව කතා බස් නොකරන බවත් කිව්ව මං වගේම එක්කෙනක් එක්ක.. ඒ හොස්පිට්ල් එකේදිම අඳුනගත්.. ’

රීටා, කොළඹ, බස්නාහිර පළාත

## 5.6. ලිංගික අල්ලස් පිළිබඳ අපරාධකරුගේ අදහස් (වින්දිතයන් විසින් වාර්තා කරන ලද පරිදි).

මෙම අධ්‍යයනය ලිංගික අල්ලස්වලට ගොදුරු වූ බවට තමන් විසින්ම හඳුනාගත් අයගේ අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කර ඇත. ඔවුන් සියල්ලෝම අපරාධකරු ගැන අදහස් දැක්වූ අතර අපරාධකරු ලිංගික අල්ලස් ලබා ගත් ආකාරය පිළිබඳ ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කළහ. බොහෝ අවස්ථාවන්හිදී, වින්දිතයන් වෛෂයිකකරණය කොට, වින්දිතයාගේ කැමැත්ත නොතකා, ඔවුන් ලිංගික වින්දනය ලබාගත හැකි මූලාශ්‍රයක් වශයෙන් පමණක් සලකා කටයුතු කර ඇත. අවස්ථා තුනකදී, අපරාධකරු වින්දිතයා කෙරෙහි යම් ආකාරයක සෙනෙහසක් ප්‍රකාශ කළ නමුත්, වින්දිතයා එම සෙනෙහස ව්‍යාජ එකක් ලෙස හඳුනා ගෙන ඇත.

‘

මාත් එක්ක කතා බහ කරල ඉන්න, මට ඔයා ගැන හිතක් පහළ වෙලා තියෙනවා ’

මාලනී, නුවර, මධ්‍යම පළාත

‘

(මට ඔයාව දැක්කම ආස හිතෙනවා කිව්වා) ඒ කරලා මට තනියම ඇවිත් මුණගැහෙන්න පුළුවන්ද කියලා ඇහුවා. මම මගේ අත අහකට අරගෙන එයාට ආපහු එයාගේ සීට් එකට යන්ඩ කියලා කිව්වා. ’

රූපා, රත්නපුර, සබරගමුව පළාත

‘

අනේ පැටියෝ හැබැයි හෙට රෑට ඔයා මං ළඟට එන්න ඕන කිව්වා. මං රෑ වෙලා ගෙදරට එන්නම් කිව්වා. ’

ගයනි, හම්බන්තොට, දකුණු පළාත

‘

මං දැනගත්තා වැඩේ. මට තේරුණා. මං එච්චර මෝඩ නෑ. ඔයාව අල්ලද්දී කරද්දි මට දැනෙනවා කිව්වා. රෝගීන් ලා දහස් ගානක් ඇල්ලුවත් කළාට ඔයාව මාර විදියට දැනෙනවා කිව්වා... නිකං අර සෙවලයෙක් වගේ කිව්වෙග... අප්පිරියයි... ඇල්ලුවට කරාට මදි මට දැන් ඒවයි පින්තූර එවන්න කිව්වා ඇඳුම් නැතුව...අන්තිමටම කිව්වා ඉතිං මාව ඕන කියලා... මාව ඕන කියන්නෙ

ආදරේට නෙවෙයිනෙ අක්කෙ... ඌ කතාකරේ නිදාගන්න... ’

ලක්ෂ්මි, හම්බන්තොට, දකුණු පළාත


‘

කාමරේදි අර මිනිහා කියනවා ඌ කැමතියිලු මාත් එක්ක සම්බන්ධයක් දිගටම පවත්වන්න. ලැජ්ජාව කියන දේ ගෑවිලාවත් නෑ මුන්ටනම්. මට උගෙ හොරගෑණි වෙලා ඒ තිරිසනා එක්ක කාමර ගානෙ යන්නනෙ වෙන මොකටද? මට හොඳ වචන එන්නෙ ඉතිං. ඇගේ ලේ කෝපවෙනවා දැනුත් ඒවා මතක් වෙද්දි.

මේකනේ.... ගෑනු අපි ඉන්නෙ පිරිමින්ගෙ ලිංගික ආසාවල් සංසිඳවන්න කියලා උන් හිතං ඉන්නෙ. මෙතන තියන එකම ප්‍රශ්නේ ඒක. ’

ඉරෝමි, මාතර, දකුණු පළාත

තවත් අපරාධකරුවෙකු ලිංගික අල්ලස් ඉල්ලා සිටිය හැකි තත්වයකට වින්දිතයා පත් කරන ලදි. ආරාධනයේ පෙනෙන්නට තිබූ සාමාන්‍ය ස්වභාවය නිසා වින්දිතයා එයට එකඟ විය.



‘ මම ගැන වැරදියට හිතන් නැතුව මං එක්ක රෑ කෑමකට යන්න එනවද ඇහුවා කොළඹ. ඉතිං මං හිතුවා ගාල්ලෙ මෙච්චර තැන් තියෙද්දි ඇයි කොළඹ කියලා. මං කිව්වා කොළඹ දුර වැඩි ගාල්ලටනම් එන්නම් කියලා. එහෙම බෑ කිව්වා ගාල්ල එයාට ආරක්ෂිත නෑ කියලා කොළඹ යන්න වෙනවා කිව්වා. කාටවත් නොකියා එන්න කිව්වෙත්. ’

ප්‍රියා, හම්බන්තොට, දකුණු පළාත

තවත් අපරාධකරුවෙකු වන පොලිස් නිලධාරියෙක්, වින්දිතයෙක් වූ ජෙයාට යෝජනා කළේ, ලිංගික අල්ලස් යනු පවුල් පසුබිම් වාර්තාව සඳහා ලිපි ලේඛන සැකසීම වෙනුවට ලබාදෙන දෙයක් පමණක් (අයදුම්කරු රැකියාව සඳහා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින ලදි) බවයි.[42] වින්දිතයෙක් වූ රීටාට අවසර පත්‍රයක් නොමැතිව ඇගේ රෝගී පියා බැලීමට ඉඩ දීමේදී රෝහල් සේවකයෙකු විසින් ද එම ප්‍රවේශයම අනුගමනය කර තිබුණි.

‘ ඔන්න කට ඇරුණා හිමින් හිමින්...කෑගහන්න එපා බං කියලා හිමින් කිව්වෙත්... සල්ලි නැතුව දෙන දේවල් දන්නැද්ද කාන්තාවක් වෙලා කියලා මූ මගේ පපුව ඇස් වලින් ඉඟිකරා. ’

ජෙයා, ගාල්ල, දකුණු පළාත

‘ සපෝට් එකක් දෙන්න. විනාඩි 5 කට මාත් එක්ක වොෂ්රූම් එකට එන්න කියල කිව්වා. ටොයිලට් එකට යමු කිව්වා. මා ළඟ ඒ වෙලාවෙ කොන්ඩම් තිබ්බෙත් නෑ. මම ඉතින් වැඩේ කළා. ’

රීටා, කොළඹ, බස්නාහිර පළාත

තමන්ගේ අපේක්ෂිත ස්ථාන මාරුව සම්බන්ධයෙන් තමන්ට කතා කිරීමට සිදුවූ සෞඛ්‍ය අංශයේ රාජ්‍ය නිලධාරියෙක් වන අපරාධකරුගේ අනපේක්ෂිත හා තර්ජනාත්මක හැසිරීම නිසා තමන් අන්ත අසරණභාවයට පත් වූ බව ඉරෝමි සඳහන් කළාය.

‘ මං මගේ දුක කිව්වම ඒ මිනිහා මාව බයකරා. මට කුණුහර්පෙන් බැන්නා අසික්කිතයි. උබේ ස්ථාන මාරු විතරක් නෙවෙයි උබට ජොබ් එකත් නැතිකරලා මාව හිරෙත් දානවා කිව්වා එයාට නුසුදුසු දේවල් වලට මං එතන්ටගිහිං ඌව පොළඹවා ගත්තද මොකක්ද මගුලක් කිව්වා අනේ. පැය 24 යි දෙනවා කිව්වෙ. තීරණෙ තමයි මගෙන් ඕන කිව්වෙ.කාට කියන්නද මොනව කරන්නද? අනිත් අයට වගේ අතේ මිටේ සල්ලි තිබ්බෙ නෑ ඕවට පොලිසි උසාවි ගානෙ යන්න... ජොබ් එක නැතිකරොත් බඩගින්න තමයි ඔක්කොටම ඉන්න වෙන්නෙ. ’

ඉරෝමි, මාතර, දකුණු පළාත

[42] සංක්‍රමණික සේවිකාවක් ලෙස පිටත්ව යාමට වයස අවුරුදු 45ට අඩු කාන්තාවන් විසින් පවුල් පසුබිම් වාර්තාවක් ඉදිරිපත් කල යුතු බවට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නියම කර ඇත. මෙම අවශ්‍යතාවය කාන්තාවන්ට සිදු කරන වෙනස් කොට සැලකීමක් ලෙසත් විදේශ රැකියා අපේක්ෂා කරන කාන්තාවන් මත පටවන විශාල බරක් ලෙසත් හඳුනාගෙන ඇත. උදාහරණයක් ලෙස, ‘ශ්‍රී ලාංකික කාන්තා සංක්‍රමණික ශ්‍රමිකයින් සහ පවුල් පසුබිම් වාර්තාව’ (ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2018 ජුනි)

## 5.7. කැමැත්ත පිළිබඳ අදහස්

අධ්‍යයනයට සහභාගිවන්නන් හට, අල්ලසක් වශයෙන් ලිංගික ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා ඔවුන්ගේ කැමැත්ත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ආරාධනා කරන ලදී. ප්‍රතිචාරවලින් ලිංගික අල්ලස් සිදුවීමේ සංකීර්ණ ගැටළුවක් අනාවරණය විය. ඇතැම් වින්දිතයින් වාචිකව ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ කර ඇති අතර ඇතැමුන් තම අකමැත්ත ප්‍රකාශ කිරීමට ශාරීරික ප්‍රචණ්ඩත්වය භාවිත කිරීමට සිදු වී ඇත. ඒවා සියල්ලක්ම සාර්ථක වී නැත. තවත් අවස්ථාවල දී, එම සිදුවීමට කැමැත්ත හෝ අකමැත්ත වැදගත් නොවීය. මෙම සොයාගැනීම් ලිංගික අල්ලස් වැළැක්වීම සහ ඊට එරෙහිව දඬුවම් නියම කිරීම සඳහා නීතිමය හෝ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයක යෙදෙන විට සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් අනාවරණය කරයි. කැමැත්ත, ලිංගික අල්ලස් සිදු වූවාද නැද්ද යන්න තීරණය කිරීමට නීතිය විසින් යොදාගත හැකි නිර්ණායකයක් නොවිය යුතුය.

මාලනීට සහ මනෝරිට අනුව ඇය ලිංගික ක්‍රියාවන්ට කැමැත්ත දුන්නාද නැත්ද යන්න වැදගත් නොවීය.

> ‘ ඒත් මිස් මම මගෙ අකමැත්ත ප්‍රකාශ කරපු අවස්ථාවල මට ඒ අයිතිය (ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය) හම්බ වෙලා නෑ. මගෙ අතපයේ හයිය පාවිච්චි කරල තමයි මම බේරුණේ. අනික් දේවල් වෙන්න ඉඩ තිබුණ ඉතින්. කැමැත්තෙන් තොරව තමයි හැමදේම වුණේ. ’
>
> මනෝරි, නුවර, මධ්‍යම පළාත

මාලනි සඳහන් කළේ කාන්තාවන් ලිංගික අල්ලස් සඳහා කැමැත්තෙන් සහභාගි නොවන බවත්, තත්වයන් විසින් ඒ සඳහා බල කෙරෙන බවත් විශ්වාස නොකිරීමේ ප්‍රවණතාවක් සමාජය තුළ පවතින බවයි.

> ‘ මේ ගැටළුව ගැන සිතන පතන ආකාරය වෙනස් කළ යුතුය’ ‘ගැණු කෙනෙක් කොච්චර හරි වුණත් ඒක පේන්නෙත් නෑ. ’
>
> මාලනී, නුවර, මධ්‍යම පළාත

රූපාට අනුව, ලිංගික ක්‍රියාවන් සිදුවිය හැක්කේ දෙපාර්ශවයේම කැමැත්ත ඇතිව පමණක් බව ඉතා පැහැදිලි විය. වෙනත් ඕනෑම ආකාරයක් නීති විරෝධී වනු ඇත. ඒ හා සමානව, නුස්රාත් තේරුම් ගෙන සිටියේ ඇයට කැමැත්ත දීමට හෝ කැමැත්ත නොදී සිටීමට අයිතියක් ඇති බවයි.

> ‘ ලිංගික ක්‍රියාවක් සිදුවන්නේ දෙදෙනෙකුගේ කැමැත්ත ඇතිවය. එය බලහත්කාරයෙන් සිදු නොවිය යුතු අතර එසේ වුවහොත් එය අපයෝජනයක් සහ හිරිහැරයකි. ’
>
> රූපා, රත්නපුර, සබරගමුව පළාත

> ‘ මම සෙක්ස් වර්කර් කෙනෙක්. මට අයිතියක් තියෙනවා, මම කැමැත්තෙන් තමයි, මගෙ ශරීරය දෙන්න ඕනෙ. අතෙන්දි වෙන්නෙ බල කිරීමක්. ’
>
> නුස්රත්, කොළඹ, බස්නාහිර පළාත

ලිංගික ක්‍රියාකාරකම් සඳහා කැමැත්ත දැක්වීමේ අයිතිය සම්බන්ධයෙන් ඉරෝමි ද දරන්නේ එවැනිම අදහසකි.

> ‘ නමුත් ගෑණු අපිට ස්වාධීන අයිතියක් තියනවා කැමති අකමැති දේ තමන් කැමති තීරණ ගන්න. තෝරගන්න. විරුද්ධ වෙන්නත් අනිවාරෙන්ම අයිතිය තියෙනවා. ලිංගික දේවලුත් මෙහෙමම තමයි මං දන්න විදියට. කැමැත්ත අකමැත්ත නෙවෙයි මේක මිනිස් අයිතියක්... අන්න ඒක සමාජෙ දැනගන්න ඕන. නැත්නම් ඉවරයි. ’
>
> ඉරෝමි, මාතර, දකුණු පළාත

අනෙක් අතට රීටා ලිංගික අල්ලස් සඳහා කැමැත්තෙන් සහභාගි වූ තැනැත්තියකි. එය යමක් වෙනුවෙන් ලබාදෙන දෙයක් බව ඇගේ වැටහීම විය. කෙසේ වෙතත්, සංක්‍රාන්ති ලිංගිකයෙකු ලෙස, ඇයට නිදහසේ අයිතිය, ප්‍රකාශනයේ සහ ඇසුරු කිරීමේ නිදහස ආදී අයිතීන් කිහිපයක් සඳහා නීතිමය රැකවරණයක් නොමැත. එමනිසා, ඇයට බොහෝ විට අසාමාන්‍ය හා නීතිවිරෝධී ආකාර වලින් තම ජීවිතය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදුවී ඇත.

> ‘ බලහත්කාරයක් වුණේ නෑ. කැමැත්තෙන් තමයි ම හිටියෙ. තුණ්ඩුව ගන්න. පාස් එක ගන්න. මොනව හරි කෑම බීම ඕනෙද කියලත් ඇහුව මගෙන්. ’
>
> රීටා, කොළඹ, බස්නාහිර පළාත

ඉරෝමිට ද ඒම සිද්ධියේ තිබූ යමක් වෙනුවෙන් යමක් ඉල්ලීමේ ස්වභාවය වැටහී තිබුණි.

> ‘ ඔයාට බරක් එකක් වෙලා තිබ්බ දේ විසඳලා දුන්නටට අපිට මුකුත් නැද්ද කියලා ඇහුවා....හොඳටම තේරෙනවා ඉල්ලුවෙ ඌට මගේ ඇඟ කියලා. නිදිවදින්න මං එක්ක. ඒ අහලා අනිත් පැත්තට මාව ඇදලා ගත්තා මැද කාමරේට (හඬමින්). ’
>
> ඉරෝමි, මාතර, දකුණු පළාත

තමන් කැමැත්ත පලකිරීමෙන් වැලකීම පිළිබඳව අපරාධකරු පුදුමයට පත් වූ බව රූපා සඳහන් කළාය. මෙයින් ඇඟවෙන්නේ බොහෝ වින්දිතයින් හට අපරාධකරුට එරෙහිව තම අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවක් නොමැති බවයි.

> ‘ ඔහුගේ පුටුව වෙත යමින් ඔහුගේ ආරාධනය ප්‍රතික්ෂේප කළ එකම පුද්ගලයා මම බව ඔහු පැවසුවා. (එයාට ගනන් උස්සපු එකම කෙනා මම කිව්වා) ’
>
> රූපා, රත්නපුර, සබරගමුව පළාත

## 5.8. යුක්තිය සඳහා ප්‍රවේශය

සම්මුඛ පරීක්ෂණවලින් ආනාවරණය වන පැහැදිලි රටාවක් නම්, වින්දිතයන් විසින් නීතිය, නෛතික ආයතන හෝ ඒවායේ නියෝජිතයින් තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවා යැයි පිළි නොගැනීමයි. ඇත්ත වශයෙන්ම, බොහෝ වින්දිතයන් නීතිය සහ ඒවායේ නියෝජිතයන් හඳුන්වනු ලබන්නේ තමන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නන් ලෙසයි. ලිංගික අල්ලස් සිදුවීම් සම්බන්ධයෙන් ගත්කල නීතියේ ගැටළු බහුමාන වේ. එය විශේෂයෙන් ලිංගික අල්ලස් තහනම් නොකරයි. මීට අමතරව, අධ්‍යයනයට සහභාගී වූ වින්දිතයන්ට අනුව, නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයින්ට පැවරී ඇති අභිමතය ඇතැම් විට ලිංගික අල්ලස් ඉල්ලීම සඳහා අවභාවිත කෙරේ. තවද, ඇතැම් වින්දිතයන්ට අනුව අධිකරණ

ක්ෂේත්‍රයේ ආයතන ලිංගික අල්ලස් ක්‍රියාත්මක වන ස්ථාන වශයෙන් සැලකේ. ලිංගික අල්ලස් සඳහා ශක්‍ය පිළියම් ඉදිරිපත් කිරීමට අධිකරණ අංශයට හැකි බව බොහෝ දෙනා සිතන්නේ නැත. නීතිය සහ එහි නියෝජිතයන් ලිංගික අල්ලස් සිදුවීම්වලට දායක වන බව පෙනේ.

නිදසුනක් වශයෙන්, රමණී හට, නීතිය ඉදිරියේ ඇය වෙනුවෙන් පෙනී සිටීමට බලාපොරොත්තු වූ වෘත්තිකයෙකු වන නීතිඥයෙකු විසින් ලිංගික අල්ලස් ඉල්ලීමකට මුහුණ දීමට සිදුවිය. ඇගේ නඩුව ඉඩම් සම්බන්ධ කාරණයක් වූ අතර ලිංගික අල්ලස් පිළිබඳ මෙම අත්දැකීම හේතුවෙන් ඇය විසින් අවසානයේ එය අතහැර දමන ලදි.

> ‘ නීතීඥ මහත්තයා වගේ කෙනෙක් අපි වගේ කෙනෙක්ගෙන් ලිංගික අල්ලස් ඉල්ලයි කියල මම එච්චර දුර හිතුවෙ නෑ. මොකද එයාලයි අපියි අතරෙ ලොකු පරතරයක් තියෙනවා. ’
>
> රමණී, නුවර, මධ්‍යම පළාත

පහත ලක්ෂ්මි, ගයානි සහ ජෙනී විසින් කරන ලද නිරීක්ෂණවලින් පැහැදිලි වන පරිදි, වින්දිතයන් නීතියේ ආධිපත්‍යයට ගරුත්වයක් ලැබෙන්නේ යැයි නොසිතති. නීතියෙන් හෝ නීතියට සම්බන්ධ ආයතනවලින් යුක්තිය සෙවිය හැකි හෝ ඉටු කර ගත හැකි යැයි ඔවුන් සිතන්නේ නැත. නීතිය ක්‍රියාත්මක බලධාරීන්ට පැවරී ඇති අභිමතය ලිංගික අල්ලස් ඉල්ලීම සඳහා අවභාවිත කෙරෙන බව ජෙනී විසින් පෙන්වා දෙයි.


> ‘ නිකරුණේ පොලිස් උසාවි ගානේ යන්න බැහැ අනේ. අනිත් එක නීතියත් උන්ටම ගිහිං. අපි ලැජ්ජ වෙනව විතරයි. ’
>
> ගයනි, හම්බන්තොට, දකුණු පළාත

> ‘ නීතිය නම් නීතිය තියෙන්න ඕනෙ. වරදට දඬුවම් දෙන එක වෙනම දෙයක්.තව හරියට සාධාරණයක් ඉෂ්ට වෙනව නම්, ඕකද නීතිය. උන් ජරාව ගන්නයි, ගෙදර ඉන්න ගෑනු ළමයි ගන්නද? ඕකද නීතිය? ’
>
> ජෙනී, ගම්පහ, බස්නාහිර පළාත

## 5.9. ඵලදායී පිළියම් සඳහා පවත්නා හැකියාව

නීතිය, නෛතික ආයතන සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් කෙරෙහි පවත්නා විශ්වාසය මද බව හේතුවෙන් වින්දිතයින් නීතිය තුලින් පිළියම් සෙවීමට මැලි වෙති. එසේ කිරීමට උත්සාහ කිරීම පවා තවත් කම්පනයකට හා අපකීර්තියට හේතු විය හැකි බව ඔවුන්ගේ දැනීමයි.

> ‘ එහෙම පැමිණිල්ලක් කළා නම් ඒක හිතට වද දෙන්න පටන් ගන්නවා. ඒක මනසට වදයක් වෙනවා. අනික මගෙ දරුවට ආරංචි වුණොත් මගෙ සහෝදරයන්ට, ගමේ අයට ආරංචි වුණොත් කියල මට හිතනෙවා. මම ම හිතේම තද කර ගත්තාම මට දැන් ප්‍රශ්නයක් නෑනෙ මිස් ’
>
> රමණී, නුවර, මධ්‍යම පළාත



‘ පැමිණිලි කලේ නැහැ.හැබැයි ග්‍රාමසේවකට කිව්වා.ඒකත් ඉතිං එක්තරා පැමිණිල්ලක් තමයි වැඩි හොඳට ගේ ඉන්න නිලධාරියට කිව්වෙ. වැඩක් වුනේ නැහැනේ. ඒ ගෑණි දන්න ලිංගික අල්ලසක් නෑ. ’

ඉරෝමි, මාතර, දකුණු පළාත


‘ අපි ගිහිල්ලා පැමිණිලි කළොත් අපිව ඇවිත් මරයිනෙ ’

නුස්රත්, කොළඹ, බස්නාහිර පළාත

ලිංගික අල්ලස් පිළිබඳ බොහෝ සිද්ධීන්ට අධිකරණ අංශයේ පුද්ගලයින් සම්බන්ධ වන බැවින්, විමර්ශනය සහ නඩු විභාගය අපක්ෂපාතී හෝ රහසිගත වනු ඇතැයි වින්දිතයන් නොසිතති. නඩු කටයුතු ඔවුන්ට ප්‍රවේශ විය හැකි හෝ විශ්වාසදායක නොවේ.

‘ මේ සිද්ධියට මුල් වෙච්ච පොලිස් නිලධාරියා ඉන්න පුලුවන් නිසා ඒ පොලිස් ස්ථානයටම වෙන ප්‍රශ්නයක් ආවොත් යන්නෙ කොහොමද කියල හිතේ බයක් තියෙනවා. ’

ලලිතා, මාතලේ, මධ්‍යම පළාත



‘ ඕවා ලීක් වුනාම පාරේ යන්නවත් බෑ. අනික කෙල්ලො දෙන්නෙක් පොලිසි ගිහිං මොනවා කොහොම කරන්නද. මං නම් පොලිසිය දැක්කත් බයයි. දොස්තරට නඩු දාන්න අපිට මොන හයියක්ද?.නීතිය නෙවෙයි ඕන වුනේ අර ටිකේනම් හරියටම ලෙඩේ අල්ලගන්න මට. ’

ලක්ෂ්මි, හම්බන්තොට, දකුණු පළාත

‘ ඒ ගොල්ලො ආයුධ බලය, නිල බලය, පිස්තෝලෙ බලය තමයි අපිට පෙන්නන්නෙ. ඒක වෙනස් වෙන්න ඕනෙ ’

නුස්රත්, කොළඹ, බස්නාහිර පළාත

මනෝරිගේ සිද්ධියේ දී මෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, දරිද්‍රතාවය සහ සමාජ තත්ත්වය හේතුවෙන් කාන්තාවන් සහ LGBTQI පුද්ගලයින් ලිංගික අල්ලස් අවදානමට ලක්ව ඇත. ඇයගේ නඩුවේදී, ඇගේ සැමියා පොලිස් අත්අඩංගුවේ සිටි නිසා ඇයගේ අත්දැකීම් ගැන පැමිණිලි කිරීමට ඇයට මාර්ගයක් නොතිබුණි. මෙම අත්දැකීමෙන් පෙනී යන්නේ යම් යම් තත්වයන් යටතේ, රජයේ සේවා ලබා ගැනීමේ දී පුද්ගලයන් ලිංගික අල්ලස් අවදානමට ලක් විය හැකි බවයි.

‘ අපේ අම්මා ගඩොල් කපනවා. ඉතින් මට පොලිසියට එක්කරගෙන යන්න කෙනෙකුත් නෑ මම තනියමයි යන්නෙ. මට මතක විදිහට මම සති එකහමාරක් විතර සැරින් සැරේ පොලිසියට ගිහින් මහත්තයව නිදහස් කර ගන්න බැලුවා.’ සහ අපි බය එයා පොලිසියෙ ඉන්න නිසයි. එයාව මුලින් පොලිසියෙන් අයින්

**කළා නම්, අපිට නීතියට යන්න පුළුවන්. මොකද අපි ගාව සාක්ෂි තියෙනවා. ඒ වුණාට එයාල ළඟ බලය තියෙනවා. අපිට සාක්ෂි පෙන්නන්න පුළුවන්, ලෝයර් කෙනෙක් හරි අල්ලන්න පුලුවන්. ඒ වුණාට අපි බයයි. ’**

මනෝරි, ගම්පොල, මධ්‍යම පළාත

ෆාරා සහ ජීවා විසින් අත්දැක ඇති පරිදි, අපරාධකරු පොලිසියේ හෝ අධිකරණ ක්ෂේත්‍රයේ වෙනත් ආයතනයක අයෙකු වන විට, වින්දිතයින් නීතිය ඉදිරියේ අසරණ වේ. ඔවුන්ට වෙනත් පිළිසරණක් නැත.

**‘ පොලිසියට යන්නෙ අපි පිහිටක් පතාගෙන. ඒකෙනුත් අපිට මෙහෙම වෙනව නම් අපි පිහිටක් පතන්නෙ කාගෙන්ද? ’**

ජීවා, මාතලේ, මධ්‍යම පළාත

**‘ අපිට පැමිණිල්ලක් කරලා යුක්තිය ඉල්ලන්න තියෙන එකම තැන පොලිසිය. පොලිසියේ අයත් මේ විදියට හැසිරෙනකොට, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් ගැන විශ්වාස කරන්නේ කොහොමද? කාන්තාවන්ට කොහේ ගියත් ආරක්ෂාකාරී බවක් දැනෙන්න ඕනෙ. ’**

ෆාරා, සබරගමුව පළාත

රූපාට අනුව, අපරාධකරුවන් වින්දිතයින් ඉලක්ක කර ගැනීම සඳහා අධිකරණ ක්ෂේත්‍රයේ ඔවුන් සතුව පවත්නා අධිකාරී බලය ප්‍රයෝජනයට ගනී. තමන්ට දඬුවම් නොලබා බේරී සිටීමට හැකියාව ඇති බව ඔවුන් දනිති.

**‘ දැනට කිසිම යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේ නෑ. මේ වගේ දේවල් නිතරම සිද්ධ වන්නේ අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට ක්‍රමවේදයක් නොමැති බව දන්නා නිසායි. ඔවුන්ට හැම විටම මුදල් හෝ බලය ඇති කෙනෙකුගෙන් සහය ලබාගෙන නීතියෙන් ගැලවෙන්න පුළුවන්. ’**

රූපා, රත්නපුර, සබරගමුව පළාත

එක් කැපී පෙනෙන ව්‍යතිරේකයක් නම්, පොලිස් නිලධාරියෙකු තමාගෙන් ලිංගික අල්ලසක් ඉල්ලා සිටින අවස්ථාවක නඩත්තු නඩුවක දී නීති ආධාර කොමිසමෙන් තමාට සහය ලැබුණු බවට ෆාරා විසින් ප්‍රකාශ කළ අත්දැකීමකි.

පැමිණිලි කිරීමේ ක්‍රියාවලිය පොදු ආකාරයෙන් සිදු වන බව ගයානි පෙන්වා දුන්නාය. ක්‍රියාවලියේ ඒම පොදුභාවය ම ලිංගික අල්ලස් වලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමෙන් වින්දිතයින් වළක්වයි.

**‘ ඕවයි මගේ නම් ගම් ඔක්කොම ලියවෙනවනේ. එහෙම නෙවෙයි රජයෙන් කරන්න ඕන එහෙම නිළධාරියෙක් ඒ වගේ දේකට කතාකලොත් අපිට අර 119 වගේ ක්ෂණිකව කෝල් ගහන්න පුළුවන්. ’**

ගයනි, හම්බන්තොට, දකුණු පළාත

මෙම සිද්ධීන් යෝජනා කරන්නේ පැමිණිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය වින්දිතයාට හිතකර නොවන බවයි. එය වින්දිතයින්ට නීතිය තුලින් පිළියම් සෙවීමට දිරිමත් නොකරයි. නිදසුනක් වශයෙන්, ප්‍රියාගේ පියා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළද, වින්දිතයා මෙම කාරණය තවදුරටත් ඉදිරියට ගෙන යාමට අකමැති වූ නිසා එය අතහැර දමන ලදී.

‘ තාත්තා CIABOC එකට කම්ප්ලේන් කරන්නයි උපදෙස් ගන්නයි කෝල් කරලා තිබ්බා. එයාලා ගොඩාක් උදව් කරනවා කියලත් කිව්වා. සාක්ෂි හොයාගන්න කිව්වලු ඔප්පු කරන්න. ඒකනම් ඉස්සරහට අරන් යන්න වුනෙ නැහැ මං අකමැති නිසා. තාත්තත් කැමැත්තක් නෑ කියලා තේරුණා එයාට ඕන ඒ වෙලාවෙ මගේ තත්වෙට මාව සාමාන්‍ය කරගන්න. ’


ප්‍රියා, හම්බන්තොට, දකුණු පළාත

ඉහත සාකච්ඡා කර ඇති සියලුම දුෂ්කරතා සහ අභියෝග LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් සම්බන්ධයෙන් සංකීර්ණ වේ. පොලිසියට එරෙහිව පිළියම් සෙවීමට නොහැකි බව ඔවුන් නිරීක්ෂණය කරයි. ඔවුන්ගේ ලිංගික අනන්‍යතාවය, ප්‍රායෝගික ජීවිතයේ දී, ඔවුන්ට නීතියේ ආරක්ෂාව අහිමි කරයි

‘ බාරගන්නෙත් නෑ අපෙන්. පොලිසිවලට ගියත්. දුරදිග යනවා, මානව හිමිකම් කොමිසමට ගියාම.

පොලිස්කාරයන්ට නම් ඉතින් ඕව කියල වැඩක් නෑ අනේ. ’

රීටා, කොළඹ, බස්නාහිර පළාත



‘ කැමැත්ත නොදී ඉන්න පුළුවන්. සාමාන්‍ය මනුස්සයෙක් වගේ නම්. පොලිසියෙ ආමි එකේ වගේ නම් එයාලට බලය තියෙනවනෙ. ආමි එකේ වුණත් අපිව අල්ලගෙන ගිහින් පොලිසියට බාර දෙනවනෙ. එතකොට අපිට කර කියාගන්න දෙයක් නැති වෙනව ’

වත්සලා, කොළඹ, බස්නාහිර පළාත

## 5.10. සන්නිවේදන තාක්ෂණය අනිසි ලෙස භාවිත කිරීම

ලිංගික අල්ලස් සඳහා සන්නිවේදන තාක්ෂණය අනිසි ලෙස භාවිත කරන ආකාරය සම්බන්ධයෙන් සම්මුඛ සාකච්ඡාවලට සහභාගි වූ කිහිප දෙනෙක්ම කතා කළහ. ඇතැම් අවස්ථාවල දී, රාජ්‍ය නිලධාරීන් හෝ වෘත්තිකයන් ලිංගික අල්ලස්වලට ගොදුරුවූවන් ඉලක්ක කර ගැනීම සඳහා ඔවුන්ගේ නිල රාජකාරි කටයුතුවලදී ඔවුන්ට ලබා ගත හැකි සම්බන්ධතා තොරතුරු භාවිත කර ඇත. ලිංගික අල්ලසක් ඉල්ලා සිටි අපරාධකරු විසින් දුරකථනයෙන් නැවත නැවතත් හිරිහැර කිරීම ගැන වින්දිතයින් කිහිප දෙනෙක්ම කතා කළහ. තවත් අවස්ථාවලදී, වට්ස්ඇප් (WhatsApp) වැනි සමාජ මාධ්‍ය වේදිකා හරහා අපරාධකරුවන් විසින් සමීප ඡායාරූප ඉල්ලා සිටි අවස්ථා ද ඇත.

‘ මට හරි කරදරයක් වුණා මේක. මම ෆෝන් එක විසන්ධි කරල තියන්න පටන් ගත්තා. ඉස්පිරිතාලෙන් මහත්තය ගැන කෝල් එකක් ආවත් මට ඒක ගන්න විදිහක් නෑ. ෆෝන් එක ඔන් කරපු ගමන් කතා කරනවා. කතා කරන්නෙම රෑට. පැය බාගෙ පැය කතා කරනවා. මම සතියක් විතර ඉස්පිරිතාලෙට යන්නෙත් නැතුව හිටියා. ’

සීතා, හැටන්, මධ්‍යම පළාත

‘ මට එන්න කියල තර්ජනයක් හරි කරයි කියල මම බය වුණා. මොකද මම තනියමනෙ ඉන්නෙ. එයා සම්පූර්ණයෙන්ම මගෙ පෞද්ගලික විස්තර දන්නවනෙ. ’

රමණී, නුවර, මධ්‍යම පළාත

‘ මං පුළුවන් උදව්වක් කරන්න ඕන නිසා නම්බරේ ගත්තා කිව්වා ෆෝන් එකෙන් කවුන්ටරේදී.

මට කිව්වෙනම් නම පුෂ්පානන්ද කියලා. ඒවුනාට ඒ බොරු නමක් ’

ගයනි, හම්බන්තොට, දකුණු පළාත

‘ ඊට පස්සෙ එදා රෑ ඉඳන්ම කෝල් කරන්න පටන් ගත්තා. දිගින් දිගටම කෝල් කරන්න ගත්තා. වට්ස්අප්වලට වොයිස් මැසේජස් එවන්න පටන් ගත්තා. ඊට පස්සෙ මම සැමියාට මේ අංකය දුන්නා. සැමියා එයාට කතා කරලා මට කතා කරන්න එපා කියල කියල තිබුණා. ඒ අහන්නෙත් නෑ. නිතරෝම ගන්නවා. ’

මාලනී, නුවර, මධ්‍යම පළාත

ලිංගික අල්ලස් ලබාගැනීමට සහ ඊට සම්බන්ධ වීමට ඩිජිටල් තාක්ෂණය ඇතුළු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම මෙයට වෙනත් මානයන් ද එකතු කරයි. සම්බන්ධතා තොරතුරු අනවසරයෙන් භාවිත කිරීම පුද්ගලිකත්වය සඳහා පුද්ගලයාගේ අයිතිය උල්ලංඝනය කිරීමකි. ඩිජිටල්කරණය වූ ලිංගික අල්ලස් මගින් වින්දිතයෙකු වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම්වලට ලක්වීමේ ඉතා බරපතල අවදානමකට ලක් කරයි. බොහෝ වින්දිතයින් සම්බන්ධ කර ගෙන ඇත්තේ වට්ස්ඇප් දුරකථන ඇමතුම්, ෆේස්බුක් සහ කෙටි පණිවුඩ හරහා වේ.

‘ අන්තිමට මම ඒ නම්බර් එක බ්ලොක් කළා. ඊට පස්සෙ මට වෙන අංකයකින් ගන්න පටන් ගත්තා. ’

ලලිතා, මාතලේ, මධ්‍යම පළාත

‘ ඊට පස්සෙ මට රෑට වීඩියෝ කෝල්ස් ගන්නවා උසාවි යන රාළහාමි. කෝල් අරන් කෑවද බිබ්වද මොකද කරන්නෙ කියල අහන්න ඕනෙ නෑනෙ මිස්..

දවල්ට නෝමල් කෝල්ස් ගන්නවා. රෑට වීඩියෝ කෝල්ස් ගන්නවා. මම වීඩියෝ කෝල්ස්වලට ආන්සර් කළේම නෑ. මහත්තය ගැන තොරතුරු කියන්නම් කිව්ව නිසා තමයි මම දවල් එන කෝල්ස්වලට ආන්සර් කළේ. ’

මනෝරි, නුවර, මධ්‍යම පළාත

‘ මාත් එක්ක හිටිය එකා මට ඊට පස්සෙ වට්ස්අප් මැසේජ් කළා. ෆොටෝ එක එක ඒවා නිරුවත් ලිංගික ස්ථානවල ඒව එව්වා. අයෙත් හම්බවෙන්න ඕනෙ කිව්වා. මම ඒ හැම එකක්ම මග ඇරියා. අනික් කෙනා කොහොමත් මගෙ යාළුවත් එක්කනෙ හිටියෙ. මට එයා ගෙන් බලපෑමක් වුණේ නෑ. යාළුවටත් එයාගෙන් කරදරයක් වෙලා තිබුණෙ නෑ. ’

වත්සලා, කොළඹ, බස්නාහිර පළාත

> “මම මේවට එකඟ වෙන්නෙ නෑ කියල කිව්වට පස්සෙ බේරෙන්නම බැරි තැන මම ෆෝන් එකෙන් නොම්බරේ බ්ලොක් කළා. බ්ලොක් කරල තමයි ක්ලිනික් එකට ගියෙ. ක්ලිනික් ගියාම තරහ පෙන්නුවා. කතා කළේ නෑ. රවාගෙන හිටියා. එක සැරයක්වත් කතා කළේ නෑ. අන්තිමට පෝලිමේ ඉන්න නොම්බරේ අරන් තිබ්බෙ නෑ. එදා අපි 2 විතර වෙනකල් පෝලිමේ හිටියා. ඊට පස්සෙ තමයි මම ක්ලිනික් යන එක නතර කළේ.”
>
> රාණි, මාතලේ, මධ්‍යම පළාත

> “මාව ෆේස්බුක් එකට ඇඩ් කරගෙන මට ඒ රික්වෙස්ට් එක ඕකේ කරන්න කියලත් බල කළා. ඊට පස්සෙ ෆේස්බුක් එකෙනුත් චැට් කරන්න පටන් ගත්තා. වට්ස්ඇප් වලින් තමයි වීඩියෝ කෝල්ස් නම් ගත්තෙ.’ සහ ‘මම කොයි තරම් අකමැති වුණත් ෆේස්බුක් එකේ මහත්තය එනකම්ම වගේ මම එයාව බ්ලොක් කළේ නෑ. මම බය වුණා.’”
>
> මනෝරි, නුවර, මධ්‍යම පළාත

සන්නිවේදන තාක්ෂණය සහ සමාජ මාධ්‍ය වේදිකා ලිංගික අල්ලස්වලට ගොදුරුවූවන් මුහුණ දෙන අවදානම් තවත් වැඩි කරයි. ලිංගික අල්ලස් ඉල්ලීම ශාරීරික හමුවීමකින් පසුව දිගටම කරගෙන යා හැක. බොහෝ අවස්ථාවලදී, දත්ත රහස්‍යතාව උල්ලංඝනය කිරීම ද මෙයට ඇතුළත් වේ. එක් එක් සිද්ධියේ බල ගතිකත්වය හේතුවෙන්, වින්දිතයින් හට ජංගම දුරකථන සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා පැමිණෙන මෙවැනි ඉල්ලීම් හා ඉදිරිපත් වීම්වලට එරෙහි වීමට නොහැකි වේ.

## 5.11. වසංගතයේ බලපෑම

අධ්‍යයනයට සහභාගීවූවන් විසින් විස්තර කරන ලද ලිංගික අල්ලස් පිළිබඳ සිදුවීම් කෙරෙහි වසංගතය ද බලපා ඇත. ඇතැම් අවස්ථාවලදී, උදාහරණයක් ලෙස, මධ්‍යම පළාතේ රාණි සඳහන් කළ පරිදි, රට වසා දැමීමේදී සංචරණය සීමා වීම යම් මට්ටමක ආරක්ෂාවක් ලබා දී ඇත.

තවත් සමහර අවස්ථාවලදී, එය LGBTQI ප්‍රජාවේ කාන්තාවන් සහ සාමාජිකයින් ලිංගික අල්ලස් අවදානමට ලක් කරන ලදි. වසංගතය ලිංගික අල්ලස් සඳහා ඉඩහසර පාදමින් අවශ්‍යතා උත්සන්න කරන ලදි.

> “ඒ කාලේ කොරෝනා ආපු අලුතනෙ. මිනිස්සුන්ට එක එක වැරදි ආකල්ප තිබුනා. ඒ නිසා මිනිස්සු කැමති වුනෙ නෑ බෝඩිං දෙන්න.”
>
> ප්‍රියා, හම්බන්තොට, දකුණු පළාත

> “ආමි එකේ අය. රතු පාට කැබ් එකක ඇවිත් අපේ යාළුවයි මමයි කොරෝනා මුල්කාලෙ අපි දෙන්නත් ගෙවල්වල සල්ලි නෑ, කන්න නෑ. අපි දෙන්න රෑ 7 ට විතර ගිහින් 12 වෙද්දී එන්න බලන් ගියා. ඒ කාලෙ රෑ 11 ට රට වහනවා. අපි දෙන්නත් හිතුවෙ නෑ නෝමල් කැබ් එකක්නෙ. අපි දෙන්නට නැගපන් නැගපන් කිව්වා. අයිඩී එක ඇහුවා. නැගපන් කිව්වා. අපි නැග්ගා. අපි දෙන්නව රාගම ට කිට්ටු වෙන්න කඳාන පොලිසියට කිට්ටු තැනකට එක්ක ගියා. පොලිසියට බාර දෙනව කිව්වා. උඹලට ජොබ් කරන්න බැරිද කියලා අපිට බැන්නා. ඒත් ඉන්ටව්ව් එකකට ගියත් කෝල් එකක් දෙන්නම් කියල අපිව

හලනවා. අපි මේව කාට කියන්නද? ’

වත්සලා, කොළඹ, බස්නාහිර පළාත

ඉලක්කගත අධ්‍යයනයක් අවශ්‍ය වේ. වෙනත් සමාන අර්බුදවල බලපෑම තේරුම් ගැනීමට එය උපකාරී වනු ඇත.

## 5.12. වෙනත් අදහස්

ඉහත තේමාවන්ට අමතරව වඩාත් ගැඹුරු සම්මුඛ සාකච්ඡාවලින් මතු වූ පහත දැක්වෙන අදහස් රසවත් ය. ලිංගික අල්ලස් සාමාන්‍ය සිදුවීමක් වශයෙන් සලකන අදහස් ද වින්දිතයින් විසින් එලකර තිබුණි. වින්දිතයින් සෑම අවස්ථාවකදීම සම්පූර්ණයෙන්ම අසරණ නොවන බව ලලිතා විසින් අදහස් දක්වා තිබුණි.

‘ හැම තැනකම මේ වගේ දේවල් වෙනව ඇති, ඒවට අහු වෙන අයත් ඇති කියල මට හිතුණා. හැබැයි ඔළුව පාවිච්චි කළොත් අපිට බේරිලා ඉන්න පුළුවන් කියලත් මට හිතුණා. ’

ලලිතා, මාතලේ, මධ්‍යම පළාත

ඇතැම් වින්දිතයින් ඔවුන්ගේ නියෝජිතායතනයේ ක්‍රියාකාරී ව්‍යායාමයක් හරහා ලිංගික අල්ලස්වලට එරෙහිව කටයුතු කර ඇත. නීතියට පිටින් ගිය සහ ප්‍රචණ්ඩත්වයට යොමු වූ අවස්ථාවක් ලක්ෂ්මි විසින් සිහිපත් කළාය. ගයනි සහ ලලිතා දෙදෙනාම ලිංගික අල්ලස්වලට එරෙහිවීම සඳහා වාචික බලය යෙදවූ ආකාරය පිළිබඳ අදහස් දක්වන ලදි.

‘ ඉතින් ඊට වැඩි දවසක් නෑ ඌ ඒ ගමේම අක්කෙක්ටත් ඔය විදියටම කරන්න හදලා ඒකි ගහලලු.. ගමේ එවුනුත් කේස් දාලා ඒකාලෙම පැන්නුවා ගමෙන්. ’

ලක්ෂ්මි, හම්බන්තොට, දකුණු පළාත

‘ ඌට මොනව කියලා බැන්නද කියලා මටවත් මතක නෑ. ආයි නෑ පැය භාගෙ කට වඩා බැන්නා. මූ ඉන්නවා ගොලුවා වගේ. එතනින් එච්චරයි හැබැයි ආයි කෝල් ආවෙ නෑ. ’

ගයනි, හම්බන්තොට, දකුණු පළාත

‘ කෑගහලා එලියට බැහැලා එද්දි මූට විලිලැජ්ජාවනේ.. මගේ කටත් හිමින් නෙවෙයි. පුටුවත් පෙරලුනා මගේ අතින්... මූ දැන් කරගන්න දෙයක් නැති නිසා කියනවා... විහිළුවක්ලු කරෙත්.’ සහ ‘හිනායන වැඩේ තමයි මං රට ගියා කොහොමහරි පොලිස් රිපෝට්.’ ’

ජේයා, ගාල්ල, දකුණු පළාත

## 5.13. යොමුගත කණ්ඩායම් සාකච්ඡා (FGD) තුලින් වැඩිදුර අදහස්

විශේෂයෙන්ම ලිංගික අල්ලස් හි පුද්ගලික බලපෑම, වරදට පිළියම් සෙවීමට ඇති අකමැත්ත සහ ලිංගික අල්ලස්වල ප්‍රචලිතභාවය පිළිබඳව වඩාත් ගැඹුරු සම්මුඛ සාකච්ඡා තුළින් ලබාගත් අවබෝධය යොමුගත කණ්ඩායම් සාකච්ඡා මගින් තහවුරු කරන ලදී. බොහෝ අය විශ්වාස කළේ ලිංගික අල්ලස්

නිශ්චිතවම අපරාධයක් බවට පත්කළ යුතු බවත් වැරදිකරුවන්ට දඬුවම් දිය යුතු බවත්ය. කෙසේ වෙතත්, LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් සමඟ FGD සැලකිය යුතු අවබෝධයක් ලබා දුන් අතර එය තවදුරටත් පහතින් සාකච්ඡා කෙරේ.

විශේෂයෙන්, යොමුගත කණ්ඩායම් සාකච්ඡා වල සිටි බොහෝ දෙනෙකුට ලිංගික අපරාධ වඩාත් පුළුල් ලෙස සහ ලිංගික අල්ලස් විශේෂයෙන් වෙන්කර හඳුනාගත නොහැකි විය. එපමණක් නොව, ඔවුන් ලිංගික අල්ලස් ඉල්ලා සිටි පෞද්ගලික සහ රාජ්‍ය ක්‍රියාකාරීන් අතර වෙනස හඳුනා ගත්තේ නැත. ලිංගික අල්ලස් ඉල්ලා සිටි බැංකු කළමනාකරුවන්, විදුලි සංදේශ නියෝජිතයන්, පෞද්ගලික රසායනාගාර සහ ක්ෂුද්‍ර මූල්‍ය නියෝජිතයන් ඇතුළු පුද්ගලික ක්‍රියාකාරීන් පිළිබඳ උදාහරණ කිහිපයක්ම සහභාගිවන්නන් විසින් ඉදිරිපත් කරන ලදී.

## 5.13.1. LGBTQI ප්‍රජාවගේ අදහස්

මෙම යොමුගත කණ්ඩායම් සාකච්ඡා මගින් LGBTQI ප්‍රජාව අතර ලිංගික අල්ලස් සිදුවීම්වල පැහැදිලි සංකීර්ණතාවයේ අමතර ස්ථර ඉස්මතු කර ඇත. සහභාගිවූවන්ගෙන් බොහෝ දෙනෙක් ලිංගික ශ්‍රමිකයෝ වූහ. ඔවුන්ට ලිංගික අල්ලස් සම්බන්ධයෙන් නීතියෙන් ආරක්ෂාවක් නැති තරම්ය. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව සුළුතරයක් වූ පුද්ගලයන් සහ වාණිජ ලිංගික ශ්‍රමිකයන් සඳහා පිළිගැනීමක් නොතිබීම යන්නෙන් ඔවුන් නීතියෙන්ම කොන් කර ඇති බව අදහස් වේ.

මෙම නීතිමය සන්දර්භය යටතේ, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවල සහභාගිවන්නන්ට අනුව, පොලිස් නිලධාරීන් ලිංගික අල්ලස් ඉල්ලා සිටීම සඳහා ඔවුන්ගේ අභිමතය අනිසි ලෙස භාවිත කරති. මෙම යථාර්ථය පිළිබිඹු කරමින්, සහභාගිවන්නන් පහත දැක්වෙන ආකාරයෙන් ලිංගික අල්ලස් විස්තර කළහ.

> ‘ තමුන් බේරෙන්න ඇඟ දීල බේරෙන එක ’
>
> නිමාලි, FGD, බස්නාහිර පළාත

> ‘ ලිංගික අල්ලස කියන්නෙ ඉතින් චාන්ස් එකක් දුන්නොත් අරිනව කියන එක තමයි. පොලිසියෙන් අපිව ඇල්ලුව කියමු. පොලිසිය සමහර වෙලාවට සල්ලි පනම් අපෙන් ඉල්ලන්නෙ නෑ. උඹල අපිට පොරක්/සැපක් දුන්නොත් අපි යන්න දෙනව කියල තමයි කියන්නෙ. ’
>
> FGD, බස්නාහිර පළාත

> ‘ අපේ ඇඟ බලෙන් නෙ එයාල ගන්නෙ. ඒ නිසා නීතියෙන් තහනම් ඇති ’
>
> FGD, බස්නාහිර පළාත

LGBTQI පුද්ගලයන්ට සහ වාණිජ ලිංගික ශ්‍රමිකයින්ට නීතිමය රැකවරණයක් නොමැති වීම පොලිස් නිලධාරීන් විසින් ප්‍රයෝජනයට ගැනීමට උත්සාහ කරන බවක් පෙනේ.

> ‘ එක සැරයක් මං වැඩක් කර කර හිටියා මෙතැන පාලම ගාව. සිවිල් පිට මිනිහෙක් ඇවිත් ටෝර්ච් එක ගැහුවා. ඊට පස්සෙ අර මාත් එක්ක හිටිය කස්ටමර් ගෙන් රුපියල් 2500 ක් ගත්තා. ඒ සිවිල් පිට ආව පොලිස්කාරයා මාව දන්නවා. අපේ ඒරියා එකනෙ. ඒ නිසා මට යන්න කිව්වා. ඊට පස්සෙ ඇවිත් මගෙන් ඇහුවා "උඹ වැඩේ කරාද " කියලා. මම කිව්වා "මට වැඩේ කරන්න දුන්නෙ නෑනෙ සර් ආවනේ" කියලා. ඊට පස්සෙ ඉතින් පොලිස්කාරයා අර අල්ලස් ගත්ත එකෙන් රුපියල් 500 ක් මට දීල ගියා. (සිනාසෙයි) ’
>
> කුමාරි, FGD, බස්නාහිර පළාත

‘

ගාල හන්දියෙ අපි 3 දෙනෙක් ඉන්නවා. අපි ඉද්දි අපිට පොලිසියෙන් කිව්වා, මේ පාර සල්ලි නොදුන්නොත් උඹල තුන්දෙනාම අල්ලලා මාස 6කට දානව ඇතුළට කිව්වා. නිලූගෙන් රුපියල් 5000 ක් ඉල්ලලා තිබ්බා. එක සැරයක් නැගපන් ජිප් එකට කිව්වම මම දුවගෙන ගිහිල්ලා අනුරාධපුර බස් එකට නැගලා පට්ටිය හන්දියෙන් බැස්සා (සිනාසෙයි) ඒවෙද්දි නිලූ රුපියල් 5000 ක් අරන් දීල තිබුණේ. පස්සෙ ආරංචි කරල බලද්දි අල්ලසත් අරන් උසාවිත් දාල දඩයකුත් ගහලා. මාවත් කොයි වෙලාවෙ හරි ගෙනියනවා, මම දන්නවා. ’

නිමාලි, FGD, බස්නාහිර පළාත

‘

ට්‍රාන්ස් කෙනෙක් ඇවිත් තව කෙනෙක් එක්ක සෙක්ස් කරනකොට ගෑණු කෙනෙක් එක්ක ඉන්නව වගේනෙ පේන්නෙ. නමුත් අතන පිරිමි දෙන්නෙක් සෙක්ස් කරද්දි එයාල ව අල්ලලා, ගෙවල්වලට කියනවා, පවුල්වලට කියනවා කියල බය කරලා සමහර වෙලාවට ඒ පිරිමි කෙනා බැඳපු කෙනෙක් වෙන්න පුළුවන්, දරුවො ඉන්න කෙනෙක් වෙන්න පුළුවන් ලිංගික අල්ලස් ගන්න ලේසියි. ඒ කට්ටිය මං හිතන්නෙ අපිට වඩා ලිංගික අල්ලස්වලට ගොදුරු වෙනවා ’

කුනි, FGD, බස්නාහිර පළාත

ලිංගික ශ්‍රමිකයන් අපයෝජනය කිරීමට සහ ඔවුන්ගෙන් අයුතු ප්‍රයෝජන ගැනීමට බාහිර පුද්ගලයන් පොලිස් නිලධාරීන් ලෙස පෙනී සිටීම මෙම තත්ත්වය තවත් තීව්‍ර කරයි.

‘

සමහර වෙලාවට සිවිල් පිට එන අය තමන් පොලිසියෙ කියල කියනවා. අපි ගොඩක් වෙලාවට කෝ දෙන්න ඔයාගෙ අයිඩෙන්ටි කාඩ් එක කියල ඉල්ලන්නෙ නෑ. එතකොට අපි කියනවා, හරි මොකක්ද වෙන්න ඕනෙ කියලා. එතකොට එයාල කියනවා, අපි ඔයාලව දාල යන්න නම් අපිත් එක්ක සෙක්ස් කරන්න කියලා. ’

සකුනි, FGD, බස්නාහිර පළාත

‘

රාත්‍රී කාලෙ අපි 9 ට වගේ ට්‍රාන්ස් කාන්තාවක් විදිහට පාරෙ යනකොට ඒ වගේ අල්ලස් සිද්ධි ගොඩක් වෙනවා. ඉසූටයි මටයි මේක වුණේ. අපි ඒ වෙද්දි පාන්දර වෙනකල්ම වැඩක් කරගෙන තිබුණෙ නෑ. ඒ එක්කම පොලිසියෙන් ආවා. අපි කිව්වා, අපි කීයක් හරි හොයාගන්න කියලා. අපිට තිත්ත කුණුහරුපෙන් බැන්නා තොපිට එන්න එපා කියල තියෙනව නේද කියලා. බයික් එකේ දෙන්නෙක් ආවෙ. ඉතින් අපි දෙන්න ඒ එක්කෙනා එක්කෙනා එක්ක හිටියා. අපි කිව්වා, රුපියල් 100 ක් හරි දෙන්න සර් කියලා ඉස්සෙල්ලම වැඩේනෙ කියලා. කඩේකට ගියත් උදේ පාන්දර අපිට ණයට බඩුවක් දෙන්නෙ නෑනෙ. ඒ වගේ අපි කිව්වා, අපිට රුපියල් සීයක් හරි දෙන්න කියලා. ඒ වුණාට අපිට වැඩෙත් කරලා, අපිට කුණුහරුපෙන් බැනලා, අපිව තල්ලු කරලත් ගියා. (මහ හඬින් සිනාසෙයි) ’

අන්ජු, FGD, බස්නාහිර පළාත

සහභාගිවන්නෙකු ලිංගික අල්ලස්වල බිහිසුණු ස්වභාවය පිළිබඳ අදහස් පළ කළේය. ලිංගික ශ්‍රමිකයන් විසින් මුහුණදෙන බිහිසුනු අත්දැකීම් මෙයින් හෙළිදරව් වේ.

> ලිංගික අල්ලස් ඉල්ලලා එහෙම ගියාම අපි අපා දුක් විඳින්න ඕනෙ. නරුමයො වගේ උන් ඉන්නෙ. සමහරක් වෙලාවට හපනවා, ඕරල් සෙක්ස් කරන්න ගියාම ලිමිට් එකක් නෑ. උගුරෑ දණ්ඩවල් කඩාගෙන යනවා. බෙල්ලෙ පොට යනවා. ඒ ගොල්ලන්ගෙ අත් දරදඬුයිනෙ. අත් දෙකෙන්ම අල්ලන් කොණ්ඩෙන් ඇදගෙන ඉඳල ගන්න දෙයක් නෑ. දවස් ගාණක් යනකල් රිදෙනව
>
> වත්සලා, FGD, බස්නාහිර පළාත

LGBTQI ප්‍රජාවේ සාමාජිකයන් නීතියෙන් කොන් කර ඇති අතර සමාජයෙන් ද අපකීර්තියට පත් වී ඇති නිසා, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගිවන්නන් සඳහන් කළේ ලිංගික අල්ලස් ලබා දීමට සිදුවන මුණගැසීම් වලින් පසුව, ඔවුන්ට සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වීම දුෂ්කර බවයි.

> අපි STD සායන ක්ලිනික්ස්වලට ගියාම ලොකු ප්‍රශ්න එනවා. 2019 අවුරුද්දෙ වගේ ට්‍රාන්ස් අයයි අනික් අයයි ඔක්කොම එකම සායනයකට තමයි ගියේ. එතකොට සංක්‍රාන්ති ලිංගික ලිංගික ශ්‍රමිකයෙක් ට්‍රාන්ස් සෙක්ස්වර්කර් කෙනෙක් නම්, ගේට්ටුවෙ ඉඳන්ම ප්‍රශ්න. අපි රුපියල් 100 ක් - 50 ක් දීල තමයි ඇතුළට යන්නෙ. දැන් නම් STD සායන ක්ලිනික්වලට යන්නෙ නෑ. අපි ඒවයින් ඈත් වෙලා. අනික දැන් නම් සංක්‍රාන්ති ලිංගික ට්‍රාන්ස් අයට වෙනම සායනයෙ ක්ලිනික් එකේ ඉඩ වෙන්කරල තියෙනවා.
>
> කුනි, FGD, බස්නාහිර පළාත

වසංගතය ඔවුන්ට ඇති ලිංගික අල්ලස් අවදානම තවදුරටත් වැඩි කළේය. සංචරණය සීමා කිරීම හේතුවෙන් ඔවුන්ට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යයේ ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය උපත් පාලන කොපු වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව අහිමි විය.

> අපිට ලොක්ඩවුන් වුණාම කොන්ඩම් ගන්න තැනක් තිබුණෙ නෑ, ආයතනවල (සිවිල් සංවිධානවල) කොන්ඩම් තිබුණත් අපිට ඒව ඩිලිවරි කර ගන්න ක්‍රමයක් තිබුණෙ නෑ. අපේ යාළුවෙක් හිටියා, X කියලා. කාන්තා ලිංගික සේවිකාවක් කෙනෙක්. එයා අයිස් මත්ද්‍රව්‍ය භාවිත කරන නිසා අපි එයාට 'අයිස්' කියල තමයි කියන්නෙ. මෙයාට කෝවිඩ් කාලෙ කොන්ඩම් නැතුව පොලිසියෙ කෙනෙක් සෙක්ස් කරල මෙයා ප්‍රෙග්නන්ට් වුණා. දරුවා නැති කරන්න ගොඩක් එක එක දේවල් කළා. බබා හම්බවෙන්න ගිහින් ගොඩක් අමාරු වෙලා ගොඩක් කෑ ගැහුවා. දරුවා හම්බවුනාට පස්සෙ පොලිසියෙ එක්කෙනෙකුටම බබාව වික්කා. අතේ තිබුණු සල්ලිත් අරගෙන තමයි මෙයාට කරදර කරල තිබුණේ. කොරෝනා ආව කාලෙ මේක වුණේ. එයාට පාරෙ ඉන්න දෙන්න නම් එහෙම කරන්න කියල බල කරලා, බය කරල තිබුණා. එයා අදටත් මේක ගැන කතා කරන්න කැමති නෑ, ඒත් මුල දවස්වල අපිත් එක්ක විස්තර ටිකක් කිව්වා
>
> කුනි, FGD, බස්නාහිර පළාත

සහභාගීවන්නන්ගේ දෘෂ්ටිකෝණයෙන්, ලිංගික අල්ලස් යනු යමක් වෙනුවෙන් යමක් ලබාදීමක් වේ. නීතිය ඔවුන්ට නිශ්චිත අයිතිවාසිකම් ලබා නොදේ. නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සතුටු කිරීම සඳහා ලිංගික ඉල්ලීම්වලට අවනත වීමෙන් ඔවුන්ගේ පැවැත්ම සහ ඔවුන්ගේ වැඩ කටයුතු පවත්වාගෙන යාම සඳහා දිනපතා කේවල් කිරීමට ඔවුන්ට සිදුවී තිබේ.

‘

අපි උසාවියෙ නඩුව ඉවර වෙනකල් මිස් අපේ වැඩ ඔක්කොම පැත්තක තියල උසාවි නගින්න ඕනෙ. අපිට ඒ වෙන පාඩුව කවුරුවත් ගෙවන්නෙ නෑ. ඒ නිසා අපි මොනව හරි කරල නීතියෙන් බේරෙන්න තමයි බලන්නෙ. අපි යන්නෙ නෑ කළුගල් එක්ක ඔළුව හප්පගන්න - කුමාරි ’

කුමාරි, FGD, බස්නාහිර පළාත

‘

පොලිසියෙ අය ලිංගික අල්ලස් ගත්තාම මිස්, ඒක එයාල තව අය එක්ක කියනවා. එතකොට තව කට්ටිය අපිව හොයාගෙන එනවා ආරංචියට. අපිට හරිම කරදරයි ’

වත්සලා, FGD, බස්නාහිර පළාත

‘

තමන්ට බේරිලා යන්න මම නම් ලිංගික අල්ලස් දෙනවා ’

වත්සලා, FGD, බස්නාහිර පළාත

‘

ට්‍රාන්ස් කෙනෙක් නිසා මම බයයි ඒකට විරුද්ධ වෙන්න ’

කුනි, FGD, බස්නාහිර පළාත

‘

මගෙ රැකියාව කරගන්න ඕනෙ නිසා මම නම් දෙනවා ’

වත්සලා, FGD, බස්නාහිර පළාත

‘

බේරිලා යන්න ඕනෙ නිසා දෙනවා ’

නාමලි, FGD, බස්නාහිර පළාත

## 5.14. ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡාවල (KII) අදහස්

මෙම අධ්‍යයනයේ ආයතනික අවධානය යොමු වී ඇත්තේ සෞඛ්‍ය සහ යුක්තිය යන අංශ කෙරෙහිය. ඉහතින් සලකා බැලූ වඩාත් ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ යොමුගත කණ්ඩායම් සාකච්ඡා, ලිංගික අල්ලස් අපරාධකරුවන් විසින් පවත්නා ක්‍රියා පටිපාටි සහ ආයතනික විධිවිධාන අවභාවිත කරන බව හෙළි කරයි. බන්ධනාගාර නිලධාරීන් විසින් රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයන් බැලීමට යාමේ අයිතිය පිළිබඳ අභිමතය ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය අංශයේ ස්ථාන මාරුවීම් හෝ නේවාසිකාගාර පහසුකම් තීරණය කිරීමේදී අභිමතය ක්‍රියාත්මක කිරීම හෝ පුද්ගලයන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් පොලිසිය විසින් අනුගමනය කරන පසුවිපරම් ක්‍රියාමාර්ග ඊට උදාහරණ වේ. එපමණක් නොව, වර්තමාන ආයතනික භාවිතයන් තුළ ලිංගික අල්ලස් ප්‍රායෝගික ලෙස වැළැක්වීමේ යාන්ත්‍රණ ඇතුළත් නොවේ. අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සඳහා අවම ඉඩක් තබමින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටීන්හි ශක්තිමත් බව සහතික කිරීමට ප්‍රතිපත්ති හෝ වැඩසටහන් ක්‍රියාත්මක නොවේ. පැමිණිලි කිරීමට හෝ විකල්ප ක්‍රියාමාර්ග යක් සෙවීමට යාන්ත්‍රණයක් නොමැත.

සෞඛ්‍ය සහ අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රධාන තොරතුරු සපයන්නන් 12 දෙනෙකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා මගින් වඩාත් ගැඹුරු සම්මුඛ සාකච්ඡාවල සොයාගැනීම් සනාථ විය. මෙම ප්‍රධාන තොරතුරු

සපයන්නන්ට ලිංගික අල්ලස් හඳුනා ගැනීමට සහ පැහැදිලි කිරීමට හැකි විය. මෙය දැනටමත් අල්ලස් ගැනීම වනාහි අපරාධයක් වන සාමාන්‍ය නීතිය යටතේ, වරදක් බව බොහෝ දෙනා දැන සිටියහ. මෙම කණ්ඩායමට උපදේශක මනෝ වෛද්‍යවරියක් (ජාතික මට්ටම, බස්නාහිර පළාත), පශ්චාත් උපාධි අභ්‍යාසලාභී වෛද්‍යවරියක් (ජාතික මට්ටම, බස්නාහිර පළාත), කාන්තා පොලිස් පරීක්ෂකවරියක් (මධ්‍යම පළාත) සහ නීතිඥවරියක් (බස්නාහිර පළාත) ඇතුළත් විය. කෙසේ වෙතත්, බොහෝ දෙනා සඳහන් කළේ ලිංගික අල්ලස් නිශ්චිතව අපරාධයක් බවට පත් කර නොමැති බවයි. රෝගීන්ගෙන් මෙන්ම වෛද්‍යවරුන්ගෙන් සිදුවන ලිංගික හිරිහැර පිළිබඳව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට පැමිණිලි ලැබෙන බව සම්මුඛ සාකච්ඡාවට එක් වූ අයෙක් අදහස් දැක්වීය.[43] මෙම පැමිණිලිවලට ලිංගික අල්ලස් ද ඇතුළත් දැයි පැහැදිලි නැත.

අධිකරණ ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන තොරතුරු සපයන්නෙකු සඳහන් කළේ, ලිංගික අල්ලස් එම ක්ෂේත්‍රය තුළ සිදුවන නමුත් 'ද්විතියික වින්දිතභාවය'ට පත්විය හැකි බැවින්, එනම් අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය මගින් හිංසනයට ලක්වීම, මිනිසුන් විධිමත් ලෙස පැමිණිලි කිරීමට මැලි වන බවයි.[44] සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ මෙම පුද්ගලයා විස්තර කළේ 'නුසුදුසු ඉදිරිපත් වීමක් හෝ ලිංගික අනුග්‍රහයක් සඳහා ඉල්ලීමකට ඔරොත්තු දීමට නොහැකි ඕනෑම අයෙක්' ලිංගික අල්ලස් හි වින්දිතයෙකු බවයි.[45] මෙම ප්‍රධාන තොරතුරු සපයන්නා විසින් ලිංගික අල්ලස් සිදුවීම සඳහා ප්‍රධාන සාධකයක අන්‍යෝන්‍ය ප්‍රතිලාභ යන්න දක්වන ලදී. නීති වෘත්තියේ ප්‍රධාන තොරතුරු සපයන්නෙකු සඳහන් කළේ 'ලිංගික අල්ලස්වලට ගොදුරු වූවන්ගෙන් බහුතරයක් නීති වෘත්තියේ කනිෂ්ඨ කාන්තා නීතිඥවරියන් විය හැකි' බවයි.[46] තවත් ප්‍රධාන තොරතුරු සපයන්නෙක් සඳහන් කළේ ලිංගික අල්ලස් සිදු වන්නේ 'වින්දිතයාට එක් වරකට වඩා අපරාධකරුවෙකු සමඟ සම්බන්ධ වීමට සිදුවන අවස්ථාවලදී' බවයි.[47] රාජ්‍ය අංශයේ ප්‍රමාදයන් සහ අකාර්යක්ෂමතාවයන් තවදුරටත් වින්දිතයින් ලිංගික අල්ලස් අවදානමට ලක්කරන බව එම පුද්ගලයාම සඳහන් කළේය.[48] තවත් ප්‍රධාන තොරතුරු සපයන්නෙක් ප්‍රකාශ කළේ අධිකරණ නිලධාරීන් විසින් සිදු කරන ලද ලිංගික අල්ලස් සම්බන්ධයෙන් ඇය අධිකරණ සේවා කොමිෂන් සභාවට (JSC) පැමිණිලි කර ඇති බවයි. අධිකරණ සේවා කොමිෂන් සභාව එවැනි අවස්ථාවලදී මහේස්ත්‍රාත්වරයා මාරු කර ඇති නමුත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැති බව ඇය සඳහන් කළාය.[49] ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ මතය වූයේ අපරාධකරුවන් සාමාන්‍යයෙන් පිරිමින් වන අතර ඔවුන් අධිකාරිය පිළිබඳ තම සාපේක්ෂ තත්වයෙන් හෝ වරප්‍රසාදයෙන් ප්‍රයෝජන ගනිමින් වින්දිතයන් හට ලිංගික අල්ලස් ලබාදීමට බල කරන බවයි. එක් ප්‍රධාන තොරතුරු සපයන්නෙකු සඳහන් කළේ සමලිංගික සබඳතාවල යෙදෙන කාන්තාවන් අපරාධකරුවන් වූ අවස්ථා පිළිබඳව ඇය අසා ඇති බවයි.[50] බොහෝ විට කාන්තා සුළු කාසේවකයන්, සමලිංගික සබඳතා පවත්වන තරුණයන්, කනිෂ්ඨ කාන්තා වෛද්‍යවරුන් සහ සීමාවාසිකයින් සහ පොදුවේ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් වින්දිතයන් වශයෙන් හැඳින්වෙන ලදි.[51]

ලිංගික අල්ලස් 'සමාජය තුල කාන්තාවන් පිළිබඳ පවත්නා දැක්ම' හා සම්බන්ධ වන බව නිරීක්ෂණය විය.[52] සම්මුඛ සාකච්ඡාවට සහභාගී වු තවත් අයෙක් දුප්පත්කම සහ භාෂා ගැටළු දායක සාධක ලෙස හඳුන්වා දෙන ලදි.[53] ලිංගික අල්ලස් සඳහා පිළියම් සෙවීමේදී 'බොහෝ වින්දිතයින් කාන්තාවන් වන බැවින්, ඔවුන්ට භයානක ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවනු අතර කිසිදු ප්‍රතිලාභයක් නොලබන' බව එම ප්‍රධාන තොරතුරු සපයන්නා සඳහන් කළේය.[54] බලගතු වෛද්‍ය වෘත්තිකයෙකුට එරෙහිව පැමිණිල්ලක් කිරීම සම්බන්ධයෙන් හඳුනාගැනීමට හෝ වෙන්කර දැක්වීමට වින්දිතයන් කැමති නොවන බව නිරීක්ෂණය විය.[55] සම්මුඛ පරීක්ෂණයට සහභාගි

[43] වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක්
[44] අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරී
[45] අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරී
[46] නීති වෘත්තික
[47] අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරී
[48] අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
[49] නීති වෘත්තික
[50] වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක්
[51] වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක්
[52] විශේෂඥ මනෝවෛද්‍ය
[53] මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පවුල් සෞඛ්‍ය නිලධාරී
[54] විශේෂඥ මනෝවෛද්‍ය

වූ තවත් අයෙක් සඳහන් කළේ, 'වින්දිතයන් ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ කතා කිරීමට උත්සාහ කිරීම නිසා ස්ථාන මාරුවීම් හෝ රැකියාවෙන් පහත හෙළීමට ලක්වන බවයි.'[56] එම පුද්ගලයාම සඳහන් කළේ වින්දිතයින්ට 'නිවාඩු, අතිකාල සහ උසස්වීම් අහිමි කිරීමට, වාර්තා කිරීම සම්බන්ධයෙන් කොන් කිරීමට හා ප්‍රසිද්ධ සෞඛ්‍ය සේවා වෘත්තිකයෙකුගේ කීර්ති නාමයට කැළලක් ඇති කිරීමට උත්සාහ කරන බවට අසත්‍ය ලෙස චෝදනා චීල්ල කිරීමට මුහුණ දීමට සිදුවන බව නිරීක්ෂණය කරයි.'[57]

තවත් ප්‍රධාන තොරතුරු සපයන්නෙක් සඳහන් කළේ අභ්‍යන්තර පරීක්ෂණ හරහා අපරාධකරුවන් වගකිව යුතු බවට පත් කිරීම නිෂ්ඵල විය හැක්කේ එවැනි පරීක්ෂණ දියත් කිරීමට අපහසු බැවින් සහ 'ඒවා නිමා කිරීමට බොහෝ කාලයක් ගතවන' බැවිනි.[58] අධිකරණ අංශයේ තොරතුරු සපයන්නෙකු සඳහන් කළේ අපගේ නීතිය ක්‍රියාත්මක කරන නඩු කටයුතු මෙහෙයවන නිලධාරීන් සතුව 'වින්දිතයන්' විශේෂයෙන් ලිංගික අපරාධල වින්දිතයන් පිළිබඳ සහකම්පනයේ හා සංවේදනයේ විශාල අඩුවක් පවතින බවයි.[59] සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය දුර්වල බවත් වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් සපයා නොමැති බවත් තවත් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ තවත් අයෙක් පෙන්වා දෙන ලදි.[60] මෙම පුද්ගලයාම සඳහන් කළේ 'ලිංගික අල්ලස්වලට එරෙහි නීති යටතේ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය ආරක්ෂා කළ යුතු බවයි.'[61] තවත් සම්මුඛ සාකච්ඡාවකින් පෙන්වා දුන්නේ පැමිණිලි පෙට්ටියක් සහ ස්වාධීන පරිපාලන විමර්ශන ක්‍රියාවලියක් කඩිනමින් අවශ්‍ය වන බවයි.[62] සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ තවත් අයෙක් විසින් පිළියමක් ලෙස ඵලදායී නීති ආධාර සැපයීම යෝජනා කරන ලදී. එම පුද්ගලයාම තෙවන පාර්ශවයක් විසින් රෝහල් විගණනය කිරීමට ද යෝජනා කරන ලදි.[63]
ප්‍රධාන තොරතුරු සපයන්නෙකු පෙන්වා දුන්නේ ලිංගික අල්ලස් ලබා ගැනීමේ වරදක් සම්බන්ධයෙන් එක් සාර්ථක නඩු පැවරීමකින් වින්දිතයින් පැමිණිලි කිරීමට දිරිමත් කළ හැකි බවයි. මෙම ප්‍රධාන තොරතුරු සපයන්නාට අනුව සාර්ථක නඩු පැවරීමක් යනු, වින්දිතයාගේ ගෞරවය ආරක්ෂා කරන අතරම වින්දිතයාට ප්‍රමාණවත් වන්දියක් ලබා දෙන එකක් ද විය යුතුය.[64] එපමණක් නොව, ඕනෑම නීති ප්‍රතිසංස්කරණයක් හෝ ප්‍රතිපත්තියක් මූලික යථාර්ථයන් සැලකිල්ලට ගත යුතු බව එම සම්මුඛ පරීක්ෂකවරයා සඳහන් කළේය. නිදසුනක් වශයෙන්, වින්දිතයින් බොහෝ විට වැරදිකරු සමඟ සමීපව සම්බන්ධ වී සිටින අතර සේවාවක්, අනුමැතියක්, නිර්දේශයක් ලබා දීම සඳහා වැරදිකරු මත යැපෙන්නන් විය හැකිය.[65] සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ මෙම පුද්ගලයා යෝජනා කළේ වින්දිතයන් ආරක්ෂා කිරීමේ අධිකාරියේ ශාඛාවන් රට පුරා ස්ථාපිත කළ යුතු බවත් ලිංගික අල්ලස් වින්දිතයන්ට සහය වීම සඳහා ළඟා විය හැකි විය යුතුය.[66] ලිංගික අල්ලස්වලට එරෙහිව අන් අය ආරක්ෂා කරන රාජ්‍ය සේවක ජාලයක් ස්ථාපිත කළ යුතු බව ඇය වැඩිදුරටත් යෝජනා කළාය.[67]

ලිංගික අල්ලස් සඳහා පිළියම් සෙවීමට කැමති වින්දිතයින් හට පැහැදිලි සාක්ෂි නොමැතිකම පොදු බාධාවක් බව කාන්තා නීති වෘත්තිකයෙක් සඳහන් කළාය.

> “
> **...මෙවැනි නුසුදුසු ඉල්ලීමක් හෝ ඉදිරිපත් වීමක් සිදු කළ බවට ඔප්පු කිරීමට මෙම ලිංගික අපරාධවල වින්දිතයන් බොහෝ දෙනෙකුට සාක්ෂි (පින්තූර හෝ පටිගත කිරීම්) නොමැත. එවිට ඔවුන්ට නීතිමය**

[55] වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක්
[56] විශ්‍රාමික හෙදියක් සහ වෘත්තිකයෙක්
[57] විශ්‍රාමික හෙදියක් සහ වෘත්තිකයෙක්
[58] පශ්චාත් උපාධි අභ්‍යාසලාභී වෛද්‍ය
[59] නීති වෘත්තිකයෙක්
[60] වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක්
[61] පශ්චාත් උපාධි අභ්‍යාසලාභී වෛද්‍ය
[62] වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක්
[63] විශ්‍රාමික හෙදියක් සහ වෘත්තිකයෙක්
[64] අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරියෙක්
[65] මහජන සෞඛ්‍ය පවුල් සෞඛ්‍ය සේවිකාව
[66] අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරියෙක්
[67] අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරියෙක්

**කටයුතු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම අතිශය දුෂ්කර වේ.[68] ”**

**අධිකරණ අංශය, කාන්තා නීති වෘත්තික, බස්නාහිර පළාත**

ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් ආමන්ත්‍රණය කිරීම සඳහා යෝජනා කිහිපයක් ප්‍රධාන තොරතුරු සපයන්නන් විසින් ඉදිරිපත් කරන ලදී. යෝජිත කෙටුම්පතකට අනුව අල්ලස් පනත සංශෝධනය කිරීම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ වැඩි වැඩියෙන් දෙමළ භාෂාවෙන් වැඩ කිරීමට පුහුණු කිරීම, අධ්‍යාපනය සහ අල්ලස් සහ ලිංගික අල්ලස් පිළිබඳ මොඩියුලයක් ඇතුළත් කිරීම එම යෝජනාවලට ඇතුළත් විය.[69] තවත් ප්‍රධාන තොරතුරු සපයන්නෙක් සඳහන් කළේ පොලිසිය සඳහා වන පුහුණු අත්පොත්වල ලිංගික අල්ලස් පිළිබඳ තොරතුරු ඇතුළත් නොවන බවයි.[70]



[68] නීති වෘත්තිකයා
[69] අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරී
[70] පොලිස් පරීක්ෂක



## 6. රාජ්‍ය වගකීමක් වශයෙන් ලිංගික අල්ලස් ගැනීම වැළැක්වීම

ලිංගික අල්ලස් වින්දිතයන්ගේ, අධිකරණ හා පොලිස් අංශවල ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ අත්දැකීම් සහ අදහස් තුලින්, මෙම කොටස රාජ්‍ය වගකීමේ දෘෂ්ටිකෝණයෙන් ලිංගික අල්ලස් විශ්ලේෂණය කරයි. මේ වගකීම ත්‍රිමාණ වේ. පළමුව, ලිංගික අල්ලස් යනු දූෂණයේ බරපතල හා විනාශකාරී ආකාරයකි. එය ප්‍රජාතන්ත්‍රවාදයට, නීතියේ ආධිපත්‍යයට සහ ව්‍යවස්ථාපිත පාලනයට බලපාන දැඩි හා ව්‍යුහාත්මක ගැටළු පෙන්නුම් කරයි. දෙවනුව, ලිංගික අල්ලස් යනු වින්දිතයෙකුගේ මානව හිමිකම් කිහිපයක් උල්ලංඝනය කිරීමකි. මේ සම්බන්ධයෙන්, රාජ්‍යයට තම මානව හිමිකම් බැඳීම්වලට ගරු කිරීමට, ආරක්ෂා කිරීමට සහ ඉටු කිරීමට බැඳීමක් තිබේ. එපමණක් නොව, මානව හිමිකම් උල්ලංඝණය වීම වැලැක්වීමේ වගකීම ද එයට ඇත. ලිංගික අල්ලස් සිදුවීම රාජ්‍යයක් මෙම වගකීම් ඉටු කිරීමට අසමත් වීම පෙන්නුම් කරන ලක්ෂණයකි. මෙම සියලු අවස්ථාවන්හිදී, වින්දිතයන් ඔවුන්ගේ මානව ගරුත්වය, සමානාත්මතාවයට ඇති අයිතිය සහ වෙනස් කොට සැලකීමෙන් තොර වීමේ අයිතිය උල්ලංඝනය කිරීමක් අත්විඳිති. තෙවනුව සහ ඊට අදාළව, ලිංගික අල්ලස් යනු පුද්ගලයෙකුට එරෙහි සාපරාධී වරදකි. එය වින්දිතයන්ට බරපතල ශාරීරික හා මානසික හානියක් සිදු කරයි. එය සිදුවීම සමාජ දේහයට බරපතල ලෙස බලපායි. වින්දිතයින් හට යුක්තිය සහතික කිරීම සඳහා වගවීම, දඬුවම්, පුනරුත්ථාපනය සහ වන්දි අවශ්‍ය වේ.

### 6.1. ලිංගික අල්ලස්, මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස

සෞඛ්‍ය හෝ අධිකරණ ක්ෂේත්‍රවල රැකියා සන්දර්භය තුළ ලිංගික අල්ලස් සිදු වන විට, එය සේවකයාගේ වැඩ කිරීමේ අයිතියට, විශේෂයෙන්ම, 'පුද්ගලයාට මූලික දේශපාලන හා ආර්ථික නිදහස ආරක්ෂා කරන කොන්දේසි යටතේ පූර්ණ හා ඵලදායී රැකියා' සහ 'ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා කොන්දේසි සඳහා ඇති අයිතියට අහිතකර ලෙස බලපායි.[71] වින්දිතයා කම්පනයට සහ අපකීර්තියට පත්වන අතර එය වින්දිතයාගේ ස්වයං අවබෝධය සහ රැකියාව පිළිබඳ අත්දැකීම් කෙරෙහි බලපායි.

සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ලිංගික අල්ලස් සිදුවන විට, එය වින්දිතයන්ගේ හෝ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සෞඛ්‍ය සඳහා ඇති අයිතියට සෘජු බලපෑමක් ඇති කරයි.[72] වින්දිතයින් ලිංගික අල්ලස් අපරාධකරු මගහැරීම සඳහා තමන්ට හෝ අන් අයට ඇති සෞඛ්‍ය රැකවරණය මගහැර ඇති ආකාරය විස්තර කර ඇත. වෙනත් අවස්ථාවල දී, ඔවුන්ගේ සෞඛ්‍ය අයිතිය භුක්ති විඳීමට උත්සාහ කිරීමේදී ඔවුන් ලිංගික අල්ලස් අවදානමට ලක් වේ. ලිංගික අල්ලස් වින්දිතයන් බොහෝ දෙනා තම මානසික සෞඛ්‍යයට දැඩි ඍණාත්මක බලපෑමක් එල්ල වී ඇති බව වාර්තා කරයි.

මෙම වාර්තාවේ සාකච්ඡා කරන ලද ලිංගික අල්ලස් පිළිබඳ බොහෝ සිදුවීම් වලදී, වින්දිතයින් ඔවුන්ගේ පෞද්ගලිකත්වය අහිමි වීම අත්දැක ඇත. මෙයට තම ජංගම දුරකථනවලට ලැබුණු අනවශ්‍ය සන්නිවේදනයන් ද ඇතුළත් වේ. ඔවුන්ගේ දත්ත රහස්‍යතාව උල්ලංඝනය වීම හා අවදානමට ලක් වීම සිදුවී ඇත. එබැවින් ඔවුන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය උල්ලංඝණය වී ඇත.[73]

### 6.2. ලිංගික අල්ලස් අපරාධයක් ලෙස

අධිකරණ ක්ෂේත්‍රයේ ලිංගික අල්ලස් සිදුවන විට එය යුක්තිය සහ අපරාධ යුක්තිය පසිඳලීමට බාධාවක් ලෙස ක්‍රියා කරයි. මෙය වින්දිතයාට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ඉතා දරුණු ප්‍රතිවිපාක ඇත. තවත් අවස්ථාවලදී, විශේෂයෙන්ම LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් විසින් වාර්තා කරන ලද පරිදි, යුක්තිය සඳහා ප්‍රවේශ වීමට අධිකරණ අංශය බාධකයක් බවට පත්වේ. ශ්‍රී ලංකාවේ ලිංගික සුළුතරයන් සඳහා නිශ්චිත අයිතිවාසිකම්, ආරක්ෂාවක් නොමැතිකම හේතුවෙන් අධිකරණ ක්ෂේත්‍රයේ ඇතැම් පිරිස් තම අභිමතය අයුතු ලෙස භාවිත කරන ආකාරය ඔවුන් ලිංගික අල්ලස් ගැනීමේ අවදානමකට ලක් කරයි.

ලිංගික අල්ලස් වින්දිතයන් මෙන්ම සෞඛ්‍ය සහ අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රධාන තොරතුරු සපයන්නන් විසින් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතියේ ගැටලු

[71] ICESCR Art 6(2), Art 7(ii)(b)
[72] ICESCR, Art 12
[73] ICCPR, " Art 17 සහ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ 16 වන පොදු අදහස.

හේතුවෙන් වින්දිතයන් ලිංගික අල්ලස් වාර්තා නොකරන බවට වාර්තා කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන් අත්විඳින මානව හිමිකම් කඩවීම් කිහිපයක් සඳහා නියමිත ක්‍රියාවලියක් සඳහා ඇති අයිතිය මෙන්ම පිළියමක් සඳහා ඇති අයිතිය ද ඔවුන්ට අහිමි වේ.


ශ්‍රී ලංකා රාජ්‍යය ලිංගික අල්ලස් නිශ්චිතව අපරාධයක් බවට පත් කිරීමට අපොහොසත් වී ඇත. තවද, රාජ්‍ය අංශය විසින් ලිංගික අල්ලස් වැළැක්වීම සහ ඒවාට පිළියම් යෙදීම සඳහා නිශ්චිත ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබීම ද රාජ්‍යයට අවශ්‍ය වී නැත. මෙය ලිංගික අල්ලස් අවදානමට ලක්ව සිටින අයගේ මානව හිමිකම්වලට ගරු නොකිරීමක් වේ. රාජ්‍යය නිසි සැලකිල්ලෙන් ක්‍රියා කරමින් ලිංගික අල්ලස් වැළැක්වීම සඳහා සාධාරණ ක්‍රියාමාර්ග ගත යුතු අතර ඵලදායි විමර්ශනයක්, නඩු පැවරීමක්, දඬුවම් සහ වරදට පිළියමක් සැපයිය යුතුය.

## 6.3. ලිංගික අල්ලස්, දූෂණයක් ලෙස

අල්ලස සහ දූෂණය ප්‍රජාතන්ත්‍රවාදයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පාලනයට පටහැනිය. මහජන බලය ක්‍රියාත්මක වන්නේ විශ්වාසය මත හා ජනතාව වෙනුවෙනි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කර ඇත්තේ පරමාධිපත්‍ය ජනතාව තුළ පවතින බවත්, මෙම පරමාධිපත්‍යය අහිමි කළ නොහැකි බවත්ය. රාජ්‍යය විසින් බලය අයුතු ලෙස භාවිත කිරීම ඇතුළු ඕනෑම අත්තනෝමතික ක්‍රියාවක් සමානාත්මතාවයට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් බව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය නිරන්තරයෙන් ප්‍රකාශ කර ඇත.

මෙම අධ්‍යයනය සඳහා පරීක්ෂා කරන ලද ලිංගික අල්ලස් සිදුවීම්, බලය අනිසි ලෙස භාවිත කිරීමේ විශේෂ ආකාරයකි. රාජ්‍ය නියෝජිතයන් නීතියෙන් තමන්ට පැවරී ඇති අධිකාරිය සහ අභිමතය අනිසි ලෙස භාවිත කරමින්, නීතියෙන් තමන්ට සැපයීමට බැඳී සිටින සේවාවන් සැපයීම සඳහා ලිංගික අනුග්‍රහය ඉල්ලා සිටියි. මෙහි විශ්ලේෂණය කරන ලද සිද්ධි අධ්‍යයනයන් හෙළි කරන්නේ අපරාධකරුවන් දඬුවම් නොලබා සිටින බවත්, වින්දිතයන් හට ඔවුන්ට ඇති වූ කම්පනය සහ අපකීර්තිය සමඟ ජීවිතය ගෙන යාමට සිදුවන බවත්ය. ඔවුන්ට ඵලදායී නීතිමය පිළියම් නොමැත. එබැවින් ලිංගික අල්ලස් යනු මුල් බැසගත් දූෂණයේ සාක්ෂියකි. එය රාජ්‍යයේ මූලික කාර්යය - එහි අද්විතීය අධිකාරිය සහ බලය තම ජනතාවට සේවය කිරීම සඳහා භාවිත කිරීම, ඉටු කිරීමට අසමත් වූ බවට වන සාක්ෂියකි. ලිංගික අල්ලස් ප්‍රජාතන්ත්‍රවාදය ද අසාර්ථක බවට වන ඉඟියකි. මහජන නියෝජිතයන් නීතියේ සීමාව තුළ තම රාජකාරිය ඉටු කිරීමට අපොහොසත් වෙනවා පමණක් නොව ඡන්දයෙන් සහ නීතියෙන් තමන්ට ලැබෙන අධිකාරිය සක්‍රීයව අවභාවිත කරයි.






# 7. නිගමනය

ස්වයංව-හඳුනාගත් ලිංගික අල්ලස් වින්දිතයන්ගේ අත්දැකීම්වල ගුණාත්මක පරීක්ෂණයක් හරහා, මෙම අධ්‍යයනය ලිංගික අල්ලස් සිදුවීම තහවුරු කරන අතර එහි බරපතලකම විස්තර කරයි. සෞඛ්‍ය හා අධිකරණ ක්ෂේත්‍රවල ලිංගික අල්ලස් වාර්තා වී ඇති අතර අපරාධකරුවන් රාජ්‍ය නියෝජිතයන් වේ. ලිංගික අල්ලස්වලට වින්දිතයන්ගේ අත්දැකීම්වලින් හෙළි වන්නේ එහි බලපෑම් දැඩි කම්පන සහගත හා අපකීර්තිය ඇති කරනසුළු වන අතර ආර්ථික හා සමාජීය ප්‍රතිවිපාක ඇතුළු අනෙකුත් ඍණාත්මක ප්‍රතිවිපාක ඇති කරන බවයි. ලිංගික අල්ලස් බලපෑම වින්දිතයින් හට පමණක් නොව, ඔවුන් හරහා ඔවුන්ගේ සමීපතම පවුල්වලටද බලපෑම් ඇති කරයි. වින්දිත කාන්තාවන්ගේ අත්දැකීම් බරපතල වන අතර මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ පරීක්ෂණයට ලක් වූ LGBTQI ප්‍රජාවේ සාමාජිකයින් සම්බන්ධයෙන් එම බරපතලකම තවදුරටත් සංකීර්ණ වේ. ලිංගික ශ්‍රමිකයින් යනු ලිංගික අල්ලස්වලට දැඩි ලෙස ගොදුරු විය හැකි තවත් පුද්ගල කාණ්ඩයකි. LGBTQI ප්‍රජාවේ සාමාජිකයන් ලිංගික රැකියාවල නිරත වන විට, ඔවුන්ගේ අවදානම වඩාත් දරුණු වේ.

ලිංගික අල්ලසට මාන තුනක් ඇත: දූෂණයේ මානය, මානව හිමිකම් මානය සහ අපරාධ යුක්ති මානය. ලිංගික අල්ලස් මගින් පුද්ගලයාට සහ සමස්තයක් වශයෙන් සමාජයට වන බලපෑම සැලකිල්ලට ගත් විට, ලිංගික අල්ලස මානව ගරුත්වයට පුළුල් ලෙස බලපාන බව පෙනේ. ලිංගික අල්ලස් සිදුවීම ශාරීරික පුද්ගලිකභාවය, සමානාත්මතාවය, පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය සහ පිළියමක් සඳහා ඇති අයිතිය ඇතුළු මානව හිමිකම් රැසක් උල්ලංඝනය කරයි. මෙම අධ්‍යයනයට සහභාගි වූ කිසිවකු හට තමන්ට සිදු වූ හානියට පැමිණිල්ලක් ඉදිරිපත් කර නීති පද්ධතිය හරහා පිළියම් සෙවීමට හැකි බවට විශ්වාසයක් තිබුණේ නැත. නීතිය සහ නීතියට සම්බන්ධ ආයතන කෙරෙහි විශ්වාසයක් නොමැතිකම අඛණ්ඩව කැපී පෙනේ. ඇත්ත වශයෙන්ම, ලිංගික අල්ලස් ඉල්ලා සිටින්නේ රාජ්‍යයේ නියෝජිතයන්, එනම් නීතියට සහ ප්‍රතිපත්තිවලට බලය දීමට අපේක්ෂා කරන පිරිස් - සහ සියලු පුද්ගලයන්ට නීතියේ සමාන ආරක්ෂාව සහතික කිරීමට අපේක්ෂා කරන රාජ්‍ය නියෝජිතයන් විසිනි. ලිංගික අල්ලස් පිළිබඳ යථාර්ථය නීතිය, ආයතන සහ එහි පිරිස් හරහා ලිංගික අල්ලස් සඳහා විසඳුම් සෙවීමට බාධාවක් ලෙස ක්‍රියා කරයි. එබැවින් ලිංගික අල්ලස් සම්බන්ධයෙන් අපරාධ වගවීම සහතික කිරීම ඉතා අපහසුය. ලිංගික අල්ලස් සිදුවන සෑම අවස්ථාවකම එය නීතිය හා සම්බන්ධ වේ. එබැවින් ලිංගික අල්ලස් ගැනීම් ඵලදායි ලෙස වැළැක්වීමට හෝ ඊට පිළියම් යෙදීමට නීතියට හැකිවේද යන්න පිළිබඳව වින්දිතයන් පවා සැක පහළ කරති. ඇත්ත වශයෙන්ම, නීති පද්ධතිය සහ එහි සංස්කෘතිය දණ්ඩන මුක්තිය ප්‍රවර්ධනය කරන බවත් නීතියේ වැරදිකරුවන් ආරක්ෂා කරන බවත් ඔවුන් පෙන්වා දී ඇත. එබැවින් ලිංගික අල්ලස් දූෂණය ලෙස වටහාගෙන, රාජ්‍ය නියෝජිතයන් විසින් අභිමතය පරිදි අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම හේතුවෙන් ලිංගික අල්ලස් සිදුවන ආකාරය පෙන්වා දෙයි. ලිංගික අල්ලස් වගවීම සහ පාලනය පිළිබඳ අර්බුදයක් පෙන්නුම් කරයි.





# 8. නිර්දේශ

මෙම අධ්‍යයනයේ සියලුම සහභාගිවන්නන්ගේ සිත්වල නිශ්චිත නිර්දේශයන් තිබුණි. මෙම යෝජනාවලින් උකහා ගනිමින්, ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් ඵලදායී ලෙස වැළැක්වීම, විමර්ශනය කිරීම, ඒවාට එරෙහිව නඩු පැවරීම සහ දඬුවම් කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග මෙම කොටස යෝජනා කරයි. ඇතැම් නිර්දේශ අධ්‍යයනයට සහභාගිවන්නන්ගෙන් සෘජුවම ලබා ගන ඇත. එම නිර්දේශ රාජ්‍ය, සිවිල් සමාජය, ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය ආයතන සහ සංවිධාන සඳහා විශේෂිත වේ. තේරී පත් වූ ආයතන, පරිපාලන ආයතන සහ පොලිසිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව වැනි ස්වාධීන ආයතන සඳහා වන නිර්දේශ අනුව රාජ්‍යයට කරන නිර්දේශ තවදුරටත් නිශ්චිතව දක්වා ඇත.

## 8.1. වැළැක්වීම

### රාජ්‍යය සඳහා නිර්දේශ

**තේරී පත් වූ ආයතන**

8.1.1 ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ හරහා ලිංගික අල්ලස් පැහැදිලිවම තහනම් කිරීම සහ අපරාධයක් බවට පත් කිරීම.

8.1.2 සහමතිය දක්වන වැඩිහිටියන් අතර 'ස්වභාවධර්මයේ අනුපිළිවෙලට එරෙහිව ස්වේච්ඡා කාමුක සංසර්ගය' අපරාධයක් බවට පත් කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 වගන්තිය අවලංගු කිරීම.

8.1.3 1841 පාදඩ ආඥාපනත අවලංගු කිරීම.

8.1.4. පොදු ස්ථාන සහ පොදු සේවාවන් සඳහා ප්‍රවේශය ඇතුළු සියලුම ක්ෂේත්‍රවල ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයන්ගේ සමාන අයිතිවාසිකම් පැහැදිලිව පිළිගැනීම.

8.1.5 උපදේශන ක්‍රියාවලියකින් පසු වාණිජ ලිංගික කටයුතු නීතිගත කිරීම සහ නියාමනය කිරීම සඳහා නීති සම්පාදනය කිරීම.

8.1.6. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට දේශීය නෛතික බලපැවැත්වීම ලබාදීම සඳහා නීති සම්පාදනය කිරීම අනුමත කිරීම.

8.1.7. ලිංගික අල්ලස් වැළැක්වීම, විමර්ශනය කිරීම සහ ඒවාට එරෙහිව නඩු පැවරීම සහ ඒවාට පිළියම් යෙදීම සඳහා ජාතික මට්ටමින් නිශ්චිත ප්‍රතිපත්ති අනුගමනය කිරීම. එවැනි ප්‍රතිපත්තියක් සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගන්නා සහ සහභාගීත්ව ක්‍රියාවලියක් හරහා වර්ධනය කළ යුතුය. විශේෂයෙන්ම, ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමේදී ලිංගික අල්ලස්වලට ලක්වීමේ අවදානමක් ඇති LGBTQI ප්‍රජාවේ කාන්තාවන් සහ සාමාජිකයින්ගේ අදහස් විමසිය යුතුය. ජාතික ප්‍රතිපත්තිය වරින් වර සමාලෝචනයට යටත් විය යුතුය.

**පරිපාලන ආයතන**

8.1.8 ලිංගික අල්ලස් සම්බන්ධයෙන් ශුන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක් ඇතුළත් කිරීමට ආයතන සංග්‍රහය සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.

8.1.9 ලිංගික අල්ලස් තහනම් කිරීම ඇතුළුව රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් පිළිබඳ අනිවාර්ය සහ කලින් කල සිදුවන පුහුණුවක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

8.1.10. රාජ්‍ය නිලධාරීන් සහ පොලිසිය වැනි අනාගතයේ දී අපරාධකරුවන් වීමේ සම්භාවිතාවක් ඇති පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ස්වාධීන රාජ්‍ය ආයතන**

8.1.11. ස්වාධීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් නැවත හඳුන්වාදීම හරහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහතික කිරීම.

8.1.12. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ලිංගික අල්ලස් සිදුවීමට හේතු සොයා බැලීම සඳහා අධ්‍යයන පැවැත්වීම. මෙම අධ්‍යයනයන් සියලු පාර්ශවකරුවන්ගේ ආදානයන් සහිතව උපදේශනාත්මක විය යුතුය.

8.1.13. එවැනි අධ්‍යයනයන්හි සොයාගැනීම් ප්‍රසිද්ධියේ බෙදා ගැනීම.

8.1.14. ලිංගික අල්ලස් සහ එහි බරපතලකම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

ජාතික මට්ටමේ සිට ප්‍රජා මට්ටම දක්වා සෑම තරාතිරමකම දැනුවත් කිරීම සිදු විය යුතුය.

එවැනි වැඩසටහන් හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ ලිංගික සුළුතරයන් වෙත ළඟා වන බවට සහතික වීම.

දැනුවත් කිරීම සඳහා රංග කලාව සහ කලාව යොදාගැනීම.

දැනුවත් කිරීම සඳහා ෆෙස්බුක් (Facebook) වැනි සමාජ මාධ්‍ය භාවිතා කිරීම.

රාජ්‍ය සේවකයින් හරහා සහ සමෘද්ධිලාභීන් සඳහා වන රැස්වීම් වැනි ප්‍රජා මට්ටමේ රැස්වීම්වලදී ප්‍රජා මට්ටමේ දැනුවත්භාවය ඇති කිරීම.

8.1.15. රාජ්‍ය සේවකයන් අතර මෙන්ම මහජනතාව අතර ලිංගික අල්ලස් සම්බන්ධ අපකීර්තිය පිළිබඳ ආකල්පමය වෙනසක් සඳහා ක්‍රියාශීලීව කටයුතු කිරීම.

8.1.16. තමන්ගේ ඇතැම් සගයන් ලිංගික අල්ලස් සිදුවීම් වලට සම්බන්ධ වීම පිළිබඳව දැනුවත් කිරීමට පොලිස් නිලධාරීන් පුහුණු කිරීම. එවැනි පුහුණුවක් පොලිස් නිලධාරීන් විසින් ලිංගික අල්ලස් සිදුවීම වැළැක්වීම සහ ලිංගික අල්ලස් සඳහා ශූන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම අරමුණු කර ගත යුතුය.

8.1.17. විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපන මට්ටමින් පාර්ශ්වකරුවන් සහ මහජනතාව පුහුණු කිරීම අරමුණු කරගත් ගැලපෙන පරිදි සාදන ලද පාඨමාලාවක් ඉදිරිපත් කිරීම. එවැනි අධ්‍යයන වැඩසටහනක් සැලසුම් කළ යුත්තේ ලිංගික අල්ලස් ගැනීම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙසත්, අපරාධමය වරදක් ලෙස මෙන්ම දූෂණයේ ප්‍රකාශනයක් ලෙසත් ආමන්ත්‍රණය කිරීමටයි.

**සිවිල් සමාජය සඳහා නිර්දේශ**

8.1.18. ලිංගික අල්ලස් වැළැක්වීම සඳහා රාජ්‍ය වගකීම ඉටු කිරීම සමාලෝචනය කිරීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යයනයන්, තක්සේරු කිරීම් සිදු කිරීම

8.1.19. වත්මන් නීති තන්ත්‍රයේ සඵලතාවය සහ ලිංගික අල්ලස් වැළැක්වීමේ පිළියම් නිරීක්ෂණය කිරීම

8.1.20. ලිංගික අල්ලස් සිදුවීම සහ එහි බලපෑමේ බරපතලකම පිළිබඳව සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීව මහජනතාව දැනුවත් කළ යුතුය.

8.1.21. ලිංගික අල්ලස් වැළැක්වීමට සහ ඒවාට පිළියම් සෙවීමට සාමූහික ක්‍රියාමාර්ග ගැනීමට වින්දිතයින් හට සහාය වීම.

8.1.22. ලිංගික අල්ලස් වින්දිතයන් හට ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව ප්‍රසිද්ධියේ කතා කිරීමට අවශ්‍යවන දැනුවත්භාවය සහ බල ගැන්වීම ලබාදීම. මෙය දැනුවත්භාවය ඇති කරන අතරම ලිංගික අල්ලස් වින්දිතයන් පිළිබඳ සමාජයේ ගොඩනැගී ඇති අපකීර්තිමත්භාවය අවම කිරීමට හේතු වනු ඇත. එවැනි මහජන සහභාගීත්වයක් යුක්තිය සෙවීම සඳහා ඔවුන් දිරිමත් කරනු ඇත.

**පුද්ගලික අංශය, වෘත්තීය ආයතන සඳහා වන නිර්දේශ**

8.1.23. ලිංගික අල්ලස් පැහැදිලිවම තහනම් කිරීමට සහ ශක්තිමත් සහ සාධාරණ පැමිණිලි යාන්ත්‍රණයක් සැපයීම සඳහා වෘත්තීය චර්යාධර්ම සංග්‍රහ සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම.

8.1.24. ලිංගික අල්ලස් සිදුවීම නිරීක්ෂණය කිරීම සඳහා සිවිල් සමාජය දරන උත්සාහයන්ට සහාය වීම.

8.1.25. ලිංගික අල්ලස් පැහැදිලිවම අපරාධයක් බවට පත් කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කිරීමට දරන ප්‍රයත්නයන්ට සහාය සහ අනුග්‍රහය දැක්වීම.

8.1.26. ලිංගික අල්ලස් සිදුවීම් වලට තම සගයන් සහ අධිකරණ ක්ෂේත්‍රයේ ඇතැම් පුද්ගලයින් සම්බන්ධ වීම පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම සඳහා නීතිඥයින් පුහුණු කිරීම. එවැනි පුහුණුවක් මගින් නීතිඥයින්ට අල්ලස් පනත, පොදු නීති ප්‍රතිකර්ම (මූලික අයිතිවාසිකම් සහ රිට්) සහ පුද්ගලික නීති ප්‍රතිකර්ම වැනි ලිංගික අල්ලස් වින්දිතයන් සඳහා නීතිමය ප්‍රතිකර්ම සෙවීමට සහ සලකා බැලීමට නීතිඥයින් සන්නද්ධ කළ යුතුය.

**ජාත්‍යන්තර ආයතන සඳහා නිර්දේශ**

8.1.27. ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනය සඳහා සන්දර්භ විශේෂිත ප්‍රවේශයක් (අවස්ථාවට අනුව) අනුගමනය කිරීම හෝ අඛණ්ඩ භාවිතය.

8.1.28. ලිංගික අල්ලස් එහි සිදුවීම් සහ ප්‍රතිකර්ම වල සඵලතාවය ඇතුළුව දීර්ඝ කාලීනව අධ්‍යයනය කිරීමට ඉඩ සැලසෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම.

8.1.29. විවිධ මට්ටම්වල සේවය කරන විවිධ ක්‍රියාකාරීන් සමඟ සහයෝගයෙන් ලිංගික අල්ලස් පිළිබඳ දැනුවත් කිරීම් හෝ පර්යේෂණ සිදු කරන බවට සහතික වීම. වින්දිතයින්ගේ සහ ඔවුන්ගේ නියෝජිතායතනයේ සජීවී අත්දැකීම්වලට ගරු කළ යුතු අතර එවැනි වැඩ වලදී ප්‍රවර්ධනය කළ යුතුය.

**ජාත්‍යන්තර සංවිධාන**

8.1.30. වින්දිතයින්ගෙන් උපදෙස් ලබා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ලිංගික අල්ලස් සිදුවීම, වැළැක්වීම සහ ඒවාට පිළියම් යෙදීම පිළිබඳ දැනුම වර්ධනය කිරීමේදී සියලුම පාර්ශ්වකරුවන්ගෙන් උපදෙස් ලබා ගැනීම.

8.1.31. ලිංගික අල්ලස් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දේශීය හිමිකාරිත්වය ඇතුළුව දේශීය සන්දර්භයන්ට ගැළපෙන පරිදි සකස් කරගත හැකි ගෝලීය සම්මතයන්, මූලධර්ම සහ ප්‍රමිතීන් වර්ධනය කිරීම.

## 8.2. විමර්ශනය සහ නඩු පැවරීම

## රාජ්‍යය සඳහා නිර්දේශ තෝරි පත් වූ ආයතන

8.2.1. ලිංගික අල්ලස් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට හෝ විභාග කිරීමට කොමිෂන් සභා දෙකට බලය පැවරීම සඳහා මෙම නීතිමය පාලන තන්ත්‍රයන් සංශෝධනය කළ යුතුද යන්න හඳුනා ගැනීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභා පනත සහ මානව හිමිකම් කොමිෂන් සභා පනත සමාලෝචනය කිරීම.

8.2.2. 2015 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම.

8.2.3. අපරාධ සහ අපරාධ පිළිබඳ පැමිණිලි ප්‍රසිද්ධියේ වාර්තා කිරීමේදී, වින්දිතයන්ගේ ආරක්ෂාව සඳහා විශේෂයෙන් කටයුතු කිරීම සඳහා වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම.

8.2.4. වින්දිතයන් වෙනුවෙන් අතරමැදියන් හට පැමිණිලි කළ හැකි වන පරිදි ලිංගික අල්ලස් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමේ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.

**පරිපාලන ආයතන**

8.2.5 ලිංගික අල්ලස් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ස්වාධීන සහ ඵලදායී පැමිණිලි යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම

**ස්වාධීන රාජ්‍ය ආයතන**

8.2.6. පැමිණිලි කිරීමට රහස්‍ය දුරකථන අංකයක් ස්ථාපිත කිරීම.

8.2.7. ලිංගික අල්ලස් අපරාධකරුවන් හඳුනා ගැනීම සඳහා රහසිගත අපරාධ පරීක්ෂකයන් යෙදවීම.

8.2.8 ලිංගික අල්ලස් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාදාමයන් කැමරාගත කළ යුතුයි.

**සිවිල් සමාජය සඳහා නිර්දේශ**

8.2.9 ලිංගික අල්ලස් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට කාන්තාවන් සාමූහික ක්‍රියාමාර්ග ගත යුතුය.

8.2.10. ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සුළුතරයන් සාමාන්‍යයෙන් වෙනස් කොට සැලකීම් අත්විඳින බැවින්, ඔවුන්ට ලිංගික අල්ලස් සඳහා පිළියම් සෙවීමට සහ අනාගතයේදී එය සිදුවීම වැළැක්වීමට සාමූහිකව සංවිධානය වී බලමුලු ගැන්විය හැකිය.

**පුද්ගලික අංශය, වෘත්තීය ආයතන සඳහා නිර්දේශ**

8.2.11. ලිංගික අල්ලස් සම්බන්ධයෙන් ශුන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සහ එය වෘත්තීය විෂමාචාරයක් බවට පත්කිරීම

8.2.12. ආයතනික මට්ටමින් ලිංගික අල්ලස් පිළිබඳ පැමිණිලි විමසීමේදී විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම.

8.2.13. පැමිණිලිකරුවන්ට ප්‍රතිවිපාක ඇතිවීම වැළැක්වීමට සහ වෘත්තීය සන්දර්භයන් තුළ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා පියවර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

## ජාත්‍යන්තර ආයතන සඳහා නිර්දේශ

**ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන**

8.2.14. ලිංගික අල්ලස් වින්දිතයින් සඳහා සහයෝගීතා ජාලයන් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම

8.2.15. සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ වින්දිතයින් විසින් ලිංගික අල්ලස් සඳහා වගවීම සෙවීමේදී අන්තර් ජාතික ඉගෙනීම සහ අත්දැකීම් බෙදාගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**ජාත්‍යන්තර රාජ්‍ය සංවිධාන**

8.2.16. ලිංගික අල්ලස් විමර්ශනය කිරීම සහ ඒවාට ඒරෙහිව නඩු පැවරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ඇතුළු රාජ්‍ය ක්‍රියාමාර්ග අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම.

8.2.17. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමෙහි ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම. ලිංගික අල්ලස් ඵලදායි විමර්ශනය සහ නඩු පැවරීම සඳහා සහාය (මූල්‍ය, පුහුණුව ආදිය) ලබා දීම

# 8.3. පිළියම

## රාජ්‍යය සඳහා නිර්දේශ
## තේරී පත් වූ ආයතන

8.3.1. ලිංගික අල්ලස් සඳහා වන දඬුවම්වලට විශාල දඩයක් ඇතුළත් වන බව සහතික කිරීම සඳහා අල්ලස් පනත ප්‍රතිසංස්කරණය කිරීම.

8.3.2. ලිංගික අල්ලස් සිදුවීම්හි බරපතලකමට සමානුපාතික කාල පරිච්ඡේදයක් සඳහා නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අධිකරණයකදී ලිංගික අල්ලස් ගැනීමේ වරදට වරදකරු වූ රාජ්‍ය සේවයේ අපරාධකරුවන්ට රැකියා තහනමක් ක්‍රියාත්මක කිරීම.

8.3.3. වින්දිතයාට ඵලදායී වන්දි ලබා දීම.

**පරිපාලන ආයතන**

8.3.4. වින්දිතයින් සඳහා ඵලදායී මුදල් වන්දි ලබා දීම.

**ස්වාධීන ආයතන**

8.3.5. පොලිස් නිලධාරීන් සඳහා උපදේශන ලබා දීම. ලිංගික අල්ලස් සම්බන්ධයෙන් විමර්ශන සහ නඩු පැවරීමේ ප්‍රතිඵල පිළිබඳ දේශීය දත්ත පවත්වාගෙන යාම.

**සිවිල් සමාජය සඳහා නිර්දේශ**

8.3.6. වින්දිතයින් අතර ඒකමුතුකමේ සහ සහයෝග යේ ජාලයක් ගොඩනැගීම

**පුද්ගලික අංශය, වෘත්තීය ආයතන සඳහා නිර්දේශ**

8.3.7. ලිංගික අල්ලස් වින්දිතයින් හට උපකාර කිරීම සඳහා වන අරමුදල් සඳහා දායක වීම.

8.3.8 ලිංගික අල්ලස් වින්දිතයින් සඳහා ඵලදායී පිළියම් සහතික කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කිරීම.

## ජාත්‍යන්තර ආයතන සඳහා නිර්දේශ

**ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන**

8.3.9 ලිංගික අල්ලස් සිදුවීම්, එහි විමර්ශනය, ඒවාට එරෙහිව නඩු පැවරීම සහ පිළියම් යෙදීම පිළිබඳ ගෝලීය පරිමාණයෙන් දත්ත පවත්වාගෙන යාම.

8.3.10. ලිංගික අල්ලස් සඳහා පවතින පිළියම්වල බලපෑම අධ්‍යයනය කිරීම සඳහා වින්දිතයන් සහ අපරාධකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම.

**ජාත්‍යන්තර සංවිධාන**

8.3.11. ලිංගික අල්ලස් වින්දිතයින් සඳහා පිළියම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

8.3.12. වින්දිතයින් සඳහා පිළියම් ලබා දීම සහ අපරාධකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා මාර්ගෝපදේශ සහ නිර්දේශ සකස් කිරීම



# ඇමුණුම

## ඇමුණුම / අධ්‍යනය සඳහා යොදාගත් ප්‍රශ්නාවලිය

## අර්ධ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා මාර්ගෝපදේශය

### අ) සාමාන්‍ය සටහන්

- මෙම සම්මුඛ සාකච්ඡාවේ අරමුණ වන්නේ සෞඛ්‍ය සහ යුක්තිය යන අංශ සමඟ අන්තර් ක්‍රියා කිරීමේදී ලිංගික අල්ලස් ඉල්ලීම් අත්විඳ ඇති සංක්‍රාන්තික ලිංගික හා සමරිසි ප්‍රජාවට අයත් කාන්තාවන්ගේ සහ පුද්ගලයන්ගේ අත්දැකීම් පිළිබඳව දැන ගැනීමයි.
- ඔබේ කාර්යභාරය වන්නේ සම්මුඛ පරීක්ෂණයට ලක්වන්නාගේ අත්දැකීම් සහ සංජානනයන් සහ සම්මුඛ පරීක්ෂණයට ලක්වන්නාට එම සංජානනයන් ඇත්තේ මන්දැයි හැකිතාක් නිවැරදිව වාර්තා කිරීමයි.
- පවසන දෙය පර්යේෂණයේ අවශ්‍යතාවලට සෘජුවම අදාළ නොවන බව පෙනෙන විට පවා සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නාට නිදහසේ කතා කිරීමට ඉඩ දෙන්න.
- විෂය කරුණු සංවේදී බැවින් සෘජු ප්‍රශ්න ඇසීමට පෙර සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නාට සුවපහසු තත්වයක් ඇති වන තෙක් රැඳී සිටින්න.
- සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නා සැහැල්ලුවෙන් සිටින බව ඔබට හැඟුණු පසුව පමණක් ලිංගික අල්ලස් සම්බන්ධයෙන් ඔවුන්ගේ අත්දැකීම් ගැන ප්‍රශ්න අසන්න.
- සම්මුඛ පරීක්ෂණය අතරතුර කිසියම් අවස්ථාවක, සම්මුඛ පරීක්ෂණය නතර කිරීමට සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නා තීරණය කරන්නේ නම්, හෝ ඔහුගේ/ඇයගේ අත්දැකීම් සම්බන්ධ කිරීමේදී යම් අපහසුතාවයක්/කම්පනයක් අත්විඳින්නේ නම්, ඔහුට/ඇයට සම්මුඛ පරීක්ෂණය දිගටම කරගෙන යාමට බල නොකරන්න.
- මෙම මාර්ගෝපදේශයෙන් ඉවත් වී සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නන් පවසන ඕනෑම දෙයක් ගැන පසු විපරම් ප්‍රශ්න ඇසීමට ඔබට නිදහස ඇත.
- සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නා විසින් තවදුරටත් අවධාරණය කර පැහැදිලි කිරීමට අවශ්‍ය සාකච්ඡාවට අදාළ යමක් සඳහන් කරන්නේ නම් කරුණාකර විමර්ශනය කර වැඩිදුර අවබෝධය ලබා ගන්න.
- සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ඔබේම සටහන් තබාගැනීමට සහ නිරීක්ෂණය කිරීමට කාලය ලබා ගන්න. ඔබ ඔබේම සංජානනයන් (අදහස්) විස්තර කරන සෑම සම්මුඛ පරීක්ෂණයක් සඳහාම කරුණාකර විශේෂ සටහනක් ඇතුළත් කරන්න.

### ආ) සම්මුඛ පරීක්ෂණය ආරම්භ කිරීම

- ඔබ හා සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) හඳුන්වා දීමෙන් පසු සම්මුඛ පරීක්ෂණය ආරම්භ කරන්න.
- ඔබ ගැන හැඳින්වීමකින් හෝ ස්ථානයට අනන්‍ය දෙයක් වැනි සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නා ද දන්නා ඔබටත් පොදු උනන්දුවක් ඇති යමක් කතා කරමින් සම්මුඛ සාකච්ඡාව ආරම්භ කරන්න.

### ඇ) දැනුවත් කැමැත්ත

- සම්මුඛ පරීක්ෂණයේ අරමුණ, සම්මුඛ පරීක්ෂණය අතරතුර ආවරණය වන පොදු ක්ෂේත්‍ර සහ සහභාගිවන්නන්ගේ අයිතිවාසිකම් (ප්‍රශ්න ඇසීමට, සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීමට සහ ඕනෑම අවස්ථාවක ඉවත් වීමට ඇති හැකියාව ) පැහැදිලි කරන්න. සහභාගිවන්නන්ගේ රහස්‍යභාවය සහ නිර්නාමිකභාවය සහතික කළ යුතුය.
- දැනුවත් ලිඛිත අවසරයක් ලබාගෙන අවශ්‍ය නම් පසු විපරම් සංවාදයක් පවත්වන්න. ඔබ මීළඟ අදියරට යාමට පෙර සහභාගිවන්නාට ඔබ සමඟ සැහැල්ලුවෙන් සිටීමට කාලය දෙන්න.

### ඈ) හරයාත්මක අංශ

- මෙම කොටසේදී, ඔබ සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නාගේ කතාව පැවසීමට දිරිගැන්වීමක් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නාගේ සාමාන්‍ය ජීවන අත්දැකීම, ඔහුගේ/ඇයගේ පවුල, පුද්ගලයා හැදී වැඩුණු ස්ථානය යනාදිය ගැන ඔබට ප්‍රශ්න ඇසීමට

හැකිය. එවිට ඔබට සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නා දැන ගැනීමට සහ සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නාට ඔබ සමඟ කතා කිරීමට පහසු වනු ඇත.

- ප්‍රශ්නවලට පහත සඳහන් දෑ ඇතුළත් කළ හැකිය - ඔබට ඔබ ගැන යමක් පැවසිය හැකිද? කවුරුහරි ඔබෙන් ඔබව හඳුන්වා දෙන්න යැයි ඇසුවොත්, ඔබ පවසන්නේ කුමක්ද?
- පහත (අනිවාර්යය) ප්‍රශ්න මතු කිරීම සඳහා සංවාදය යොමු කරන්න:

**1. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නාගේ තොරතුරු**

1. නම
2. දුරකථන අංකය (කැමැත්ත සහ ප්‍රතිපෝෂණයන් ලබා ගැනීමට පමණක් භාවිතා කළ හැකිය.)
3. වයස
4. ස්ථිර පදිංචි ස්ථානය (දිස්ත්‍රික්කය ගම/ග්‍රාම නිලධාරි)

**2. ලිංගික අල්ලස් ගැනීම සම්බන්ධ සිදුවීම**

සම්මුඛ පරීක්ෂණයේ වැදගත්ම අංගය මෙයයි. ඔබ ලිංගික අල්ලස් සම්බන්ධ සිද්ධියේ සියලුම අංග ආවරණය කරන බව සහතික කර ගැනීමට කරුණාකර පහත ආකෘතිය අනුගමනය කරන්න. කරුණාකර සිද්ධිය පිළිබඳ පහත විස්තර තහවුරු කර ගනිමින් පැහැදිලි කර ගන්න.

2.1 ලිංගික අල්ලස් (ප්‍රකට/රහස් විය හැකි) ඉල්ලා සිටිනු ලැබුවේ කුමන තත්වයක් යටතේද?

- සිද්ධිය සිදු වූ අංශය හෝ රාජ්‍ය ආයතනය
- අදාළ නිලධාරීන් තනතුරු (දන්නා නම්) යනාදිය
- දිනය
- කාලය (සිද්ධිය දින සහ මාස ගණනක් විය හැකි බැවින් එහි කාලසීමාව දක්වන්න)
- ස්ථානය

2.2 එක් සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් සිදු වූවාද යන්න

ඔබ පසුගිය කාලය තුළ ලිංගික අල්ලස් සම්බන්ධ ක්‍රියාවන්ට කොපමණ කාලයක් පුරා මුහුණ දී තිබේද? නැත්නම් වර්තමානයේදී?

2.3 ඔවුන් ඉල්ලා සිටියේ කුමන ආකාරයේ ලිංගික අල්ලස්ද? (විස්තර කරන්න)

උදා: අනිවාර්යය රාජ්‍ය සේවයක්/සහයෝගයක් සඳහා වූ ඉල්ලීමකට අනුව පහත සඳහන් හැසිරීම්

- තනිකඩ කාන්තාවකගේ නිවසට රාත්‍රියේදී බීමත්ව පැමිණ ලිංගික අනුග්‍රහය ඉල්ලා සිටීම
- ලිංගික හිරිහැර සහ නුසුදුසු හැසිරීම
- තමන් සමඟ අනියම් සම්බන්ධයක් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටීම
- වැන්දඹුවකට සවස් වරුවේ, කාර්යාලයෙන් පිටතදී තනියම අපරාධකරු හමුවීමට/ඔහු සමඟ ගමනක් යාමට පැමිණෙන ලෙස ඉල්ලා සිටීම
- යෝජිත අදහස්වලට සහ ලිංගික උපහාසයට මෙන්ම සමීප, විමසා බලන ප්‍රශ්න ඇසීම
- ලිංගික අල්ලසක් ප්‍රතික්ෂේප කළ විට හෝ මග හරින විට වාචික තර්ජන සහ ප්‍රමාද උපක්‍රම

2.4 මෙම සිද්ධියට අදාළව ඔබ හඳුනාගත් ප්‍රතිවිපාක මොනවාද?

තීරණාත්මක සිදුවීම් වලට පෙර සහ පසු අදාළ සිදුවීම්. උදා.. ඉවත් වීමට සිදු වීම, ඇති වූ අපකීර්තිය, පළිග ැනීම්වලට ඇති බිය, මිනිසුන් දැන හඳුනා ගැනීම, ළමයින් පීඩාවට පත් වූ ආකාරය යනාදිය.

2.5 ඔබෙන් ලිංගික අනුග්‍රහය ඉල්ලා සිටි පුද්ගලයා වෙනත් කාන්තාවන්ගෙන් ද එයම ඉල්ලා සිටියේ දැයි ඔබ දන්නවාද? එසේ නම් කරුණාකර විස්තර කරන්න.

**මානසික සෞඛ්‍යය, අපකීර්තිය සහ සහය පද්ධති**

2.6 අපයෝජනය/ප්‍රචණ්ඩත්වය සිදු වූ විට සහ ඉන් පසුව ඔබේ මානසික/චිත්තවේගීය තත්ත්වය කුමක්ද?

2.7 ඔබ මානසිකව/චිත්තවේගීයව පීඩාවට පත්වුණි නම් ඔබ උපකාර පැතුවේ/කාගෙන්ද?

2.8 ඔබ ලිංගික අල්ලස් ලබා දෙන විට/බලහත්කාරයෙන් ලබා ගන්නා විට ඔබට හැඟුණේ කෙසේද/ඔබේ මානසික තත්ත්වය කුමක්ද? සිද්ධිය වූ වහාම ඔබේ ප්‍රතිචාරය කුමක්ද?

2.9 සිද්ධිය හේතුවෙන් ඔබට යම් අපකීර්තියක් අත්විඳ තිබේද? කුමන ආකාරයේ අපකීර්තියක්ද (අභ්‍යන්තර/බාහිර)? ස්වයං, සමාජ අපකීර්තිය?

උදා: ප්‍රජාව තුළ ගෞරවය හා ගෞරවය නැති වී යාම සහ වැරදි කරුවෙකු ලෙස සලකනු ලැබීමට ඇති බිය.වින්දිතයින්- දිවි ගලවා ගත් අයගේ තමන් පිළිබඳ සංජානනය (වටිනාකමක හැඟීම) සහ ඔවුන්ගේ අභිලාෂය සිද්ධියෙන් පසුව ඍණාත්මක ලෙස බලපෑම

2.10 ඔබ එයට මුහුණ දුන්නේ කෙසේද? (පුදගලයාට මුහුණ දීමට හැකි වුනා නම්)

2.11 ඔබ කිසියම් වෛද්‍ය ආධාරයක් ලබා ගත්තේද? එසේ නම්, කොහෙන්ද? කෙසේද? (රෝහල, පෞද්ගලික වෛද්‍යවරයා, ෆාමසිය, පවුලේ වෛද්‍යවරයා). මෙම සේවාව ලබා ගන්නා අවස්ථාවේදී ඔබට කිසියම් අභියෝගයක් තිබුණාද?

2.12 මෙම කාලය තුළ ඔබට සහාය වූ ව්‍යුහයන්/පුද්ගලයින් මොනවාද/කවුද? (මිතුරන්, ඥාතීන් , ග්‍රාම නිලධාරී , උපදේශකයින්, උපදේශන සහකාරවරුන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් .)

2.13 මෙම සිදුවීමෙන් ඔබ පීඩාවට පත් වූ විට, ඔබට උපදේශනය අවශ්‍යද? එසේ නම්, ඔබ එය අපේක්ෂා කළේ කුමන ව්‍යුහයෙන්/ යාන්ත්‍රණයෙන්ද?

### 3. කැමැත්තෙන් තොරව සිදු වූ ලිංගික ක්‍රියා

3.1 ලිංගික ක්‍රියාවක් ගැන ඔබේ අවබෝධය කුමක්ද?

3.2 කැමැත්ත පිළිබඳ ඔබේ අවබෝධය කුමක්ද? එවැනි ලිංගික ක්‍රියාවන්ට කැමැත්ත දීමට/නොදීමට ඔබට අයිතියක් ඇතැයි ඔබ සිතනවාද?

### 4. පිළියම්

4.1 මෙම නිශ්චිත අවස්ථාවේදී ඔබ කිසිවකුට පැමිණිල්ලක් කළේද?

4.2 ඔව් නම් කාටද සහ කවදාද? සිද්ධිය/සිදුවීම් සිදුවී කොපමණ කලකට පසුවද ඔබ පැමිණිල්ල ඉදිරිපත් කළේ?

4.3 කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද? නැත්ද? එසේ නම් ගත් ක්‍රියාමාර්ගය කුමක්ද? එසේ නොමැති නම්, කිසිදු පියවරක් නොගත්තේ ඇයි යැයි ඔබ සිතන්නේද?

4.4 ඔබ පැමිණිලි කළේ නැද්ද? එසේ නොවේ නම්, හේතුව කුමක්ද?

4.5 ඉහත සඳහන් කළ කරුණු සම්බන්ධයෙන් රජය විසින් සපයනු ලබන වෙනත් සේවාවක් ඔබ අපේක්ෂා කළේද? එසේ නම්, සේවාව කුමක්ද?

4.6 පැමිණිල්ලක් කිරීමට භාෂාව බාධාවක්ද? ඔබට පහසු භාෂාවෙන් පැමිණිල්ල ඉදිරිපත් කිරීමට ඔබට හැකි වුවාද?

4.7 මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඔබ පොලිස් ස්ථානයට / රෝහලට යන විට භාෂාව බාධාවක් වුණා ද?

### 5. නීති

5.1 අල්ලස හා දූෂණය තහනම් කිරීමේ නීතිය පිළිබඳ ඔබේ අවබෝධය කුමක්ද?

5.2 ලිංගික අල්ලස් නීතියෙන් තහනම් කළ යුතු යැයි ඔබ සිතනවාද?

5.3 ඔබ අත්දුටු දේ නීතියෙන් තහනම්ද සහ ඒ මන්දැයි ඔබ දන්නවාද?

- මුහුණ දුන් අත්දැකීම /උල්ලංඝනය ශ්‍රී ලංකාවේ කිසියම් නීතියක් උල්ලංඝනය කර ඇතැයි සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නා සිතන්නේද? එසේ නම්, උල්ලංඝනය කර ඇති නීති/රීති මොනවාද?
- එසේ නොවේ නම් ලිංගික සූරාකෑම / අල්ලස් ගැනීම නැවැත්වීමට අප හඳුන්වා දිය යුතු/ ක්‍රියාත්මක කළ යුතු නීති මොනවාද?
- ඔබට අත්දැකීමට සිදුවූ ලිංගික අල්ලස්/සූරාකෑම, ශ්‍රී ලංකාවේ අල්ලස් පනතට වැටිය යුතු යැයි ඔබ සිතනවාද?
- ඔබේ මතය අනුව, ප්‍රතිපත්ති මට්ටමින් රාජ්‍යය කළ යුත්තේ කුමක්ද?
- කුමන ආකාරයේ යාන්ත්‍රණයක්/ව්‍යුහයක් සැකසිය යුතුද? නැතහොත් එය දැනටමත් පවතින බව ඔබ සිතනවාද?

**6. ක්‍රියාව**

6.1 ලිංගික අල්ලස් අවසන් කිරීමට අපට කුමක් කළ හැකිද?

6.2 අල්ලස් කොමිසම, මානව හිමිකම් කොමිසම වැනි අදාළ බලධාරීන් සමඟ ඔබට සිදු වූ දේ පිළිබඳ පසු විපරම් කිරීමට ඔබ කැමතිද? උදාහරණයක් ලෙස දිවුරුම් ප්‍රකාශයක් ලබා දීමෙන්, මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන්?

6.3 එවැනි මාර්ගයක් අකාර්යක්ෂම යැයි ඔබ සිතන්නේ නම්, වඩා ඵලදායී විය හැකි වෙනත් ක්‍රම මොනවාද?

6.4 ලිංගික සූරාකෑම / ලිංගික අල්ලස් ගැන මිනිසුන්ගේ ආකල්ප වෙනස් කළ හැක්කේ කෙසේදැයි ඔබ සිතන්නේ කෙසේද?

6.5 මෙම පර්යේෂණයේ සොයාගැනීම් (වින්දිතයින්ගේ විස්තර හෙළි නොකර) ප්‍රජාවේ අනෙකුත් කාන්තාවන් සමඟ බෙදාගැනීම අවශ්‍ය හෝ වැදගත් යැයි ඔබ සිතනවාද?

6.6 එසේ නම්, මෙම සොයාගැනීම් සහ පණිවිඩය ප්‍රජාව තුළ සිටින කාන්තාවන් වෙත ගෙන යාමට හොඳම ක්‍රමය කුමක්ද? උදාහරණයක් ලෙස, නාට්‍ය, චිත්‍රපට, සාකච්ඡාව, පවර් පොයින්ට් (Power point) ඉදිරිපත් කිරීම, සංසද රඟහල, ප්‍රජා රැස්වීම්, අවමංගල්‍ය කමිටු රැස්වීම්, කාන්තා ජාල රැස්වීම් ආදිය හරහා?

**7. වසංගතය**

වසංගතය දායක සාධකයක් ලෙස හෝ සිද්ධිය සංකීර්ණ කරන සාධකයක් ලෙස හෝ වෙනත් අදාළ ආකාරයකින් යම් බලපෑමක් ඇති කළේද?

**8. සම්මුඛ පරීක්ෂණය අවසාන කිරීම**

සියලුම වැදගත් කරුණු ආවරණයකිරීමෙන් අනතුරුව , සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නාගෙ න් ප්‍රතිපෝෂණය ලබා ගැනීමට සහ ඕනෑම ප්‍රශ්නයක් පැහැදිලි කිරීමට වග බලා ගන්න.

- සම්මුඛ පරීක්ෂණය ගැන ඔබට සිතුණේ කුමක්ද?
- ඔබට කිසියම් ප්‍රශ්න හෝ අදහස් තිබේද?
- ඔබට සිදු වූ මෙම අයිතිවාසිකම් උල්ලංඝනය/ වරද සම්බන්ධයෙන් අපට ඔබට උපකාර කළ හැකි කිසියම් ක්‍රමයක් තිබේද?
- යොමු ලේඛනයේ පිටපතක් සපයන්න.
- සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ඔබේම සටහන් සහ නිරීක්ෂණ පිළියෙල කරන්න. ඔබ ඔබේම සංජානනයන් විස්තර කරන සෑම සම්මුඛ පරීක්ෂණයක් සඳහාම කරුණාකර විශේෂ සටහනක් ඇතුළත් කරන්න.

**ඇමුණුම II :අධ්‍යයනය සඳහා ප්‍රවේශ වූ ආයතන ලැයිස්තුව)**

1. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC)

2. ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ ශ්‍රී ලංකා පොලිස් කාර්යාංශය

3. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

## ඇමුණුම III: සම්මුඛ සාකච්ඡා සහ කණ්ඩායම් සාකච්ඡා පිළිබඳ දළ විශ්ලේෂණය

| | මධ්‍යම | බටහිර | ඌව | දකුණ | සබරගමුව |
|---|---|---|---|---|---|
| වඩාත් ගැඹුරු සම්මුඛ සාකච්ඡා | 7 | 4 | | 5 | 3 |
| යොමුගත කණ්ඩායම් සාකච්ඡා | 1 | 1 | 1 | 1 | 1 |

**වඩාත් ගැඹුරු සම්මුඛ සාකච්ඡා**

| අංකය | අනවර්ථඩ | සාරාංශය | චෝදනා ලද අපරාධකරු | ලබාදුන් අනුග්‍රහය/ප්‍රේරක සිදුවීම |
|---|---|---|---|---|
| CS 01 මහනුවර, මධ්‍යම පළාත | රමණී | අවු: 40-50 වයසේ ග්‍රාමීය වැන්දඹු කාන්තාවක්, මවක් | පිරිමි නීතිඥයෙක් | විස්තෘත පවුල තුළ ඉඩම් ආරවුලක් හේතුවෙන් නීති උපදෙස් ලබා ගැනීම |
| CS 02 හැටන්, මධ්‍යම පළාත | සීතා | 40-50 වයසේ ග්‍රාමීය, කාන්තාවක්, මවක්, සැමියා රෝගාතුර ව සිටී | පිරිමි හෙදියක් | රෝහලේ ප්‍රතිකාර ලබන අතරතුර සැමියාට අමතර රැකවරණයක් |
| CS 03 මාතලේ, මධ්‍යම පළාත | ලලිතා | විවාහකයි, මවක්, ස්වාමිපුරුෂයා විදේශගතව සේවය කරන විට සිදුවීම සිදු විය | පිරිමි පොලිස් නිලධාරියෙක් | දියණිය නිවසට නොපැමිණීම සම්බන්ධයෙන් පොලිසියට කළ පැමිණිල්ලක් හේතුවෙන් |
| CS 04 මාතලේ, මධ්‍යම පළාත | රාණි | 20-30, කාන්තාවක්, ගෘහනියක් | පිරිමි රෝහල් උපස්ථායකයෙක් | මව සඳහා රෝහලේ සායනය සඳහා අංකයක් ලබා ගැනීම |
| CS 05 ගම්පොල, මධ්‍යම පළාත | මනෝරි | 20-30, කාන්තාවක්, ගෘහනියක් | පිරිමි පොලිස් නිලධාරියෙක් | රිමාන්ඩ් කළ සැමියාට ඇප ලබා ගැනීම |
| CS 06 මහනුවර, මධ්‍යම පළාත | මාලනී | 30-34, කාන්තාවක්, ගෘහනියක් | පිරිමි රෝහල් උපස්ථායකයෙක් | මව සඳහා රෝහලේ සායනය සඳහා අංකයක් ලබා ගැනීම |
| CS 07 මාතලේ, මධ්‍යම පළාත | ජීවා | 40-50, කාන්තාවක්, කුඩා තේ වත්තක හිමිකරුවන් | පිරිමි පොලිස් නිලධාරියෙක් | නැතිවූ හැඳුනුම්පත සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම |
| CS 08 සබරගමුව පළාත | ජයනි | කාන්තාවක් | පිරිමි නීතිඥයෙක් | ඇප ලබාගැනීමේ අවශ්‍යතාවය මතු වූ ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් නීතිමය නියෝජනයක් ඉල්ලා සිටීම |

| අංකය | අනවර්ථධ | සාරාංශය | චෝදනා ලද අපරාධකරු | ලබාදුන් අනුග්‍රහය/ප්‍රේරක සිදුවීම |
|---|---|---|---|---|
| CS 09<br>රත්නපුර,<br>සබරගමුව<br>පළාත | රූපා | 30-40, කාන්තාවක්, මවක් | පිරිමි නීතිඥයෙක් | ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් නීතිමය නියෝජනයක් ඉල්ලා සිටීම |
| CS 10<br>සබරගමුව<br>පළාත | ෆාරා | 50-40, කාන්තාවක්, මවක් | පිරිමි පොලිස් නිලධාරියෙක් | දික්කසාද නඩු කටයුතු වලදී නීතිය ක්‍රියාත්මක කිරීම |
| CS 11<br>හම්බන්තොට,<br>දකුණු පළාත | ලක්ෂ්මි | පාසල් සිසුවියක් | පිරිමි වෛද්‍යවරයෙක් | වෛද්‍ය උපදෙස් පැතීම |
| CS 12<br>හම්බන්තොට,<br>දකුණු පළාත | ගයනි | කාන්තාවක්, මවක් | පිරිමි බන්ධනාගාර නිලධාරියෙක් | රිමාන්ඩ් භාරයේ සිටින ස්වාමිපුරුෂයා බැලීමට යාමේ අයිතිය ඉල්ලීම |
| CS 13<br>මාතර,<br>දකුණු පළාත | ඉරෝමි | ශාරීරික ආබාධ සහිත කාන්තාවක් | සෞඛ්‍ය අංශයේ පිරිමි රාජ්‍ය නිලධාරියෙක් | මාරුවීම වළක්වාගැනීමට උත්සාහ දැරීම |
| CS 14<br>හම්බන්තොට,<br>දකුණු පළාත | ප්‍රියා | කාන්තාවක්, වෛද්‍ය ශිෂ්‍යාවක් | අධීක්ෂණ වෛද්‍යවරයෙක් | පුහුණුව අතරතුර නේවාසිකාග ාර පහසුකම් සඳහා නිර්දේශ ලබා ගැනීම |
| CS 15<br>ගාල්ල,<br>දකුණු පළාත | ජෙයා | කාන්තාවක්, සංක්‍රමණික ගෘහ සේවිකාවක් | පිරිමි පොලිස් නිලධාරියෙක් | සංක්‍රමණික රැකියාව සඳහා පිටත්ව යාමට පෙර පවුල් ප්‍රතිලාභ වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීම |
| CS 16<br>කොළඹ,<br>බස්නාහිර පළාත | නුස්රත් | සංක්‍රාන්තික ලිංගිකයෙක්, ලිංගික ශ්‍රමිකයෙක් | පිරිමි පොලිස් නිලධාරීන් | චෝදනා එල්ල කිරීමෙන් වැළකී සිටීමට, අත්අඩංගුවේ සිට නිදහස් කිරීමට |
| CS 17<br>ගම්පහ,<br>බස්නාහිර පළාත | ජෙනී | කාන්තාවක්, ලිංගික ශ්‍රමිකයෙක්, මවක් | පිරිමි පොලිස් නිලධාරීන් | ස්වාමිපුරුෂයා අත්අඩංගුවේ සිට නිදහස් කිරීමට |
| CS 18<br>කොළඹ,<br>බස්නාහිර පළාත | රීටා | සංක්‍රාන්තික ලිංගිකයෙක්, 20-30, ලිංගික ශ්‍රමිකයෙක් | පිරිමි රෝහල් සහායකයෙක් | නීති විරෝධී ලෙස අවසර පත්‍රයක් ලබාදීමට |
| CS 19<br>කොළඹ,<br>බස්නාහිර පළාත | වත්සලා | සංක්‍රාන්තික ලිංගිකයෙක් 20-30 | පිරිමි පොලිස් නිලධාරීන් | චෝදනා එල්ල කිරීමෙන් වැළකී සිටීමට, අත්අඩංගුවේ සිට නිදහස් කිරීමට |

**ප්‍රධාන තොරතුරු සපයන්නන්**

| | අංශය | තනතුර | ස්ත්‍රී පුරුෂ භාවය | මට්ටම |
|---|---|---|---|---|
| KII 01 | සෞඛ්‍යය | උපදේශක මනෝචිකිත්සක | පිරිමි | ජාතික |
| KII 02 | සෞඛ්‍යය | පශ්චාත් උපාධි සීමාවාසික වෛද්‍ය | පිරිමි | ජාතික |
| KII 03 | සෞඛ්‍යය | වෛද්‍යවරයෙක් සහ වෘත්තිකයෙක් | පිරිමි | ජාතික |
| KII 04 | සෞඛ්‍යය | පවුල් සෞඛ්‍ය සේවිකාව | ගැහැණු | කලාපීය |
| KII 05 | සෞඛ්‍යය | විශ්‍රාමික හෙදියක් සහ වෘත්තිකයෙක් | ගැහැණු | කලාපීය |
| KII 06 | සෞඛ්‍යය | පවුල් සෞඛ්‍ය සේවිකාව | ගැහැණු | කලාපීය |
| KII 07 | යුක්තිය | ප්‍රධාන පොලිස් පරීක්ෂක | ගැහැණු | ජාතික |
| KII 08 | යුක්තිය | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරියෙක් | ගැහැණු | ජාතික |
| KII 09 | යුක්තිය | නීති වෘත්තිකයෙක් | ගැහැණු | කලාපීය |
| KII 10 | යුක්තිය | අල්ලස් හෝ දූෂණ චෝදනවා විමර්ෂණ කොමිෂන් සභාවේ නිලධාරියෙක් | ගැහැණු | ජාතික |
| KII 11 | යුක්තිය | පොලිස් පරීක්ෂකයෙක් | ගැහැණු | කලාපීය |
| KII 12 | යුක්තිය | නීති වෘත්තිකයෙක් | ගැහැණු | කලාපීය |

**යොමුගත කණ්ඩායම් සාකච්ඡා**

| FGD | සහභාගිවන්නන් සංඛ්‍යාව | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව | ස්ථාන | රැකියා වර්ගය |
|---|---|---|---|---|
| 01 | 10 | ගැහැණු | දකුණු පළාත | N/A |
| 02 | 10 | ගැහැණු සහ සංක්‍රාන්තික ලිංගික | බස්නාහිර පළාත | ලිංගික ශ්‍රමිකයන් |
| 03 | 10 | ගැහැණු | සබරගමුව පළාත | N/A |
| 04 | 09 | ගැහැණු | මධ්‍යම පළාත | N/A |
| 05 | 10 | ගැහැණු | ඌව පළාත | N/A |

# යොමුව


- 'Quid pro quo: ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස පිළිබඳ අධ්‍යනයක්' Daily FT ( 2020 ජනවාරි 24) https://www.ft.lk/Opinion-and-Issues/Quid-pro-quo-A-study-of-sexual-bribery-in-Sri-Lanka/14-694260
- සෙක්ස්ටෝෂන්: නව නමක්, පැරණි අපරාධයක්' සිලෝන් ඉන්ඩිපෙන්ඩන්ට් 2020 ජනවාරි 4 (accessed at http://www.independent.lk/sextortion-a-new-name-an-age-old-crime/ )
- 'ලිංගික අල්ලස්: දූෂණයේ නිහඬ පැතිකඩක්' Daily FT 2020 සැප්තැම්බර් 3, accessed at https://www.ft.lk/Opinion-and-Issues/Sexual-bribery-The-silenced-side-of-corruption/14- 705482
- දූෂණය වැළැක්වීම සහ එරෙහිව කටයුත කිරීම පිළිබඳ අප්‍රිකානු සංගමයේ සම්මුතිය 2003
- ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් ආමන්ත්‍රණය කිරීම සඳහා නීතිය සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම (සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය වර්ෂය)
- වාර්ෂික කාර්ය සාධන වාර්තාව (CIABOC 2019)
- සෙක්ස්ටෝෂන් වටා ඇති නිශ්ශබ්දතාවය බිඳ දැමීම: බලය, ලිංගිකත්වය සහ දූෂණය අතර සම්බන්ධතා 8 (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2020)
- රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයේ රැකියා සංගණනය - 2016 (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2018)
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- දිනේෂා සමරරත්න අධිකරණමය ලබා ගැනීම් සහ මිදී යාමේ බලපෑම්: ශ්‍රී ලංකාවේ මහජන නීතිය තුළ ඉන්දියානු නීති විද්‍යාව 2(3) (2018) ඉන්දියානු නීති සමාලෝචනය 205
- ගෝලීය දූෂණ බරෝමීටරය (2019) ශ්‍රී ලංකාව: ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2019
- 1966 ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
- මනෝහාරි පැලකැටිය එදිරිව ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය SC/FR 76/2012, SC Minutes 28 2016 සැප්තැම්බර්.
- නම් කිරීම, ලජ්ජාවට පත් කිරීම, සහ ලිංගික කප්පම් ගැනීම අවසන් කිරීම: මෙවලම් කට්ටලය (ජාත්‍යන්තර කාන්තා විනිසුරුවරුන්ගේ සංගමය 2019)
- දණ්ඩ නීති සංග්‍රහය
- කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම පිළිබඳ විපක්ෂ නායක කොමිෂන් සභාවේ වාර්තාව (2014 දෙසැම්බර්) 48: http://gbvforum.lk/r-library/document/Report%20of%20the%20Leader.pdf වෙතින් ලබා ගත හැක.
- සෙක්ස්ටෝෂන්: දූෂණය සහ ලිංගික සූරාකෑමේ අපරාධයක් (ජාත්‍යන්තර නීතිඥ සංගමය 2019)
- ශ්‍රී ලංකාව එදිරිව අබ්දුල් රෂාක් කුතුබ්දීන්
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය - 2019 (ඇඩ්වොකාටා ඉන්ස්ටිටියුට් 2019)

- 2004 දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය
- අන්තර් ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය 2000
- 'දැනුම, ආකල්ප සහ සංජානන සමීක්ෂණ වාර්තාව: ලිංගිකත්වය පිළිබඳ ශ්‍රී ලංකා සමාජයේ අදහස් සහ ශ්‍රී ලංකාවේ බඨර්ඹ පුද්ගලයින්ගේ අත්දැකීම්' (සමාජ විද්‍යාඥයින්ගේ සංගමය 2021)
- 'LGBTQI+ ශ්‍රී ලාංකිකයන් අතහැරී ඇති නීති සහ ප්‍රතිපත්ති නැවත සිතා බැලීම' (ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෙස්ට්මිනිස්ටර් පදනම 2021)
- 'රාජ්‍ය සේවයේ දූෂණය පිළිබඳ කාන්තා අත්දැකීම්' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකාව, ජුනි 2014)
- 'යෝජිත ව්‍යවස්ථාදායක සංශෝධන සඳහා ප්‍රතිපත්ති යෝජනා', අත්පොත 4 (CIABOC 2019)

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**

16/1, මොරිස් පෙදෙස, කොළඹ 05, ශ්‍රී ලංකාව

දු.ක/ෆැක්ස්: +94 11 2055404

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

/CEJ.SL

/cej_srilanka

/CEJ_SriLanka

/@CEJSriLanka

ISBN 978-624-5847-19-8